විසල් නුවරඑළිය

සංවර්ධන සිරැලැස්ම

2019 - 2030

වෙළුම 1

නාගරික සංවර්ධන අධිකාරිය

නුවරඑළිය දිස්ත්‍රික් කාර්යාලය

විසල් නුවරඑළිය සංවර්ධන සැලැස්ම

වෙළුම - 1



නාගරික සංවර්ධන අධිකාරිය

2019-2030

ලේඛණ තොරතුරු

ග්‍රන්ථ නාමය	: විසල් නුවරඑළිය නගර සංවර්ධන සැලැස්ම
ප්‍රදේශ සීමාව	: නුවරඑළිය මහ නගර සභා සීමාවේ හා නුවරඑළිය ප්‍රදේශිය සභා සීමාවට අයත් බඹරකැලේ, බංගලාහත, බුලුඇල, හාවාඑළිය- නැගෙනහිර, හාවාඑළිය - උතුර, හාවාඑළිය- බටහිර, කලාපුර, කලුකැලේ, කැලේගාල, මාගස්තොට, මීපිලිමාන, මිහිදුපුර, නුවරඑළිය, නුවරඑළිය- මධ්‍යම, නුවරඑළිය බටහිර, රුවන්එළිය, සඳතැන්න, සීතාඑළිය, ශාන්තිපුර, ටොප්පාස්, වින්ඩිකෝනර් යන ග්‍රාම සේවා කොට්ඨාශ
සේවාදායකයන් / පරදු පාර්ශවයන්	: ප්‍රදේශයේ පදිංචි ජනතාව හා සියළුම රාජ්‍ය, පෞද්ගලික ආයතන, සමිති හා සමාගම්
ඉදිරිපත් කල දිනය	: 01/12/2018
වාර්තා වල තත්වය	: අවසන්

ලේඛන ඉදිරිපත් කිරීම් පිළිබඳ විස්තර

පිටපත් අංකය	විස්තරය	ඉදිරිපත් කල දිනය	නිකුත් කිරීම සඳහා අනුමැතිය
01	කෙටුම්පත්	21.11.2018	
	අවසන්	2019.08.01	

මෙම වාර්තාව, බලයලත් පාර්ශවයන් විසින් නිකුත් කරනු ලබන අතර වාර්තාවේ සඳහන් අරමුණු සඳහා පමණක් භාවිතා කල යුතුය. මෙම වාර්තාවේ සඳහන් කරුණු වෙනත් පාර්ශවයන් විසින් හෝ වෙනත් අරමුණක් වෙනුවෙන් භාවිතා කිරීම සම්පූර්ණයෙන්ම තහනම් වේ. මෙම වාර්තාවේ සඳහන් කරුණු වෙනත් පාර්ශවයක් විසින් හෝ වෙනත් අරමුණක් වෙනුවෙන් යොදා ගෙන උද්ගත වන ගැටලු සහගත තත්ත්වයන් සම්බන්ධයෙන් අධිකාරිය වග කියනු නොලැබේ. එමෙන්ම මෙම වාර්තාවේ සඳහන් දත්ත හෝ තොරතුරු වෙනත් පාර්ශවයක් වෙත ලබා ගැනීම හෝ වෙනත් අරමුණක සඳහා යොදා ගැනීම මඟින් ඇති වන බලපෑම් සම්බන්ධයෙන්ද අධිකාරිය වගකියනු නොලැබේ. මෙම වාර්තාව තුළ රහසිගත තොරතුරු ඇතුළත් වන අතර එය බුද්ධිමය දේපලක් වේ. බලයලත් පාර්ශවයේ අනුමැතියක් නොමැතිව වෙනත් පාර්ශවයක් වෙත ලබා දීම සපුරා තහනම් වන අතර සිංහල, දෙමළ හා ඉංග්‍රීමි යන භාෂා වලින් පරිවර්තනය කරන ලද මෙම සැලැස්මෙහි කිසියම් පරස්පරතාවයක් ඇති වූ විට සිංහල පරිවර්තනහි පවතින කරුණු බලාත්මක වේ.

ගරු අමාත්‍යතුමාගේ පණිවිඩය



1978 හි අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරී පනත යටතේ නාගරික සංවර්ධන අධිකාරිය පිහිටුවනු ලැබූ අතර පසුගිය වසර 40 පුරාවටම නාගරික සංවර්ධන අධිකාරිය නාගරික ප්‍රදේශවල සැලසුම් සහගත නාගරික සංවර්ධනයක් සඳහා දායකත්වය සපයනු ලබයි. මෙම මොහොත වන විට නාගරික සංවර්ධන අධිකාරිය තම ගමන් මගෙහි තවත් එක් සන්ධිස්ථානයක් පසුකරමින් පුළුල් සංවර්ධන සැලසුම් මධ්‍යම පළාතේ සෑම නාගරික සංවර්ධන ප්‍රදේශයක් සඳහාම සකස් කිරීම සඳහා කටයුතු කොට ඇත.

මෙම සංවර්ධන සැලැස්ම තුළින් නුවරඑළිය මහ නගර සභා සීමාව හා නුවරඑළිය ප්‍රාදේශිය සභා සීමාවෙන් කොටසක් සඳහා ඒකාබද්ධ හා තුලනාත්මක සංවර්ධනයක් ඇති කිරීමට අපේක්ෂා කරනු ලැබේ.

නුවරඑළිය නගරය පරිපාලනමය වශයෙන් නුවරඑළිය දිස්ත්‍රික්කයේ ප්‍රධානම නගරය වන අතර එය දිවයිනේ ප්‍රධාන සංචාරක ආකර්ෂණ ප්‍රදේශයක් බවට පත්ව ඇත. ඒහෙයින් නේවාසික හා සංචාරක විශාල ජන සංඛ්‍යාවකට සේවා සපයනු ලබයි. තව දුරටත් සලකා බැලීමේදි නුවරඑළිය ප්‍රදේශය පාරිසරික සංවේදිතාවය හා සුන්දරත්වයෙන් ඉහළ තැනක පිහිටි ප්‍රදේශයකි.

ඒ අනුව ප්‍රදේශය සතු මෙම නුවරඑළියටම අවේනික වූ පරිසර පද්ධතිය හා සංවේදිතාව ආරක්ෂා කර ගනිමින් පාරිසරික සංචාරක කර්මාන්තයටත් උඩරට එළවළු වගාව හා තේ වගාව ප්‍රමුඛ කරගත් සමතුලිත ආර්ථික වර්ධනයක් ලඟා කර ගැනීමටත් හැකිය.

අපගේ උත්සහය දිවයිනේ ඉහළ උන්නතාංශයකින් පිහිටි ඉතා සංවේදි පරිසර පද්ධතිය ආරක්ෂා කර ගනිමින් සියළු පරදු පාර්ශවයන්ට විදිය හැකි ප්‍රදේශයක් බවට පත් කිරීමයි.

මාගේ අවබොධය අනුව සංවර්ධන සැලැස්ම සකස් කිරීම සඳහා වෘත්තීයවේදීන්, විශේෂඥයන්, පාර්ශවකරුවන් හා ප්‍රජාවගේ පුළුල් උපදේශනය සමඟින් නවීන ක්‍රමෝපායන් යොදා ගනිමින් විශිෂ්ඨ තාක්ෂණික ක්‍රමවේදයන් හා නවෝත්පාදිත ප්‍රවේශයන්ද ලැබී ඇත. ඒ අනුව, සභාපතිතුමා, අධ්‍යක්ෂ ජනරාල්, සැලසුම් කණ්ඩායම හා නොයෙක් ආකාරයේ මෙම කාර්ය සාර්ථක කර ගැනීමට උපකාර කල නාගරික සංවර්ධන අධිකාරියේ සියලුම නිලධාරීන්ගේ සේවය මම අගය කරමි. තවදුරටත් අදාල පළාත් පාලන ආයතන, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන හා සාමාන්‍ය ජනතාවගේ සහයෝගය හා දායකත්වය එක සමාන අයුරින් මෙම කාර්ය උදෙසා යෙදවීම තුලින් විසල් නුවරඑළිය සංවර්ධන සැලැස්ම සාර්ථකව ක්‍රියාත්මක කර ගැනීමට මග සැලසෙනු ඇත.

පාඨලී චම්පික රණවක

මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යා

ගරු සභාපතිතුමාගේ පණිවිඩය



වර්තමානය වන විට නාගරික සංවර්ධන අධිකාරිය ශ්‍රී ලංකාවේ නාගරික සැලසුම් සකස් කිරීමට හා එම සැලසුම් ක්‍රියාත්මක කිරීමට ඇති ප්‍රධානතම ආයතනය වන අතර නාගරික පරිසරය ගුණාත්මක ලෙස කළමණාකරනය කිරීමේ වගකීමද එසේම පැවරී ඇත. 1978 වර්ෂයේදී මෙම ආයතනය ස්ථාපිත කිරීමේ පරමාර්ථය වී ඇත්තේ ඒකාබද්ධ සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම තුලින් නාගරික ප්‍රදේශවල හා එහි ජනතාවගේ පොදු යහපැවැත්ම ප්‍රවර්ධනය හා නියාමනය කිරීමයි.

1982 අංක 4 දරණ නාගරික සංවර්ධන අධිකාරි සංශෝධිත පනතෙහි (II කොටස 8 වන වගන්තිය 8 අ [I]) අනුව අමාත්‍යවරයා විසින් නාගරික සංවර්ධන ප්‍රදේශයන් ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශයන්හි සංවර්ධන සැලසුම් සකස් කිරීම අත්‍යාවශ්‍ය කරුණක්ව ඇත. විසල් නුවරඑළිය ප්‍රදේශය සඳහා සකස් කරනු ලැබූ සංවර්ධන සැලැස්ම සකස් කිරීම හා බලාත්මක කිරීම, එම විධිවිධාන යටතේ සිදු කර ඇත. නුවරඑළිය ප්‍රදේශය නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස නාගරික සංවර්ධන අධිකාරිය නුවරඑළිය නගරය හා ඒ අවට ප්‍රදේශයන්හි භෞතික, ආර්ථික, සාමාජීය හා පාරිසරික කරුණු සැලකිල්ලට ගෙන විසල් නුවරඑළිය සංවර්ධන සැලැස්ම අවසන් කර ඇත.

මෙම සැලැස්ම ක්‍රියාත්මක කිරීමේදී, අපගේ ගමන් මාර්ගය සුමට නොවන අතර, අභියෝග පිරුණු, අවිනිශ්චිතයන්ගෙන් සැදි විෂම බලාපොරොත්තුවලින් අපවිත්‍ර වූ කටුක ගමන් මාර්ගයක් බව අප අමතක කර නොමැත. නාගරික සංවර්ධන අධිකාරිය වර්තමානයේ අවශ්‍ය පද්ධති, මෙවලම්, හා ක්‍රමෝපායන් තුලින් සන්නද්ධව අභියෝගයන් සඳහා මුහුණ දීමටත්, අවිනිශ්චිතභාවයට ඔරොත්තු දීම තුලින් සමබර පාරිසරික හා ආර්ථික සංවර්ධනයක් ලඟා කර ගැනීමටත් නුවරඑළිය නගරය ඇතුළු ප්‍රදේශය “මිහිදුම් කඳුකරයේ පාරාදීසය” බවට පත් කිරීමට අධිෂ්ඨාන කොට ගෙන සිටියි.

මෙම පුළුල් කාර්ය සාර්ථකව ඉටු කර ගැනීම සඳහා කැපවීමෙන් හා වෙහෙස මහන්සි වී වැඩකටයුතු කරන නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායම හා නන් අයුරින් සහයෝගය දැක්වූ සැමට මාගේ හෘදයාංගම කෘතවේදීත්වය පිරිනැමීම සඳහා මෙය අවස්ථාවක් කර ගන්නා අතර මෙම සැලසුම ක්‍රියාත්මක කිරීම සඳහා මේ හා සමාන සහයෝගය ඉදිරියටත් බලාපොරොත්තු වෙමි.

ආචාර්ය ජගත් මුණසිංහ

සභාපති , නාගරික සංවර්ධන අධිකාරිය

නුවරඑළිය මහ නගර සභාවේ ගරු නගරාධිපතිතුමාගේ පණිවිඩය



නුවරඑළිය යනු ස්වභාවික සෞන්දර්යය හා සලකා බලන කල අගනා ස්ථානයක් ගන්නා ආකර්ශනීය ප්‍රදේශයකි. මධ්‍යම කඳුකරයේ මධ්‍යගතව පිහිටි මෙම ප්‍රදේශය තමන්ටම අවේනික වූ පාරිසරික සුවිශේෂී හා දේශගුණ තත්වයන්ගෙන් අනූන වේ. එසේම ශ්‍රී ලංකාවේ වෙනත් ප්‍රදේශ වලින් වඩා ශීත දේශගුණික තත්ත්වයක් පැවතීම ද විශේෂ කරුණක් ලෙස දැක්විය හැක. එසේම ඉතා දිගු ඉතිහාසයකට උරුමකම් කියනා මෙම ප්‍රදේශය දීර්ඝ කාලීනව විකාශනය වී අදවන විට සෑම අංශයකින්ම සංවර්ධිත මට්ටමකට පත්ව ඇති බව පවසනුයේ ඉතා සතුටිනි.

තවද නුවරඑළිය යනු වනාන්තර ගහනයෙන් යුක්ත ඉහළ උන්නතාංශයකින් හෙබි සුන්දර කඳුපන්තින්ගෙන් වටවූ සුන්දර ප්‍රදේශයකි. මෙම ආවේණික දේශගුණික තත්වයන් නිසාවෙන්ම අනන්‍ය වූ උඩරට එළවළු වගාව ප්‍රදේශය පුරාම වගා කරන බව දක්නට ලැබේ. එසේම වර්ණවත් වූ නෙත් සිත් පැහැර ගන්නා ලක්ෂණවලින් හෙබි විසිතුරු මල් වර්ගයන්ද ප්‍රදේශයට එක් කරනුයේ මනා සුන්දරත්වයයි.

උක්ත අනන්‍ය වූ කාරණා හේතුකොට ගනිමින් සංචාරක ආකර්ශණීය ස්ථානයන් අතරින් ප්‍රමුඛස්ථානයක් නිතැතින්ම හිමිකර ගැනීමට නුවරඑළිය සමත් වී ඇත. එබැවින් වර්තමානය වන විට සංචාරක ක්ෂේත්‍රය තුලින් ආර්ථික සංවර්ධනයක් මෙන්ම ඒ හා සමානව පාරිසරික හා සමාජීය මට්ටමේ දියුණුවක්ද දක්නට ලැබේ. එමෙන්ම නුවරඑළිය දිස්ත්‍රික්කයේ ප්‍රධාන පරිපාලන නගරය ලෙස ක්‍රියාකරන අතර වාණිජමය අංශයේද ප්‍රමුඛ කාර්යයභාරයක් උසුලන නගරයක් ලෙස හඳුනා දිය හැකිය.

එබැවින් උක්ත මා සඳහන් කල සියළු කාරණා හා විභවතායන් සැලකිල්ලට ගැනීමෙන් මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ මුලිකත්වයෙන් නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉදිරි වර්ෂ 10ක් සඳහා විසල් නුවරඑළිය සංවර්ධන සැලැස්ම නමින් නුවරඑළිය නගරය හා ඒ අවට කලාපයට සංවර්ධන සැලැස්ම සකස් කිරීම ප්‍රදේශයේ ප්‍රධාන පුරවැසියා ලෙස ඉතා සතුටට පත්වන බව පවසමි.

මෙම සංවර්ධන සැලැස්ම පිළිබඳව මා මාගේ විශේෂ අවධානයට යොමු කොට ඒ සම්බන්ධව අධ්‍යයනය කල බව දන්වන අතර ප්‍රදේශයේ ආර්ථික, සමාජීය, පාරිසරික සංචාරක හා අදාල සියලුම අංශයන්ගෙන් සංවර්ධනය විධිමත් හා ප්‍රවර්ධනය කිරීමේ අභිලාසය සහිතව මෙම සැලැස්ම සකස් කර ඇති බවද දක්නට ලැබේ. ඒතුලින් ඉදිරි දසවසරක කාලය තුලදී නුවරඑළිය නගරය සියළුම පාර්ශවයන්ට සේවා සපයන සෞභාග්‍යමත් ශීත කඳුකරයේ පාරාදීසයක් වන බව නොඅනුමානය.

එබැවින් මෙම සංවර්ධන සැලැස්ම සාර්ථකව ක්‍රියාත්මක කිරීමට හැකි වේවායි එකසිතින් ප්‍රාර්ථනා කරන අතර නුවරඑළිය මහ නගර සභාව ලෙස අප පුර්ණ දායකත්වය හා අවශ්‍ය සියලුම සහයෝගය ලබා දීමට බලාපොරොත්තුවන වන බවද තව දුරටත් දන්වා සිටිනු කැමැත්තෙමි

චන්දන ලාල් කරුණාරත්න

ගරු නගරාධිපති , නුවරඑළිය මහ නගර සභාව

නුවරඑළිය ප්‍රාදේශිය සභාවේ ගරු සභාපතිතුමාගේ පණිවිඩය



නුවරඑළිය ප්‍රදේශය ස්වභාවික සෞන්දර්යෙන් අනුන දෙස් විදෙස් සංචාරකයින්ගේ ආකර්ෂණය දිනාගත් ප්‍රදේශයකි. මධ්‍යම කඳුකරයේ මධ්‍යගතව පිහිටි මෙම ප්‍රදේශය තමන්ටම අවේනික වූ පාරිසරික සුවිශේෂතා හා දේශගුණික ලක්ෂණයන්ගෙන් සමන්විත වේ.

ඉහළ උන්නතාංශයකින් යුක්තව පිහිටීම වැඩි භූමි ප්‍රදේශයක් වනාන්තර ගහනයෙන් යුක්තව පිහිටීම, උඩරට තේ වගාව මෙන්ම උඩරට එළවළු වගාව සහිතව අනන්‍ය භූමි පරිභෝජන රටාවක් ප්‍රදේශයේ පෙන්නුම් කරයි.

බ්‍රිතාන්‍ය පාලන යුගයේ දී හඳුනාගන්නා ලද නුවරඑළිය කලාපය ජනාකීර්ණය වීම ආරම්භ වීමත් සමඟ අපරවියුහ පහසුකම් සංවර්ධනයක් ඇති වූ අතර උඩරට තේ වගාව ආශ්‍රිතව ගොඩනගන ලද වතු ආර්ථිකය හා එහි ජන ජීවන රටාව තවදුරටත් නුවරඑළිය ප්‍රදේශය වර්ණවත් කරයි. එහෙයින් වර්තමානය වන විට ආර්ථික, පාරිසරික, සාමාජීය වශයෙන් වැඩි දියුණුවක් ප්‍රදේශය අපෙක්ෂා කරයි. එසේම පරිපාලනමය කේන්ද්‍රස්ථානයක් වශයෙන්ද නුවරඑළිය නගරය වැදගත් කාර්යයක් සිදුකරනු ලබයි.

මේ හෙයින් මෙම කටයුතු සැලකිල්ලට ගෙන ඉදිරියේදී ඇති වන ප්‍රවණතාවන් පිළිබඳව අධ්‍යනය කර මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ මුලිකත්වයෙන් නාගරික සංවර්ධන අධිකාරිය මඟින් ඉදිරි වසර 10 සඳහා සකස් කරනු ලබන විසල් නුවරඑළිය සංවර්ධන සැලැස්ම සඳහා නුවරඑළිය ප්‍රාදේශිය සභාවේ සභාපති ලෙස මා සතුටට පත් වෙමි.

මෙම සැලැස්ම පිළිබඳව අප විසින් අධ්‍යනය කරන ලද අතර ඒ තුළින් ප්‍රදේශයේ ආර්ථික, සාමාජීය, පාරිසරික හා සංචාරක ක්ෂේත්‍රයේ සංවර්ධනයක් සිදු වෙතැයි බලාපොරොත්තු වෙමි.

ඉදිරි දස වසර තුලදි නුවරඑළිය ප්‍රදේශය ශීත කඳුකරයේ පාරාදීසය බවට පත්වීමට හැකියාව ඇති අතර මෙම සැලැස්ම සාර්ථකව ක්‍රියාවට නැංවීම සඳහා එකසිතින් ප්‍රාර්ථනා කරන අතර නුවරඑළිය ප්‍රාදේශිය සභාව ලෙස ඒ සඳහා පූර්ණ දායකත්වය ලබා දෙන බවද තවදුරටත් දන්වා සිටිමි.

වේළු යෝගරාජ්

ගරු සභාපති, නුවරඑළිය ප්‍රාදේශිය සභාව

සංඥාපනය

මෙම සංවර්ධන සැලැස්ම නුවරඑළිය නගර සීමාව සහ නුවරඑළිය ප්‍රාදේශිය සභා සීමාවට අයත් ග්‍රාම සේවා කොට්ඨාශ 21ක් සඳහා ඉදිරි 10 වසර තුළ සිදුකරනු ලබන සංවර්ධන කටයුතු සඳහා සකස් කර ඇත. නුවරඑළිය නගරය නුවරඑළිය දිස්ත්‍රික්කයේ ප්‍රධාන පරිපාලන නගරය මෙන්ම පාරිසරික සුන්දරත්වයෙන් ඉහළ තැනක් හිමි සංචාරක මරමස්ථානයකි. නුවරඑළිය නගරය ජනගහනය 35,000ක් පමණ වන අතර විසල් සංවර්ධන සැලැස්මට පාදක කර ගනු ලබන සම්පූර්ණ ප්‍රදේශයේ ජනගහනය 52,000ක් පමණ වේ. මීට අමතරව වාර්ෂිකව විදේශිය සංචාරකයින් 135,000ක් හා දේශිය සංචාරකයින් 950,000ක් පමණ ප්‍රදේශයට පැමිණේ. ඒ අනුව සංචාරක කර්මාන්තය මුලික කර ගත් ප්‍රදේශයක් මෙන්ම උඩරට එළවළු වගාව හා තේ කර්මාන්තය ආශ්‍රිතව ප්‍රධාන ආර්ථික කටයුතු මෙහෙයවනු ලැබේ. මෙම සංවර්ධන සැලැස්මේ ප්‍රධාන අරමුණ වන්නේ පාරිසරික සංවේදී තාවය ආරක්ෂා කර ගනිමින් තිරසර සංවර්ධනයක් ලගා කර ගැනිමයි. සංචාරක, කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ආර්ථික වර්ධනයක් මෙන්ම පාරිසරික සුන්දරත්වය ආරක්ෂා කර ගනිමින් ඉදිරි දස වසර සඳහා දැක්මක් ඒ සඳහා වන ඉලක්ක, අරමුණු හා උපාය මාර්ග මෙම සැලසුම් මගින් හඳුන්වා දී ඇත.



පිළිගැන්වීම

මෙම විසල් නුවරඑළිය සංවර්ධන සැලැස්ම සකස් කර එළි දැක්වීම සඳහා සෘජුව හා වක්‍රව නන් අයුරුන් සහය දැක්වූ සියලු සම්පත් දායකයින්ට, පරදු පාර්ශවයන්ට ගෞරවනීය කෘතඥතාවය මේ මගින් පිළිගන්වනු ලැබේ.

පළමුව හා ප්‍රමුඛව නුවරඑළිය මහ නගර සභාවේ නගරාධිපති ගරු චන්දන ලාල් කරුණාරත්න මැතිතුමා ඇතුළු නාගරික මන්ත්‍රීතුමන්ලාටද නුවරඑළිය ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති වී.යෝගරාජ් මැතිතුමා ඇතුළු ප්‍රා දේශිය සභා මන්ත්‍රීතුමන්ලාටද නුවරඑළිය මහනගර සභාවේ කොමසාරිස්තුමිය ඇතුලු එහි සියලු කාර්ය මණ්ඩලයටද නුවරඑළිය ප්‍රා දේශිය සභාවේ ලේකම්තුමා ඇතුලි සියලු කාර්ය මණ්ඩලයටද මෙම විසල් නුවරඑළිය 2030 සැලැස්ම සකස් කිරීම උදෙසා ලබා දුන් සහයට හෘදයාංගම කෘතඥතාවය පුද කරමි.

එසේම නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිතුමා අධ්‍යක්ෂ ජනරාල්තුමා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් සැලසුම්, සංවර්ධන සැලසුම් අංශය, පර්යේෂණ හා සංවර්ධන අංශය, පරිසර හා භූ දර්ශන අංශය, භූගෝලීය තොරතුරු පද්ධති අංශය හා බලාත්මක අංශය විසින් ලබා දුන් අදහස්, උපකාර හා දෛර්යය වෙනුවෙන් හෘදයාංගම හා ගෞරවනිය කෘතඥතාවය පුද කර සිටිමු.

අවසන් වශයෙන් විසල් නුවරඑළිය සංවර්ධන සැලැස්මසකස් කිරීම උදෙසා සහය දැක්වූ සියලුම පරදු පාර්ශවයන් වෙත මෙමගින් ස්තූතිය පුද කර සිටිමු.

පටුන

ලේඛණ තොරතුරු iv

ගරු ඇමතිතුමාගේ පණිවිඩය v

ගරු සභාපතිතුමාගේ පණිවිඩය vi

නුවරඑළිය මහ නගර සභාවේ ගරු නගරාධිපතිතුමාගේ පණිවිඩය vii

නුවරඑළිය ප්‍රාදේශිය සභාවේ ගරු සභාපතිතුමාගේ පණිවිඩය viii

සංඥාපනය ix

පිළිගැන්වීම x

පටුන xi

<u>කොටස - I</u>

1. පරිච්ඡේදය - හැඳින්වීම 2
   - 1.1. සංවර්ධන සැලැස්ම සකස් කිරීමේ පසුබිම 2
   - 1.2. සැලසුම් කණ්ඩායම 3
   - 1.3. විෂය පථය 4
   - 1.4. සැලැසුම ක්‍රියාවලිය 5

2. පරිච්ඡේදය - මූලික අධ්‍යනයන් 7
   - 2.1. අධ්‍යන කලාපය 7
   - 2.2. සැලසුම් සංදර්භය හා තත්ව විශ්ලේෂණය 9
   - 2.3. සංවර්ධන සැලසුම් සීමාව තීරණය කිරීම 26

3. පරිච්ඡේදය - සංවර්ධන සැලැසුම් අවශ්‍යතාවය 32
   - 3.1. ගැටලු හඳුනා ගැනීම 32
     - 3.1.1.ගැටලු ප්‍රමුඛතාකරණය 34
   - 3.2. මූලික ගැටලු පිළිබඳව විස්තරාත්මක අධ්‍යයනය 34
     - 3.2.1. නුවරඑළිය පිළිබඳව ඇති පිළිබිඹු /චිත්තරූපය වෙනස් වීම 34
     - 3.2.2. ජල මූලාශ්‍ර වල පවතින ප්‍රමාණාත්මක හා ගුණාත්මක භාවය අඩුවීම 39
     - 3.2.3. සංචාරක පහසුකම් ප්‍රමාණවත් නොවීම 43
     - 3.2.4. අඩු පහසුකම් නිවාස සහ පැල්පත් 34

<u>කොටස - II</u> 46

4. පරිච්ඡේදය - සැලසුම් රාමුව 52
   - 4.1. විසල් නුවරඑළිය 2019– 2030 ඉදිරි දැක්ම 53
   - 4.2. දැක්ම හැඳින්වීම 53
   - 4.3. අරමුණු 54
   - 4.4. පරමාර්ථ 54

5. පරිච්ඡේදය - SOWT (විශ්ලේශණය) 57

6. පරිච්ඡේදය - සැලස්ම 90
6.1. සංකල්පමය සැලස්ම 90
6.1.1. හැඳින්වීම 91
6.2. යෝජිත ඉඩම් පරිහරණ සැලැස්ම 92
6.3. ආර්ථික සංවර්ධන උපාය මාර්ග 95
6.3.1. හැඳින්වීම 95
6.3.2. උපායමාර්ග 96
6.4. පාරිසරික තිරසාර භාවය සඳහා වූ උපාය මාර්ග 100
6.4.1. පරිසර සංරක්ෂණ සඳහා වන උපාය මාර්ග 100
6.4.2. භූදර්ශන අලංකරණ සැලැස්ම 106
6.4.3. ආපදා කළමනාකරණ සැලැස්ම 108
6.5. සාමාජීය හා භෞතික අපරවයුහ පහසුකම් උපාය මාර්ග 112
6.5.1. සේවා සැලැස්ම 112
6.5.1. (අ) නිවාස 112
6.5.1. (ආ) අධ්‍යාපනය 115
6.5.1. (ඇ) සෞඛ්‍ය සේවාව 116
6.5.2. ප්‍රවාහනය 119
6.5.3. පානීය ජල සැපයුම 123
6.5.4. විදුලි බල හා දුරකථන පහසුකම් 126
6.5.5. ජලපවහනය හා මලපවහන සැලැස්ම 127
6.5.6. ඝන අපද්‍රව්‍ය හා අපජලය කළමනාකරණය 129
6.6. පොදු විවෘත ස්ථාන සඳහා වන උපාය මාර්ග 131
6.6.1. හැඳින්වීම 132
6.6.2. උපායමාර්ග 133
6.7. සංස්කෘතික හා පෞරාණික ස්ථාන වැඩි දියුණු කිරීමේ උපාය මාර්ග 133

සිතියම් අංක

සිතියම් අංක 2.1 - අධ්‍යන ප්‍රදේශය 8

සිතියම් අංක 2.2 - භූ විෂමතාවය 13

සිතියම් අංක 2.3 - කඳු පන්තීන් 14

සිතියම් අංක 2.4 - ජල මූලාශ්‍ර 14

සිතියම් අංක 2.5 - ඉඩම් පරිහරණ රටාව 16

සිතියම් අංක 2.6 - ජන ඝනත්වය - 2012 19

සිතියම් අංක 2.7 - නිවාස ඝනත්වය - 2012 21

සිතියම් අංක 2.8 - පානීය ජල මූලාශ්‍ර 24

සිතියම් අංක 2.9 - නුවරඑළිය මහ නගර සීමාව 29

සිතියම් අංක 2.10 - භෞතික සීමාව 27

සිතියම් අංක 2.11 - සැලසුම් ප්‍රදේශය 29

සිතියම් අංක 3.1- ජලමූලාශ්‍ර ආක්‍රමණය 37

සිතියම් අංක 3.2 - 2010 - වනාන්තර ගහනය (40% ව.කි.මී 55.1) 38

සිතියම් අංක 3.3 2017 - වනාන්තර ගහනය 34% ව.කි.මී 46.92 38

සිතියම් අංක 3.4 - දරිද්‍රතා මට්ටම 48

සිතියම් අංක 3.5 - මාර්ග වල තත්වය 49

සිතියම් අංක 5.1 - ජල මූලාශ්‍ර පද්ධතිය 59

සිතියම් අංක 5.2 - භූගෝලිය පිහිටීම 61

සිතියම් අංක 5.3 - කදු පන්තීන් 61

සිතියම් අංක 5.4 - වනාන්තර පද්ධතිය 63

සිතියම් අංක 5.5 - භූමී පරිහරණ රටාව -2010 6 7

සිතියම් අංක 5.6 - භූමී පරිහරණ රටාව -2017 6 7

සිතියම් අංක 5.7- ද්‍රරිද්‍රතා මට්ටම 78

සිතියම් අංක 6.1 - සංකල්පමය සැලැස්ම 92

සිතියම් අංක 6.2 - යෝජිත ඉඩම් පරිහරණ සැලැස්ම 93

සිතියම් අංක 6.3 - යෝජිත ආර්ථික සංවර්ධන උපාය මාර්ග 99

සිතියම් අංක 6.4 - යෝජිත වනාන්නතර පද්ධතිය 102

සිතියම් අංක 6.5 - සංවේදි කලාප 104

සිතියම් අංක 6.6 ආපදා කලාප සැලස්ම 109

සිතියම් අංක 6.7 පරිසර සංරක්ෂණ සඳහා වන උපාය මාර්ග සැලස්ම 111

සිතියම් අංක 6.8 - සාමාජීය හා භෞතික අපරව්‍යුහ පහසුකම් 11 7

සිතියම් අංක 6.9 - මාර්ග සංවර්ධන ව්‍යාපෘති 122

සිතියම් අංක 6.10 - මධ්‍යම ජල පිරිපහදු ඒකකය හා ජල තටාකාංගනය 125

සිතියම් අංක 6.11 - විවෘත භූමි හා ක්‍රීඩා පිටි 132

වගු අංක

වගු අංක 2.1 - අධ්‍යයන ප්‍රදේශය	7
වගු අංක 2.2 - ඉඩම් භාවිතය	15
වගු අංක 2.3 - නුවරඑළිය මහ නගර සීමාවේ ජනගහනයේ ප්‍රසාරණය	17
වගු අංක 2.4 - අධ්‍යයන සීමාවේ ජනගහනයේ ප්‍රසාරණය	17
වගු අංක 2.5 - නිවස තත්වය 2012	20
වගු අංක 2.6 - ජනගහන පිරිමීඩය	21
වගු අංක 2.7 - සේවා නියුක්තිය - 2012	22
වගු අංක 2.8 - අධ්‍යයාපන තත්වය, අ.පො.ස (ස.පෙළ)	25
වගු අංක 2.9 - අධ්‍යාපන තත්වය අ.පො.ස (උ.පෙළ)	25
වගු අංක 2.9 - පාදක කරගන්නා ලද දර්ශක	28
වගු අංක 2.10 - සංවර්ධන සැලසුම් බලප්‍රදේශය	30
වගු අංක 3.1 ග්‍රෙගරි වැවේ ජලයේ තත්වය	40
වගු අංක 3.2 - පානිය ජලයේ තත්වය	42
වගු අංක 3.3 - සංචාරක ආගමනය	44
වගු අංක 3.4 - නිවාස වල තත්වය	45
වගු අංක 3.5 -මහනගර සීමාව තුල අඩු ආදායම් නිවාස	46
වගු අංක 3.6 - දරිද්‍රතා මට්ටම	47
වගු අංක 5.1 - වාර්ෂික උෂ්ණත්නය හා වර්ෂාපතනය	62
වගු අංක 5.2 - ග්‍රෙගරි වැව ජල තත්ව වාර්තාව	65
වගු අංක 5.3 - පානීය ජල තත්ව වාර්තාව	66
වගු අංක 5.6 - සංචාරකයන්ගේ පැමිණීම පිළිබඳ තොරතුරු	78
වගු අංක 5.7 - නිවාස වල තත්වය	77
වගු අංක 5.8- සංචාරක ආගමනය -අංශ අනුව	78
වගු අංක 5.9 - යෝජිත හා ක්‍රියාත්මක ව්‍යාපෘති	84
වගු අංක 6.1- ආපදා ස්ථාන	108
වගු අංක 6.2 - නිවාස වැඩිදියුණු කිරීමේ උපාය මාර්ගය	114
වගු අංක 6.3- නිවාස නව ස්ථාන වෙත විතැන් කිරීම	114

වගු අංක 6.4 - වගු අංක මාර්ග සංවර්ධන ව්‍යාපෘති 121

වගු අංක 6.5 - සාමාන්‍ය වාර්ෂික වාර්ෂාපතනය 127

වගු අංක 6.6 පොදු විවෘත ස්ථාන 131

වගු අංක 6.7 - සංරක්ෂිත ගොඩනැගිලි 134

වගු අංක 6.8 - සංරක්ෂිත ගොඩනැගිලි මාර්ග අනුව 134

වගු අංක 6.9- නව ව්‍යාපෘති ලැයිස්තුව 137

<u>රූප සටහන්</u>

රූප සටහන් අංක 2.1 - ජාතික භෞතික සැලැස්ම -1,2012 10

රූප සටහන් අංක 2.2 - ජාතික භෞතික සැලැස්ම -2,2012 10

රූපසටහන අංක 2.3- සංශෝධිත ජාතික භෞතික සැලැස්ම -1, 2017 11

රූපසටහන අංක 2.4- සංශෝධිත ජාතික භෞතික සැලැස්ම -2,2017 11

රූපසටහන අංක 2.5- ජාතීන් අනුව ජනගහනය 2012 19

රූපසටහන අංක 2.6- සේවා නියුක්තිය - 2012 23

රූපසටහන අංක 2.8- අ.පො.ස උ.පෙ. සාමාන්‍යය 25

රූපසටහන 3.1 අවිධිමත් ඉදිකිරීම් තුළින් කදු පන්තින් වල ස්වභාවික දර්ශන තල අවහිර වීම 35

රූපසටහන 3.2 දිය ඇලි සිදී යෑම 36

රූපසටහන 3.3 ගෘහනිර්මාණ ලක්ෂණ වෙනස් වීම 39

රූපසටහන් 3.4 ජල බෙදාහැරීම් කලාප 41

රූපසටහන් 3.5 - අඩුපහසුකම් නිවාස 46

රූපසටහන 5.1- ජල මූලාශ්‍ර 59

රූපසටහන 5.2- ජල මූලාශ්‍ර 59

රූපසටහන 5.3- පානීය ජල බෙදාහැරීම 60

රූපසටහන අංක 5.4 - වාර්ෂික උෂ්ණත්වය හා වර්ෂාපතනය 62

රූපසටහන 5.5- ජලාශ්‍ර වල තත්ව වාර්තාව - 2017 64

රූපසටහන 5.6- ජලාශ්‍ර වල තත්ව වාර්තාව - 2016 58

රූපසටහන 5.7- - පැරණි ගොඩනැගිලි 70

රූපසටහන 5.8- - පැරණි ගොඩනැගිලි	71
රූපසටහන 5.9- පැරණි ගොඩනැගිලි	71
රූපසටහන 5.10- පැරණි ගොඩනැගිලි	71
රූපසටහන 5.11- පැරණි ගොඩනැගිලි	71
රූපසටහන 5.12- සංචාරක ආකර්ශන ස්ථාන	72
රූපසටහන 5.13- සංචාරක ආකර්ශන ස්ථාන	73
රූපසටහන 5.14- උඩරට එළවළු ගොවිතැන	73
රූපසටහන 5.15- උඩරට මල් වගාව	74
රූපසටහන 5.16- නුවරඑළිය අවේනික ගෘහ නිර්මාණ ලක්ෂණ වල වෙනස්වීම	75
රූපසටහන 5.17 නව ඉදිකිරීම් හේතුවෙන් දර්ශණ තල අවහිර වී ඇති අයුරු	76
රූපසටහන 5.18- නව ඉදිකිරීම් හේතුවෙන් දර්ශණ තල අවහිර වී ඇති අයුරු	76
රූප සටහන 5.19- අඩු ආදායම් නිවාස හා පැල්පත්	77
රූප සටහන 5.20- අඩු ආදායම් නිවාස හා පැල්පත්	77
රූප සටහන 5.21- අඩු ආදායම් නිවාස හා පැල්පත්	77
රූපසටහන 5.22- කාළගුණ විපර්යාස හා දේශගුණ තත්වයන් වෙනස්වීම්	79
රූපසටහන අංක 5.23 - නුවරඑළිය මහ නගර සභාව වාර්ෂික ආදායම් හා වියදම්	81
රූපසටහන 5.24- නුවරඑළිය වසන්ත සැණකෙළිය	82
රූපසටහන 5.25- උඩරට දුම්රිය මාර්ගය ආසන්නයේ පිහිටීම	82
රූපසටහන 5.26- උඩරට දුම්රිය මාර්ගය ආසන්නයේ පිහිටීම	83
රූපසටහන 5.27- උඩරට දුම්රිය මාර්ගය ආසන්නයේ පිහිටීම	83
රූපසටහන 5.28- ජාත්‍යන්තර වශයෙන් ප්‍රසිද්ධ සංචාරක කේන්ද්‍රස්ථානයක් වීම	83
රූප සටහන 5.29- ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන සැලැස්ම 2017-2020	85
රූපසටහන 5.30- ශ්‍රී ලංකාවේ යෝජිත නව අධිවේගී මාර්ග පද්ධතිය	86
රූප සටහන 5.31 - සංචාරක ආගමනය	87
රූප සටහන 5.32- සංචාරක කර්මාන්තයේ වර්ධනය	87
රූප සටහන 5.33 - සංචාරක ආගමනය	87
රූපසටහන 5.34- අවධානම් කාළගුණික තත්වයන්	88
රූපසටහන 5.35- සංචාරක පැමිණීම - නුවරඑළිය	88

පරිච්ඡේද I

හැඳින්වීම



01. හැඳින්වීම

1.1 සංවර්ධන සැලැස්ම සකස් කිරීමේ පසුබිම

නාගරික ප්‍රදේශයක් තුල ඉදිරි කාලයසඳහා නව සංවර්ධන සැලැස්ම සකස් කිරීමේදී එහි සමාජීය ආර්ථික, දේශපාලනික, සංස්කෘතික, පාරිසරික හා භෞතික තත්වයන් කෙරෙහි මූලික අවධානය යොමු කල යුතුයි. එසේම යථෝක්ත නගරයන්හි පැවැත්ම, එහි ආකෘතිය හා ක්‍රියාවලියේ තීවුරතාවය මෙම අංශයන් කෙරෙහි ඇති ප්‍රභලතාවයන් අවකාශයන්, දුබලතාවයන් මෙන්ම අභියෝගයන් වල තීවුරතාවයේ අඩු වැඩි භාවය මත රදාපවති.

ශ්‍රී ලංකාවේ නාගරික සංවර්ධන හා ඒ ආශ්‍රිත සංවර්ධනයන් හා ප්‍රධානතම නියාමන ආයතනය වශයෙන් නාගරික සංවර්ධන අධිකාරිය හඳුනාගත හැකිය. නාගරික සංවර්ධන අධිකාරියට ශ්‍රී ලංකාවේ නාගරික සැලසුම්කරණය සඳහා වූ බලතල 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනත හා ඒ යටතේ සකස් කරන ලද 1982 අංක 04 දරණ නාගරික සංවර්ධන අධිකාරි සංශෝධන පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකාව තුළ හඳුනා ගන්නා ලද සීමා සඳහා සැලසුම් සකස් කිරීම හා බලාත්මක කිරීම සඳහා බලතල ලැබී ඇත.

මෙම නීතිමය රාමුව තුළ නාගරික සංවර්ධන අධිකාරිය මගින් යම් නාගරික ප්‍රදේශයක් සඳහා උක්ත සඳහන් කල සමාජීය ආර්ථික, දේශපාලනික, සංස්කෘතික, පාරිසරික හා භෞතික තත්වයන් පිළිබඳ අධ්‍යයනය කර එම ප්‍රදේශයේ ඇති නව ප්‍රවණතාවයන් හා විභවතාවයන් හඳුනාගනිමින් පවත්නා දුර්වලතාවයන් හා අභියෝග නිසි කළමනාකරණය කර ඉදිරි නිශ්චිත කාල සීමාව සඳහා නිසි දැක්මක් යටතේ මෙම සංවර්ධන සැලසුම් සකස් කරනු ලැබේ. මෙම සැලසුම් ප්‍රදේශයේ ජනතාවට, සංක්‍රමනික ජනතාවට මෙන්ම සියලු පාර්ශවයන්ගේ ඉදිරි සංවර්ධණයට රුකුලක් වන ආකාරයට සකස් කරනු ලැබේ.

මේ අතර 1978 නාගරික සංවර්ධන අධිකාරි පනත අනුව 1979 ජුනි 01 වන දින අංක 38/16 යටතේ නුවරඑළිය මහ නගර සභා සීමාව නාගරික සංවර්ධන අධිකාරි බල ප්‍රදේශයක් ලෙස නම් කර ඇති අතර 1998.09.08 දිනැති අංක 1546/04 දරණ ගැසට් පත්‍රය මගින් නුවරඑළිය ප්‍රාදේශිය සභා සීමාවද නාගරිකසංවර්ධන අධිකාරි බල ප්‍රදේශයක් ලෙස නම් කර ඇත.

ඒ අනුව නුවරඑළිය මහ නගර සභා සීමාව සඳහා නාගරික සංවර්ධන අධිකාරිය මගින් 2004 වසරේදී නව සංවර්ධන සැලැස්ම සකස් කරන ලද අතර 2018 වසරේදී එය කල් ඉකුත් වනු ලැබේ. ඒ අනුව නව සංවර්ධන සැලැස්මක් නුවරඑළිය මහ නගර සීමාව හා ඒ ආශ්‍රිත නුවරඑලිය ප්‍රාදේශිය සභා සීමාවට අයත් ග්‍රාම සේවා වසම් 05ක් ඇතුලත් වන පරිදි නව විසල් නුවරඑළිය සංවර්ධන සැලැස්ම ඉදිරි අවුරුදු 10 සඳහා මෙමගින් ඉදිරිපත් කරනු ලැබේ.

මෙම සංවර්ධන සැලැස්ම මගින් නව සංවර්ධන උපාය මාර්ග හා රෙගුලාසි හා නියමයන් හඳුන්වා දී ඇත.

1.2 සැලසුම් කණ්ඩායම

1.2.1. ප්‍රධාන උපදේශන ආයතන

01.නුවරඑළිය මහ නගර සභාව

2. නුවරඑළිය ප්‍රාදේශිය සභාව

1.2.2.අනෙකුත් පරදු පාර්ශවයන්

1. සියළුම ආගමික නායකයින්
2. මධ්‍යම පරිසර අධිකාරිය
3. මාර්ග සංවර්ධන අධිකාරිය
4 වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
5.ජන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව
6. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
7.නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
8.නුවරඑළිය ප්‍රාදේශිය ලේකම් කාර්යාලය
9. ගොඩනැගිලි පර්යේෂණ ආයතනය
10.කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
11. ගොවිජන සේවා දෙපාර්තමේන්තුව
12 වාර්මාර්ග දෙපාර්තමේන්තුව
13. දුම්රිය දෙපාර්තමේන්තුව
14.අධ්‍යාපන දෙපාර්තමේන්තුව
15. සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
16.ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය- නුවරඑළිය ඩිපෝව
17. මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය
18.ලංකා විදුලි බල මණ්ඩලය
19. ශ්‍රී ලංකා ටෙලිකොම්
20.ජාතික භෞතික දෙපාර්තමේන්තුව
21.නුවරඑළිය මෝටර් රේසිං සංගමය
22.නුවරඑළිය ඒකාබද්ධ වෙළඳ සංගමය
23. නුවරඑළිය ක්‍රිඩා සමාජය
23. නුවරඑළිය 4 x 4 මෝටර් රථ සංගමය
26. නුවරඑළිය සංචාරක හෝටල් හිමියන්ගේ සංගමය
25. නුවරඑළිය ලැගුම්හල් හිමියන්ගේ සංගමය
27.නුවරඑළිය සංචාරක මග පෙන්වන්නන්ගේ සංගමය
28..රාජ්‍ය නොවන සංවිධාන

1.2.3. සංවර්ධන සැලසුම් සකස්කිරීමේ කණ්ඩායම

එන්.ඒ.එස්.එන්. නිශ්ශංක ඊ.එම්.එස්.ඩී.ඒකනායක	අධ්‍යක්ෂ(මධ්‍යම පළාත)
එච්.එම්.ඩබ්ලිව්.හේරත්	නි.අධ්‍යක්ෂ (සැලසුම්)
පී.ඩබ්.එන්.එම්. පරණගම	සැලසුම් නිළධාරී
එම්.එච්.පී. මධුෂාණි	සහකාර සැලසුම් නිළධාරී
ජේ.එම්.යු.එස්.කුමාර	සැලසුම් නිළධාරී

1.2.4 සංවර්ධන සැලසුම් සකස් කිරීම සඳහා සහය වූ අංශ

1.නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්) කාර්යාලය
2. සංවර්ධන සැලසුම් අංශය
3. පරිසර හා භූදර්ශන අංශය
4. භූගෝලීය තොරතුරු පද්ධති අංශය

1.3 විෂය පථය

නුවරඑළිය, ශ්‍රී ලංකාවේ මධ්‍යම පළාතේ පිහිටි සුවිශේෂී නගරයකි. මෙම නගරය ශ්‍රීලංකාවේ අනෙකුත් නගර හා සැසඳීමේදී සාපේක්ෂව භෞතික හා පාරිසරික විවිධාංගිකරණයකින් යුක්ත වේ. අධි සංවේදී පාරිසරික කලාපයන්ගේ හා අනන්‍යවූ සුවිශේෂ දේශගුණික ලක්ෂණයන්ගෙන් සමන්විත මෙම කලාපය දිවයිනේ ප්‍රධාන ගංගා පෝෂණය කරනු ලබන ප්‍රධාන ජල පෝෂක කලාපයක් ලෙස හඳුනා ගත හැකිය.

මෙම පාරිසරික තත්වය මත ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා ජාතික සැලැස්ම යටතේ නුවරඑළිය ප්‍රදේශය අධි සංවේදි පරිසර පද්ධතියක් ලෙස නම් කර ඇති අතර, මේ ආශ්‍රිත ප්‍රදේශය පරිසර හිතකාමී සංචාරක ප්‍රදේශයක් ලෙස හඳුනාගෙන ඇත.

2050 ජාතික භෞකික සැලසුමට අනුව මධ්‍යම අධිසංවේදී කලාපයට නුවරඑළිය කලාපය අයත්වන අතර එහි 2050 වන මිට ජනගහන 100, 000ක සීමා කිරීමක් සැකිල්ලට ගනිමින් මෙම විසල් නිවුරඑළිය කලාපයෙහි පවතින සංවේදිතාව හා ඉපුලුම් ධාරිතාවය සලකා 2030 වන විට ජනගහනය 59,000ක් ලෙස පුරෝකථනය කර ඇත.

එසේම 2004.04.23 දින අංක 1337/16 යටතේ නාගරික සංවර්ධන අධිකාරිය මගින් ගැසට් කරන ලද 2004-2017 නුවරඑළිය සංවර්ධන සැලැස්මේ හඳුනාගැනීම් හා අඩුපාඩු මගහරවා ගනිමින්ද මෙම සංවර්ධන සැලැස්ම පත්කර ඇත

විශේෂයෙන් 1937 අංක 2 දරණ වන හා වෘක්ෂලතා අඥා පනත හා ඊට ආනුසාංගික පසුකලක සංශෝධනයන් අනුව නීතිගත වූ වන හා වෘක්ෂ ලතා පනත අනුව දැඩි රක්ෂිත භූමියක් ලෙස නම්කරන ලද හග්ගල රක්ෂිත භූමියහි මායිම් මෙම සංවර්ධන සැලැස්මට මායිම් වන බැවින් එහි ඇති සීමා මායිම් හා නීති තත්වයන් සලකා බලන ලදි. එසේම 2017.12.14 දින අන 1527/22 ගැසට් පත්‍රය මගින් ගැසට් කරන ලද පිදුරුතලාගල සංරක්ෂිත වන කලාපයත්ල අංක 1559/12 හා 2018.07.22 ගැසට් කරන ලද කඳපොල, සීතාඑළිය සංරක්ෂිත වන කලාපයක් මෙන්ම 2009 අංක 65 දරණ වන රක්ෂිත (සංශෝධන) පනත මගින් ආවරණය වන කිකිලියාමාන සිංගල් ට්‍රී වන සීමාවක් සඳහා වන සීමාවන්, නීතිරීති, රෙගුලාස් පිළිබඳව සලකා බලන ලදි.

එසේම 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනත යටතේ අංක 1487/10 හා 2007 මාර්තු මස 05 දින ගැසට් කරන ලද ග්‍රෙගරි වැව පාරිසරික ආරක්ෂිත ප්‍ර දේශ සඳහා වන නිතිරීති සීමා පිළිබඳව සලකා බලන ලදි.

එසේම වන හා වෘක්ෂලතා ආඥාපනත යටතේ 2006 මැයි මස 18 දින අන 1405/18 යටතේ ගැසට් කරන ලද ගැල්වේස් ලැන්ඩි ජාතික අභයභූමිය සඳහා වන නීතිරීති සීමා මායිම් පිළිබඳව සලකා බලන ලදි.

පුරා වස්තු ආඥා පනත අනුව පුරා විද්‍යා දෙපාර්තමේන්තුව විසින් ගැසට් අංක 1486 යටතේ 2007.02.23 දින ගැසට් පත්‍රය මගින් නම් කරන ලද නුවරඑළිය නගරයේ පිහිටි සංරක්ෂණය කල යුතු ගොඩනැගිලි සඳහා වූ නියමයන් රෙගුලාසි මෙන්ම නාගරික සංවර්ධන අධිකාරිය මගින් ගැසට් කරන ලද 2004 -2017 සංවර්ධන සැලැස්මෙහි හඳුනාගෙන ඇති නුවරඑළිය ආවේනික වූ ගෘහ නිර්මාණ ශිල්පී ලක්ෂණ පෙන්නුම් කරන ගොඩනැගිලි සඳහා වූ නියමන් කෙරෙහිද සලකා බලන ලදි.

ඒ අනුව යමින් විසල් නුවරඑළිය සංවර්ධන සැලැස්මද පාරිසරික සංවේදිතාවය පිළිබඳව අවධානය යොමු කරමින් පාරිසරික සංචාරක සංවර්ධනයට අවශ්‍ය ප්‍රතිපාදන මෙන්ම මනා කළමනාකරණයෙන් යුත් ආර්ථික, සමාජීය හා පරිසර සංවර්ධන ඉලක්ක කර ගත් මෙම සැලැස්ම ඉදිරිපත් කෙරේ.

1.4 සැලැසුම ක්‍රියාවලිය

මූලික අධ්‍යයනය	දත්ත එක්රැස් කිරීම (මූලික හා ද්විතියිය එකතු කිරීම සමීක්ෂණ මගින් රජයේ කාර්යාල මගින්, අන්තර්ජාලයෙන්, ගූගල් සිතියම් මගින්, නිබන්ධන හා වාර්තා මගින්, සම්මුඛ පරීක්ෂණ මගින් සිදුකරනු ලැබේ.
විෂය පතය	පවත්නා තත්වය පිලිබඳව අධ්‍යනය කිරීම හා සිමාවන් හා ප්‍රමාණයන් හදුනා ගැනීම (මේ සඳහා MS Excel, GIS, Drone Survey භාවිතා කරන ලදි.)
ගැටළු මා විභවතා හඳුනාගැනීම	ප්‍රදේශයේ පවත්නා ගැටළු හා ඒවායේ සංදර්භය, වැදගත්කම හා ප්‍රමාණත්වය පිළිබඳව සැලකිල්ලට ගැනීම හා ප්‍රදේශයේ ඇති විභවතායන් හා ඒවායේ තීවෘතාවය හදුනා ගැනීම
දැක්ම/ඉලක්ක/අරමුණු	පවත්නා ගැටළු අවම කිරීමටත් ප්‍රදේශයේ ඇති විභවත්වයන් වලින් උපරිම ඵල ගැනීමටත් අරභයා ඉදිරි වසර 10 තුළ සාමාජීය, ආර්ථික හා භෞතික වශයෙන් තුලනාත්මක සංවර්ධනයක් සඳහා වන දැක්මක් හදුනා ගැනීම ඒ යටතේ ඉලක්ක හා අරමුණු හදුනා ගැනීම
විස්තරාත්මක අධ්‍යයනය	හදුනා ගන්නා ලද දැක්ම කරා ලගා වීමට ඉලක්ක හා අරමුණු පිළිබඳ විස්තරාත්මක අධ්‍යනය (SWOT අධ්‍යනය, සංවේදිතා අධ්‍යනය)
සැලසුම් හා උපාය මාර්ග	ප්‍රදේශයේ ආර්ථික සමාජීය, භෞතික හා පාරිසරික තත්වයන් පිළිබඳව විස්තාරත්මක අධ්‍යනය කිරීම ඒ තුළින් සංවර්ධන ප්‍රදේශයක් ලෙස වැඩි දියුණු කිරීම
රෙගුලාසි	හදුනාගන්නා ලද ඉලක්ක හා අරමුණු සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය සැලැසුම් හා ගොඩනැගිලි, රෙගුලාසි හදුන්වා දීම
අදහස් විමසිම	දළ සංවර්ධන සැලැස්ම මහජන අදහස් සඳහා යොමු කිරීම
අනුමැතීන්	දළ සංවර්ධන සැලැස්ම ප්‍රධාන සැලසුම් කමිටු අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම
ප්‍රසිද්ධකිරීම්	නියමිත නීතිරිති පටිපාටියට අනුව සංවර්ධන සැලැස්ම ගැසට් කර නීතිගත කිරීම

පරිච්ඡේද 2

මූලික අධ්‍යයනයන්



02.මූලික අධ්‍යනයන්

2.1 අධ්‍යන කලාපය

1. නුවරඑළිය නගරය ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකරයේ මධ්‍යයේ පිහිටි සුවිශේෂ දේශගුණ හා භූදර්ශනයකින් සමන්විත වූ ප්‍රදේශයකි. පිදුරුතලාගල කඳු වැටියත් කිකිළියාමාන හා සිංගල් ට්‍රී කඳු වැටියත් හග්ගල කඳු වැටියත් මූලික කරගත් මෙම ප්‍රදේශය ශ්‍රී ලංකාවේ ප්‍රධාන ගංගා වල ප්‍රධාන ජල පෝෂක ප්‍රදේශයක් ලෙස හඳුනාගත හැකිය. මහවැලි ගඟේ ප්‍රධාන අතු ගංගාව වන කොත්මලා ඔයත් උමා ඔයෙත් පෝෂක ප්‍රදේශයක් ලෙස හඳුනාගත හැකිය.

2. 1948 දී මහ නගර සභාවක් ලෙස නුවරඑළිය මහ නගර සභාව පත් කර ඇති අතර, 1979.06.01 දින අංක 38/16 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් නාගරික සංවර්ධන අධිකාරී බල ප්‍රදේශයක් ලෙස පත් කර ඇත. එසේම නුවරඑළිය ප්‍රදේශිය සභා සීමාවද නාගරික සංවර්ධන අධිකාරී බල ප්‍රදේශයක් ලෙස 1998.09.01 දින ගැසට් අංක 154614 මගින් නම් කර ඇත.

3. ඒ අනුව විසල් නුවරඑළිය සංවර්ධන සැලැස්ම සඳහා අධ්‍යන ප්‍රදේශ වශයෙන් නුවරඑළිය මහ නගර සභා සීමාවද, නුවරඑළිය ප්‍රදේශිය සභා සිමාවෙන් කොටසක් ද යටත් කර ගන්නා ලදි. ඒ අනුව නුවරඑළිය මහ නගර සභා සීමාව තුළ පිහිටි ග්‍රාම නිලධාරී වසම් 12ද නුවරඑළිය ප්‍රදේශිය සභා සීමාව තුළ ඇති ග්‍රාම නිලධාරී වසම් 18ක් වශයෙන් ග්‍රාම නිලධාරී වසම් 30ක අධ්‍යන භූමි ප්‍රමාණය අධ්‍යන ප්‍රදේශ වශයෙන් හඳුනාගනු ලැබේ. (වගු අංක 2.1 /සිතියම් අංක 2.1) මෙම සමස්ථ ප්‍රදේශය වර්ග කි.මී 138කින් සමන්විත වේ.

*වගු අංක **2.1** - අධ්‍යයන ප්‍රදේශය*

	ග්‍රාම නිලධාරි කොට්ඨාශ	කොට්ඨාශ අංකය		ග්‍රාම නිලධාරි කොට්ඨාශ	කොට්ඨාශ අංකය
1	බඹරකැලේ	535K	16	කැලේගාල	535C
2	බංගලාහත	476C	17	මාගස්තොට	535A
3	බුලුඇල	535I	19	මීපිලිමාන	476H
4	කොන්කෝඩියා	534F	19	මිහිදුපුර	476G
5	ගල්පාලම	534A	20	නුවරඑළිය	535
6	ගොරඩිහෙල	478	21	නුවරඑළිය මධ්‍යම	535D
7	හාවාඑළිය	535H	22	නුවරඑළිය බටහිර	535L
8	හාවාඑළිය උතුර	535G	23	පාර්ක්	534P
9	හාවාඑළිය බටහිර	535F	24	පීඩa	534H
10	ජයලංකා	534B	25	රුවන් එළිය	476D
11	කලපුර	535N	26	සඳතැන්න	535E
12	කලුකැලේ	535B	27	සීතාඑළිය	478A
13	කනදපොල	534	28	ශාන්තිපුර	535M
14	කදපොල මධ්‍යම	534C	29	ටොප්පාස්	535J
15	කදපොල නැගෙනහිර	534D	30	වින්ඩිකෝනර්	476E

*සිතියම් අංක **2.1** - අධ්‍යන ප්‍රදේශය*



අධ්‍යයන ප්‍රදේශය
විසල් නුවරඑළිය සංවර්ධන සැලස්ම

නාගරික සංවර්ධන අධිකාරිය
නුවරඑළිය
2019

නුවරඑළිය නාගරික සංවර්ධන සැලස්ම (2019-2030)

සැකසුම -මදුෂානී

2.2.සැලසුම් සංදර්භය හා තත්ව විශ්ලේෂණය

01.නුවරඑළිය ඉතිහාසය ලංකාවේ පැරණිතම ජනාවාස යුගය දක්වා පැවතෙන බව ජනප්‍රවාදයේ පවති. ජනප්‍රවාදයට හා ඉන්දියාවේ රචිත රාමායනයට අනුව ශ්‍රී ලංකාවේ රජකල රාවණා රජු විසින් සිතා දේවිය ඉන්දියාවෙන් පැහැරගෙන විත් සගවා තබා ගෙන ඇත්තේ නුවරඑළියට ආසන්න ප්‍රදේශයකයි. ඒ අනුව රාවණා රජු විසින් නුවරඑළිය හා ඒ ආශ්‍රිතව වාසය කර ඇති බවත් මතවාද පවති. සිතා දේවි සගවා තිබූ ස්ථානය සිතාඑළිය මෙන්ම එහි ඇති සිතා කෝවිලද මෙම ජනප්‍රවාද වලට සාක්ෂි සපයයි.

එසේම ශ්‍රී ලංකාවේ රජවරු විවේක ස්ථානයක් ලෙස මෙන්ම සංචාරක ස්ථානයක් ලෙස නුවරඑළිය පවත්වා ගෙන ගිය බවට මතවාද පවති. මධ්‍යම කඳුකරයට ඇතුල්වීම තහනම් කිරීම වැනි මතවාද ද ඒ බව තහවුරු කරයි. මෑත ඉතිහාසය අනුව බ්‍රිතාන්‍ය පාලන සමයේදි ක්‍රි.ව 1818 දි ඉංග්‍රිසි ජාතික වෛද්‍ය ජෝන් ඩේවි ගවේෂණය කිරීමෙන් අනතුරුව නුවරඑළිය ප්‍රදේශයේ පවතින දේශගුණය හා පරිසරය බෙහෙවින් එංගලන්ත පරිසරයට සමාන ලෙස හඳුනා ගන්නා ලදි. මෙම ප්‍රදේශය විවේක ස්ථානයක් ලෙස ප්‍රවර්ධනය කිරීමටත් ඔවුන්ගේ නේවාසික ලැගුම්හල් ආරම්භ කිරීමටත් කටයුතු කරන ලදි.

ක්‍රි.ව 1828 වන විට ලංකාවේ සිටි බ්‍රිතාන්‍ය ආණ්ඩුකාර එඩ්වඩ් බානස් විසින් මෙහි සංචාරක විවේක ස්ථාන ආරම්භ කරන අතර, බ්‍රිතාන්‍ය ගෘහ නිර්මාණ ශිල්පීය ලක්ෂණ වලින් යුතු ගොඩනැගිලි ඉදිකිරීම ආරම්භ කරන ලදි. ඊට සමගාමීව විලියම් ග්‍රෙගරි විසින් ග්‍රෙගරි වැව ඉදිකිරීම, සැමුවල් බේකර්ස් විසින් මාගස්තොට වගා බිම් ආරම්භ කිරීම, වතු සුපර්වයිසර් ලෝසන් මහතා විසින් නගර මධ්‍යයේ නිවාස ඉදිකිරීම වැනි කටයුතු ප්‍රධාන වේ. වාස්තු විද්‍යාත්මක ලක්ෂණ වලින් සමන්විත නිවාස ආරම්භ කරන ලදි. මේ වන විට මෙකල ඉදිකරන ලද නිවාස 129ක් පමණ නුවරඑළිය ප්‍රදේශයේ ව්‍යාප්ත වී ඇති අතර එම ගොඩනැගිලි සංරක්ෂිත ගොඩනැගිලි ලෙස 2004-2018 නුවරඑළිය සංවර්ධන සැලැස්ම යටතේ නම් කර ඇත.

නිදහසින් පසුව දේශීය ජනතාවද නුවරඑළිය ප්‍රදේශයට අවතීර්ණය වීම වැඩි වූ අතර ක්‍රමක්‍රමයෙන් ජනාවාස බිහිවීම වැඩි විය. 20 වන සියවසේ මුල් භාගයේදි පේයාරස් වගාව මෙන්ම උඩරට එළවළු වගාවද පවත්වා ගෙන ගොස් ඇත. 1969 දී අර්තාපල් වගාව හඳුන්වා දීමත් නුවරඑළිය කෘෂිකර්මාන්ත වර්ධනයට ප්‍රධාන සාධකයක් විය. එසේම 20 වන සියවසේ අගභාගයේදි සංචාරක කර්මාන්තය වර්ධනය වීමත් නුවරඑළිය ආශ්‍රිතව සංචාරක නැරඹුම් ස්ථාන හා සංචාරක හෝටල් ඉදිකිරීම ආරම්භ වීමත් තවදුරටත් නුවරඑළිය සංවර්ධනය ඉදිරියට ගමන් කිරීමකි. 1970 සහ 80 දශක වලදි රජය මැදිහත් වී ගොවි පවුල් පදිංචි කිරීමත් 1983 සිවිල් කෝලහාල වලදි නගර මධ්‍යයේ දේපල විනාශ වීම හා ඉන් අනතුරුව එම ඉඩම් ප්‍රතිසංවර්ධනය කිරීමත් නුවරඑළියේ සංවර්ධනයට මුලික වූ ප්‍රධාන අවස්ථාවන් ලෙස ගත හැකියි.

02. ජාතික වශයෙන් සලකන විට නුවරඑළිය නගරය දෙවන ගණයේ නගරයක් ලෙස 2012 දි සකස් කරන ලද ජාතික භෞතික සැලසුමෙන් හඳුන්වා ගෙන ඇත. එසේම නුවරඑළිය ප්‍රදේශය අධි සංවේදි මධ්‍යම පරිසර පද්ධතියට අයත් ප්‍රදේශයක් ලෙස ද පාරිසරික සංචාරක ප්‍රදේශයක් ලෙස එම සැලැස්මේ නම් කර ඇත. එසේම 2017 සශෝධිත ජාතික භෞතික සැලැස්ම අනුවද නුවරඑළිය නගරය උපාය මාර්ග සංවර්ධනය කල යුතු නගරයක් ලෙස හඳුනාගෙන ඇත. නුවරඑළිය ආශ්‍රිත ප්‍රදේශය ජනගහනය ලක්ෂයක වර්ධනයක් 2050 දි බලාපොරෝත්තුවේ.

*රූප සටහන් අංක **2.1** - ජාතික භෞතික සැලැස්ම **2012***





මූලාශ්‍රය - ජාතික භෞතික සැලැස්ම දෙපාර්තමේන්තුව

*රූප සටහන් අංක **2.2** - ජාතික භෞතික සැලැස්ම*



මූලාශ්‍රය - ජාතික භෞතික සැලැස්ම දෙපාර්තමේන්තුව

*රූප සටහන් අංක **2.3** - සංශෝධිත ජාතික භෞතික සැලැස්ම - **1** **2017***



*රූප සටහන් අංක **2.4** - සංශෝධිත ජාතික භෞතික සැලැස්ම - **2, 2017***



03. 2017 වසරේ යාවත්කාලීන කරන ලද ජාතික භෞතික සැලසුම් අනුව නුවරඑළිය නගරය හා ඒ අවට කලාපය මධ්‍යම පාරිසරික සංවේදී කලාපය තුල පිහිටා ඇත. එසේ වුවත් මෙම සැලැස්ම තුලින් නුවරඑළිය නගරය උපායමාර්ගික අයෝජන තුලින් තිරසර සංවර්ධනය ලගා කර ගත යුතු නගරයක් ලෙසත් නුවරඑළිය නගරය අවට කලාපය තුල 2050 වන විට ජනගහනය 100000 ප්‍රමාණයක් අපේක්ෂා කරනු ලැබේ.

04. නුවරඑළිය නගරය ඒ අවට කලාපයන් සඳහා සියළුම දිශාවන් ආවරණය කරමින් සෘජුව සම්බන්ධ කරමින් ප්‍රධාන මාර්ග පද්ධතියක් ඇත. නුවරඑළිය සිට ගම්පොල මහනුවර හරහා කොළඹටත්, හැටන් අවිස්සාවේල්ල හරහා කොළඹටත්, රාගල වලපනේ හරහා මහනුවරටත්, වැලිමඩ බණ්ඩාරවෙල හරහා දකුණු පළාතටත් දිවෙන ප්‍රධාන මාර්ග පද්ධති තුලින් දිවයිනේ අනෙකුත් පළාත් සමග මනා සම්බන්ධතාවක් පවති. එසේම සාපේක්ෂව වඩා හොඳ අභ්‍යන්තර මාර්ග පද්ධතියක් නුවරඑළිය නගර මධ්‍යයේ ඇති අතර මාර්ග ඝනත්වය නුවරඑළිය මහ නගර සභා සීමාව තුල ඇති ග්‍රාම නිලධාරී වසම් වල ඉහළ අගයක් ගනී. එසේම සබැදුම් විශ්ලේෂණය අනුව නුවරඑළිය නගර මධ්‍යයේ ද ඉහළ සබැදුම් මධ්‍යතාවයක් ඇති බව පෙන්නුම් කරයි.(ඇමුණුම් 01)

05. දේශගුණික වශයෙන් එය සාපෙක්ෂව පහළ උෂ්ණත්වයක් මෙන්ම බෝහෝ විට ලැබෙන හීන තීව්‍රතාවයකින් යුතුව වර්ෂාපතනයකින්ද භූක්ති විඳියි. වාර්ෂික සාමාන්‍ය උෂ්ණත්වය සෙ.අංශක 20ක් පමණ වන අතර, උපරිම උෂ්ණත්වය සෙ.අංශක 21ක් දක්වා ඉහළ නැගීමක්ද (ජනවාරි,පෙබරවාරි මාර්තු මාසවල) අවම උෂ්ණත්වය සෙ.අංශක 9 දක්වා පහත වැටීමක් (දෙසැම්බර් මාසයේ) වාර්තා වේ.

ජනවාරි - අප්‍රේල් මාසවල වියලි කාලගුණයක් දක්නට ඇති අතර, එම කාලය තුළ සාපෙක්ෂ ආර්ද්‍රතාවයද පහළ බසියි. එසේම සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය මිලිමීටර් 2500 වන අතර, වියලි සමයේ වර්ෂාපතනය මිලිමීටර් 500 දක්වා පහළ බසියි. වැසි සමයේ ජල මූලාශ්‍රවල දෛනික උකහා ගැනීමේ ධාරිතාවය කියුබික් මීටර් 18773ක් වන අතර, එය වියලි සමයේදී 3830 දක්වා පහළ බසියි. භූගත ජල සම්පතද මෙම ධාරිතාව කියුබික් මීටර් 19673 සිට 4730 දක්වා පහළ බසියි.

නුවරඑළිය නගරය තුළත් ඉන් බැහැර අවට කලාපය තුලත් සුවිශේෂ වූ භූදර්ශන සහිත කදු බෑවුම්, පටු කදු මුදුන්, සෘජු හා වටකුරු කදුරු හා මිටියාවත්, බෑවුම් සහිත කදු පාමුල් විහේද සානු හා රුලි මිටියාවත් සහිත නිම්න මෙන්ම තැනිතලා හා දියඇලි වලින් සමන්විත භූමිය මෙම භූදර්ශන තලය තවදුරටත් අලංකාර කරයි. භූමියේ උපරිම උස මිටර් 2100 ක් වන අතර අවම උස මිටර් 1400ක් ලෙස පෙන්වා දිය හැකිය. එසේම අධ්‍යන ප්‍රදේශයේ 25 % ප්‍රමාණයක් මීටර් 2000ට වඩා උස් බිම්වේ.(සිතියම් අංක2 .2/2.3)

06.. ප්‍රදේශයේ භූමි රටාව පිළිබඳව සැලකීමේදී 2012 වසරේදී දත්ත අනුව මුළු භූමි ප්‍රමාණය වන වර්ග

කි.මී 138න් වර්ග කි.මී 76ක් එනම් 55%ක ප්‍රමාණයක් වනාන්තර ගහනයෙන් යුක්ත වේ. මෙම අධ්‍යන ප්‍රදේශය තුළ පාරිසරික තත්වය පිළිබඳව සැලකීමේදී ප්‍රධාන කදු පන්ති වන කිකිළියාමාන, පිදුරුතලාගල, සිංගල් ට්‍රි, හග්ගල කදු සීමාවන් අයත් වන අතර ඉහළම උස මුහුදු මට්ටමේ සිට මීටර් 2400 වන අතර පහළම මට්ටම මීටර් 1500 වේ.

සිතියම් අංක 2.2 - භූ විෂමතාවය



භූ විෂමතාවය 20 m
විසල් නුවරඑළිය සංවර්ධන සැලස්ම

නාගරික සංවර්ධන අධිකාරිය
නුවරඑළිය
2019

නුවරඑළිය නාගරික සංවර්ධන සැලස්ම (2019-2030)

සැකසුම -මදුෂානි

සිතියම් අංක 2.3 - කඳු පන්තීන්



සිතියම් අංක 2.4 - ජල මූලාශ්‍ර



එසේම ප්‍රධාන කඳුපන්තීන් හා වනාන්තර පද්ධතියට සමගාමීව ජල මූලාශ්‍ර පද්ධත්දතියද විශේෂත්වයක් ගනී. ප්‍රධාන ජල මාර්ග ලෙස නානුඔය ඇල හා ඒහි අතුරු ඇල මාර්ග , බැරැක්ප්ලේන් ඇල,කටුමාන ඇල හදුනාගත හැකිවේ.ඒසේම ග්‍රෙගරි වැව,බැරැක් ප්ලේන් වැව.කටුමාන වැව් ද පිහිටා ඇත.මෙම සියළුම ජල මූලිශ්‍ර මහවැලි ගඟේ ජල පෝෂක මූලාශ්‍ර වේ.විසල් සංවර්ධන සැලසුම් කලාපය තුල හෙක්ටයාර 55.5 ප්‍රමාණයක් එනම් මුළු භූමි ප්‍රමානයෙන් 1.08% ක් ජලයේ වැසී ඇත.ප්‍රධාන ජල මාර්ගය වන නානු ඔය ඇල කි.මී.8 පමන දිගින් සමන්විත වන අතර ග්‍රෙගරි වැව හෙක්.90ක් පමන හා බැරැක් ප්ලේන් ජලාශය හෙක්.40 පමන වේ. (සිතියම් අංක 2.4)

05. 2014 වසර දී ඉඩම් පරිහරණ රටාව සිතියම් අංක 2.5 මගින් පෙන්නුම් කෙරේ. ඒ අනුව පිළිවෙලින් වනාත්තර, තේ වතු හා ගෙවතු .ඉඩම් භාවිතයේ ප්‍රධාන අගයක් ගනී.

වගු අංක 2.2 - ඉඩම් භාවිතය

භාවිතය	ප්‍රමාණය (ව.කි.මී)	ප්‍රතිශතය %
කෘෂිකාර්මික	8.542094	16.14
ගෘහස්ත කෘෂිකාර්හක	0.435727	..82
තෘණ භූමි	0.536586	1.01
විවෘත භූමි	0.001245	
ලඳු කාලෑ	0.61077	1.15
වෙනත්	13.323327	25.17
වනාන්තර	18.303947	34.58
හිස් භූමි	.051038	0.1
ජලාශ ගංගා ,ඇලමාර්ග	.570771	1.08
සුසාන භූමි	0.014599	.03
මාර්ග	1.118242	2.11
ගෙවතු	5.419658	10.24
නේවාසික	0.809755	1.58
සංචාරක	0.513177	1
වතු නිවාස	0.396977	0.75
වාණිජ	0.171573	0.32
අධ්‍යාපන	0.155151	0.29
කර්මාන්ත	0.149338	0.28
ආයතන	0.151008	0.29
ක්‍රීඩා භූමි	0.372297	0.7
සෞඛ්‍යය	0.025226	0.05
රජයේ නිවාස	0.11222	0.02
ආගමික ස්ථාන	0.045664	0.09
උද්‍යාන	0.236061	0.44
ඒකතුව	**52.06**	**100**

මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය

සිතියම් අංක 2.5 - ඉඩම් පරිහරණ රටාව 2017



ඉඩම් පරිහරණ රටාව 2017
විසල් නුවරඑළිය සංවර්ධන සැලස්ම

නාගරික සංවර්ධන අධිකාරිය
නුවරඑළිය
2019

නුවරඑළිය නාගරික සංවර්ධන සැලස්ම (2019-2030)

සැකසුම -මදුෂානී

04. නුවරඑළිය නගරය නුවරඑළිය දිස්ත්‍රික්කයේ ප්‍රධාන නගරයේ වන මෙන්ම පරිපාලන නගරය වන අතර ජාත්‍යන්තර වශයෙන් සංචාරක කේන්ද්‍රස්ථානයක් වශයෙන් ද සංවේදි පරිසර පද්ධතියක් හිමි ජාතික වැදගත්කමකින් යුත් ප්‍රදේශයකි.නුවරඑළිය මහ නගර සභා සීමාව තුළ ජනගහනය සම්බන්ධව අධ්‍යනය කිරීමේදි පැරණිම දත්ත ලෙස 1881 දි ජනගහනය 1791 ක් ලෙස නිවාස 264 ලෙස ද වාර්තාවේ. නුවරඑළිය මහ නගර සීමාවේ ජනගහනයේ ප්‍රසාරණය වගු අංක 3.3 මගින් පෙන්නුම් කරයි. කෙසේ වෙතත් විසල් නුවරඑළිය අධ්‍යන සීමාව සඳහා අයත් වන සමස්ත ග්‍රාම නිලධාරී කොට්ඨාශ වල ජනගහන ව්‍යාප්තිය හා ජනගහන වර්ධනය වෙනස් වීම් වගු අංක 2.3 මගින් පෙන්නුම් කෙරේ

වගු අංක 2.3 - නුවරඑළිය මහ නගර සීමාවේ ජනගහනයේ ප්‍රසාරණය

වසර	ජනගහනය	ජනගහනය වර්ධනය	ජනගහන ඝනත්වය	වසර	ජනගහනය	ජනගහනය වර්ධනය	ජනගහන ඝනත්වය
1871	1291			1931	7823	.4	5
1881	1791	1.5	1	1946	10823	2.5	7
1891	2726	5.2	2	1953	14405	4.7	10
1901	5026	8.4	3	1963	15482	.7	10
1911	7406	4.7	5	1971	17880	1.5	11
1921	7525	.76	5	1981	20471	1.8	14

මූලාශ්‍රය - 2004-2018 නුවරඑළිය නගර සංවර්ධන සැලැස්ම

ඒ අනුව පැහැදිලිව පෙනී යනු ලබන්නේ නුවරඑළිය මහ නගර සභා සීමාව තුළ සමස්තයක් ලෙස ජනගහන වර්ධනය 2002 ට සාපෙක්ෂව 2012 දි සෘණ අගයක් ගන්නා අතර 2017 දි එම අගය තරමක් දුරට (-0.035) දක්වා අඩු වී ඇත.

වගු අංක 2.4 - අධ්‍යයන සීමාවේ ජනගහනයේ ප්‍රසාරණය

	පළාත් පාලන බල ප්‍රදේශය	ග්‍රාම නිලධාරී කොට්ඨාශ	කොට්ඨාශ අංකය	ජනගහනය (2002)	ජනගහනය (2012)	2012 ජනගහන වර්ධනය	ජනගහනය (2017)	2017 ජනගහන වර්ධනය 2002ට සාපේක්ෂව
1	නුවරඑළිය මහ	බඹරකැලේ	535K	3557	3143	-1.23	3340	-0.42
2		හාවාඑළිය නැගෙනහිර	535H	2337	2273	-0.24	2416	0.24
3		හාවාඑළිය උතුර	535G	2686	2216	-1.94	2355	-0.88
4		හාවාඑළිය බටහිර	535F	1888	2072	0.93	2202	1.03
5		කලුකැලේ	535B	1131	1093	-0.35	1162	0.18
6		කැලේගාල	535C	1874	1829	-0.25	1944	0.24
7		මාගස්තොට	535A	1578	1408	-0.75	1496	-0.10
8		නුවරඑළිය	535	1878	1290	-3.69	1371	-2.08
9		නුවරඑළිය මධ්‍යම	535D	4712	4292	-0.93	4561	-0.22
10		නුවරඑළිය බටහිර	535L	4540	2481	-0.24	4637	0.24
11		සඳතැන්න	535E	2803	2816	0	2993	0.43
12		කලාපුර	535N	3210	3465	0.77	3682	0.92

13	නුවරඑළිය ප්‍රදේශීය සභා	බංගලාහත	476C	3166	3333	0.5	3542	0.75
14		බුලුඇල	535I	1674	1751	0.4	18691	0.70
15		කොන්කෝඩියා	534F	3552	3758	0.56	3994	0.78
16		ගල්පාලම	534A	1223	1272	0.39	1299	0.04
17		ගොරඩිහෙල	478	1409	1352	-0.42	1432	0.13
18		ජයලංකා	534B	1428	1431	0.02	1521	0.42
19		කනදපොල	534	1619	1426	-1.27	1515	-0.45
20		කදපොල මධ්‍යම	534C	2546	2853	1.14	3032	1.17
21		කදපොල E	534D	956	887	-.75	943	-0.10
22		මීපිලිමාන	476H	1895	2012	0.6	2138	0.80
23		මිහිදුපුර	476G	1237	1226	-0.09	2303	0.35
24		පාර්ක්	534P	4485	4463	-0.05	4743	0.37
25		පීඩෘ	534H	3110	3316	.0.64	3524	0.82
26		රුවන් එළිය	476D	2676	2972	1.05	3158	1.11
27		සීතාඑළිය	478A	1534	1815	1.69	1929	1.53
28		ශාන්තිපුර	535M	1319	1408	0.65	1496	0.84
29		ටොප්පාස්	535J	2567	2757	0.71	2930	
30		වින්ඩිකෝනර්	476E	1613	1667	0.33	1672	1.62
		එකතුව		77364	98467		102451	

මූලාශ්‍රය - ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව

විශේෂයෙන් බඹරකැලේ (-1.23) හාවාඑළිය බටහිර (-1.91) හා නුවරඑළිය (-3.65) යන ග්‍රාම නිලධාරී වසම් වල කැපී පෙනෙන ලෙස ජනගහන වර්ධනය සෘණ අගයක් 2012 දි 2002ට සාපෙක්ෂව පෙන්නුම් කරයි. කෙසේ සමස්ත සෘණ ජනගහන වර්ධන වේගය 2017 දි තරමක් දුරට සමනය විම සිදුවි ඇති අතර හාවාඑළිය නැගෙනහිර, හාවාඑළිය බටහිර, කලාපුර, කළුකැලේ, කැලේගාල, නුවරඑළිය බටහිර හා සදතැන්න යන ග්‍රාම නිලධාරි වසම් වල ජනගහන වර්ධන වේගය ධන අගයක් බවට පත් වී ඇත. නමුත් හාවාඑළිය නැගෙනහිර, නුවරඑළිය, බඹරකැලේ, නුවරඑළිය මධ්‍යම යන වසම් වල තවදුරටත් ජනගහන වර්ධන වේගය සෘණ අගයක් ලෙස 2017 දි පෙන්නුම් කරයි. විශේෂයෙන් මෙම ප්‍රදේශ වල ඉඩම් නේවාසික භාවිතයන් සංචාරක හා වාණිජ භාවිතයන් සදහා වෙනස් වීම මෙම තත්වයට බලපා ඇත. සමස්තයක් ගත් කල නුවරඑළිය මහ නගර සභා සීමාව තුළ 2012 ට සාපෙක්ෂව 2017 දි ජනගහන වර්ධනය සෘණ අගය 0.0353 දක්වා අඩු වී ඇත.

කෙසේ වෙතත් විසල් නුවරඑළිය සංවර්ධන සැලැස්ම සකස් කිරීම සඳහා පාදක කරගනු ලබන නුවරඑළිය ප්‍රදේශිය සභා සීමාව තුල වූ ග්‍රාම නිලධාරී වසම් 17 පිළිබඳ සැලකීමේදි මීට වඩා වෙනස් තත්වයක් පෙන්නුම් කරයි. 2002ට සාපෙක්ෂව 2012 දි එම ග්‍රාම නිලධාරී වසම් වලට සැලකිය යුතු ජනගහන වර්ධනයක් පෙන්නුම් කරනු ලබන අතර, සමස්ත ජනගහන වර්ධනය 0.3388ක් වන අතර 2017 දී 0.5955 ලෙස වර්ධනය වී ඇත. 2012 දි මිහිදුපුර, ගොරඩිහෙල, කදපොල, කදපොල නැගෙනහිර යන ග්‍රාම නිලධාරී වසම් වල ජනගහන වර්ධනය සෘන අගයක් ගන්නා අතර අනෙක් ග්‍රාම නිලධාරී වසම් වල ධන අගයක් පෙන්නුම් කරයි. ඒ අතරින් සිතාඑළිය (1.69) කදපොල මධ්‍යම (1.14) රුවන්එළිය (1.05) කැපි පෙනේ. 2017 දි 2002ට සාපෙක්ෂව ජනගහනය සෘණ අගයක් වන්නේ කදපොල හා කදපොල නැගෙනහිර ග්‍රාම නිලධාරී වසම් වල පමණයි.

තවදුරටත් අධ්‍යනය කිරිමේදි පෙනි යන්නේ නුවරඑළිය මහ නගර සභා සීමාවට යාබදව පිහිටි ග්‍රාම නිලධාරී කොට්ඨාශ වල ජනගහන වර්ධනය ධන අගයක් පෙන්නුම් කරන බවයි. නගර සීමාව තුළ නේවාසික වර්ධනය හීන වීමත් යාබද ප්‍රාදේශිය සභා සීමාව තුළ ජනගහන වර්ධනයක් පෙන්නුම් කිරීමත් පෙනී යන්නේ නගරය තුළ සංචාරක හා වාණිජ භාවිතයන් සඳහා වැඩි ඉල්ලුමක් මෙන්ම යාබද ප්‍රදේශයන් සඳහා නේවාසික ඉල්ලීමක් ඇති බවයි. එසේම අධ්‍යන සඳහා තෝරා ගන්නා ලද ග්‍රාම

නිලධාරී වසම් 30 තුළ මුළු ජනගහනය 2017 වසරේදි 72294ක් ලෙස වාර්තා වන අතර එය නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රෙදශයේ මුළු ජනගහනයෙන් 10%ක ආසන්න ප්‍රමාණයක් වේ.අධ්‍යන ප්‍රදේශය

තුළ ජනගහනය 46% ප්‍රමාණයක් සිංහල ද 41% ප්‍රමාණයක් ද්‍රවිඩ ද 6% ප්‍රමාණයක් මුස්ලිම් ද වෙනත් ජාතීන් ලෙස 6% වන අතර මුළු ජනගහනයෙන් 40% ආසන්න ප්‍රමාණයක් වතු ජනතාවද වේ.(රූපසටහන අංක 2.5)

රූපසටහන අංක 2.5- ජාතීන් අනුව ජනගහනය 2012



මූලාශ්‍රය - ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව

05. ජනගහන ඝණත්වය පිළිබඳව සැලකීමේදි ඉහළ ජන ඝණත්වයක් එනම් හෙක්. 1000කට වැඩි ග්‍රාම නිලධාරී වසම්වශයෙන්බඹරකැලේ, ශාන්තිපුර, හාවාඑළියඋතුර, හාවාඑළිය, නැගෙනහිර, කදපොල, කළු කැලේ, හා කදපොල මධ්‍යම යන ග්‍රාම නිලධාරී වසම් වන අතර ඉතා අඩු එනම් හෙක්. 400ට අඩු ජනගහනයක් කදපොල නැගෙනහිර, ටොප්පාස්, පීඩa, ජයලංකා, ගොරඩිහෙල යන ග්‍රාම නිලධාරී වසම් පෙන්නුම් කෙරේ. (සිතියම් අංක 2.6)

සිතියම් අංක 2.6- ජන ඝනත්වය - 2012



06.නිවාස පිළිබඳව සැලකීමේදි 2012වසරේදි ප්‍රදේශයේ නිවාස ඒකක 10784 තුළ පවුල් 11008 වාසය කරනු ලබයි. ඒ අනුව පෙනී යන්නේ 2012 වසර වන විට නිවාස 224ක පවතින බවයි. මේ සඳහා බලපානු ලබන ප්‍රධාන සාධකය වන්නේ අඩු ආදායම්ලාභීන් ජීවත් වීම වතු ආශ්‍රිතව වතු නිවාස වල වැඩි පවුල් ප්‍රමාණයක් ජීවත්වීමයි. මෙයින් කැපී පෙනන ලක්ෂණය වන්නේ 20% පුමානයක් පේලි නිවාස වේ. විශේෂයෙන් වතු සේවක නිවාස මෙම ඝණයට වැටෙන අතර ඉතා අඩු පහසුකම් වලින් යුක්ත වේ. එසේම නිවාස 144 පමන පැල්පත් නිවාස වීමද සැලකිය යුතු කරුණකි.

07.නිවාස ඝනත්වය පිළිබඳව සැලකීමේදී ද නුවර එළිය මහ නගර සීමාවේ ඝනත්වය ඉහල අගයක් ගන්නා බව සිත්යම් අංක 2.7මගින් පෙන්නුම් කෙරේ.

වගු අංක 2.5 - නිවස තත්වය 2012

ග්‍රාම නිලධාරි කොට්ඨාශ	පවුල් සංඛ්‍යාව	නිවාස සංඛ්‍යාව	නිවාස හිඟය	තනි මහල් නිවාස	මහල් 2 නිවාස	මහල් 2ට වඩා වැඩි නිවාස	ඒකාබද්ධ නිවාස	මහල් නිවාස	යුගල නිවාස	පේළි නිවාස	පැල්පත්
බඹරකැලේ	787	773	14	445	78	17	32	1	15	175	10
බංගලාහත	816	799	17	285	50	8	17	0	24	412	3
බුලුඇල	429	415	14	326	37	1	27	0	2	21	1
හාවාඑළිය E	580	561	19	439	51	1	15	0	1	51	3
හාවාඑළිය N	542	537	5	365	58	5	59	0	28	19	3
හාවාඑළිය W	490	488	2	322	67	4	34	4	0	57	0
කලපුර	840	832	8	380	5	0	24	0	13	407	3
කලුකැලේ	289	287	2	265	13	1	0	0	3	0	5
කැලේගාල	453	442	11	231	39	4	19	0	64	85	0
මාගස්තොට	377	373	4	320	28	2	0	4	10	4	5
මීපිලිමාන	537	523	14	498	15	1	7	0	0	2	0
මිහිදුපුර	319	312	7	292	17	0	3	0	0	0	0
නුවරඑළිය	272	264	8	109	54	0	16	5	12	68	0
නුවරඑළිය මධ්‍යම	1017	993	24	625	123	6	63	0	17	137	22
නුවරඑළිය W	578	569	9	198	51	11	57	1	8	232	11
රුවන් එළිය	733	714	19	360	20	0	40	4	22	267	1
සඳතැන්න	683	668	15	318	34	1	3	0	10	230	72
සීතාඑළිය	469	453	16	384	28	9	20	0	2	6	4
ශාන්තිපුර	357	351	6	335	7	0	9	0	0	0	0
වින්ඩිකෝනර්	440	430	10	364	16	0	38	0	0	11	1
එකතුව	11008	10784	224	6861	791	71	483	19	231	2184	144
පවත්නා නිවාස සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස			**2.1**	**63.6**	**7.3**	**0.7**	**4.5**	**0.2**	**2.1**	**20.3**	**1.3**

මූලාශ්‍රය - ජන හා සංඛ්‍යා ලේඛන වාර්තාව 2012

*සිතියම් අංක **2.7** - නිවාස ඝනත්වය - **2012***



මූලාශ්‍රය - ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව

08.ජනගහනය පිරිමිඩය අනුව වගු අංක මගින් පෙන්වා ඇති පරිදි 73%ක ආසන්න ශ්‍රම බලකායක් ප්‍රදේශයේ ඇත. කාන්තා ශ්‍රම බලකායට වඩා පිරිමි ශ්‍රම බලකායක් ඇති බව පෙනෙන අතර, එය මුළු පිරිමි ජනගහනයෙන් 78%ක් වන අතර කාන්තා ප්‍රතිශතය 67%ක් වේ.

*වගු අංක **2.6** - ජනගහන පිරිමීඩය*



09.ප්‍රදේශයේ ශ්‍රම බලාකය අනුයුක්තව ඇති කටයුතු පිළිබඳව සැලකිමේදි 56%ක ප්‍රමාණයක් රැකියා නියුක්ත වන අතර 3%ක ප්‍රමාණයක් රැකියාවියුක්ත තත්වයක පවති. එමෙන්ම 41%ක ප්‍රමාණයක් ඵලදායි ආර්ථික කටයුත්තක නොයෙදෙන්නන් ලෙස 2012 ජන හා සංඛ්‍යා ලේඛන දත්ත අනුව පෙන්වා ඇත.(වගු අංක 2.7)

වගු අංක 2.7 - සේවා නියුක්තිය - 2012



මූලාශ්‍රය - ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව 2012

10. එසේම ශ්‍රම බලකාය නියුක්ත ආර්ථික කාර්යයන් පිළිබඳව සැලකීමේදි (වගු අංක 2.6) බංගලාහත, කලාපුර, මිපිළිමාන, සදතැන්න, රුවන්එළිය, සීතාඑළිය යන ග්‍රාම නිලධාරී කොට්ඨාශ වල 40%ක ආසන්න සේවානියුක්තියක් කෘෂිකර්ම ක්ෂේත්‍රයේදි නුවරඑළිය මධ්‍යම නුවරඑළිය නැගෙනහිර, නුවරඑළිය බටහිර, හාවාඑළිය බටහිර, හාවාඑළිය නැගෙනහිර හා බඹරකැලේ යන ග්‍රාම නිලධාරී වසම් වල වැඩි සේවා නියුක්තියක් සංචාරක හා මුල්‍ය සේවා අංශයේද නියුක්ත බව පෙන්නුම් කෙරේ. සමස්තයක් ලෙස නුවරඑළිය මහ නගර සභා බල ප්‍රදේශය තුළ සංචාරක හා සේවා අංශ වල රැකියා නියුක්තියක් ඇති අතර නුවරඑළිය ප්‍රාදේශිය සභා සීමාව තුළ ඇති ග්‍රාම නිලධාරී වසම් වල වැඩි කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ රැකියා නියුක්තියක් පෙන්නුම් කෙරේ. සමස්තයක් ලෙස 25% ආසන්න ප්‍රමාණයක් කෘෂිකාර්මාන්තයෙන් ද 18%ක ප්‍රමාණයක් හා 14%ක ප්‍රමාණයක සේවා නියුක්තියක් සංචාරක හා සේවා අංශයේ ඇති බව පෙනේ.

*ප්‍රස්ථාර අංක **2.6** - සේවා නියුක්තිය අංශයන් අනුව - **2012***



මූලාශ්‍රය - ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව

11. නුවරඑළිය මහ නගර සීමාවේදී පානීය ජලය බෙදා හැරීම නුවරඑළිය මහ නගර සභාව මගින් සිදුකරනු ලැබේ. ජල සම්බන්ධතා 6977ක් (නේවාසික හා වාණිජ) මුළු ජනගහනයේ 35000ක් පමණ පානීය ජලය බෙදාහරිනු ලබයි. නේවාසික ඒකක 3950, වාණිජ 411 ගෘහ නොවන 950 ක ආයතන හා වෙනස් ලෙස 245 ලෙස සම්බන්ධතා ලබා දී ඇත. දෛනික ඝන මීටර් 4500ක පමණ අවශ්‍යතාවයක් පවතින අතර ඉන් 72% නේවාසිකද 18% වාණිජ හා සංචාරක බැවින්ද රජයේ හා පෞද්ගලික ආයතන හා සඳහා 10%ක් ලෙසද සපයනු ලබයි.

මෙම සියලු ජල සැපයුම් ජල පෝෂක ලෙස ස්වභාවකි ජල බැල්පත් 9ක් මගින් ජලය ලබා ගන්නා අතර එම ජලය ගබඩා ජලාශ 15ක් මගින් කලාප 7ක් මගින් ආවරණය කර බෙදා හරිනු ලැබේ. එසේම වියලි කාළගුණ තත්වය යටතේ ඇතිවන ජල හිගය සඳහා නළ ළිං 9ක් මගින් අමතර ජල අවශ්‍යතාවය ආවරණය කරනු ලබයි. වියලි සමයේදී ප්‍රධාන ජල මූලාශ්‍ර මගින් සපයනු ලබන්නේ ඝණ මීටර් 3500ක ප්‍රමාණයක් බැවින් නල ළිං මගින් අමතර ජල අවශ්‍යතාවය වන ඝණ මීටර් 1000ක සැපයුමක් සපයනු ලබයි.

මින් සම්පූර්ණ ජල අවශ්‍ය තාවය 70%ක් පමණ හැඩන්හිල් කලාප වන අතර ප්‍රධාන ජල මූලාශ්‍ර වශයෙන් පීඩa හා ටොප්පාස් ජල උල්පත් කටයුතු කරනු ලැබේ. නගරයේ නගරයේ ප්‍රධාන නේවාසික/සංචාරක හා වාණිජ කලාප මෙමගින් ආවරණය කරනු ලබන අතර ප්‍රධාන ගබඩා ටැංකි 5කින් යුක්ත වේ.

එසේම ලවස්ලිප් හා ලෝවර් ඒරියා කලාප මගින් හාවාඑළිය මගින්ද රෝහල අවට ප්‍රදේශය ආවරණය කරනු ලබන අතර දිනකට ඝන මීටර් 1750ක් පමණ සපයනු ලබයි.
ප්‍රධාන නේවාසික හා වැසි ජන ගහණත්වයක් ඇති හා ප්‍රධාන රෝහල පිහිටා ඇති කලාපය සඳහා මෙම ජල පෝෂකය මගින් සපයනු කරනු ලැබේ.
කෙසේ වෙතත් මෙම කලාප වියලි සමයේදී එනම් ජනවාරි - අප්‍රේල් කාලවලදී ධාරිතාව පමන 900 අඩු වන බැවින්H1, H2, H3, H4 නල ලිං මගින්ද ජලය ලබා ගෙන බෙදා හැරේ.

කෙසේ වෙතත් වියලි කාල සීමාවලදී එනම් දෙසැම්බර් - අප්‍රේල් කාල සීමාවලදී ජල මූලාශ්‍රවල ධාරිතාව දෛනිකව 3500ක් දක්වා අඩුවන අතර දෛනික ජල ඉල්ලුම 5500ක් පමණ දක්වා වැඩි වේ. මේ සඳහා දෙසැම්බර් සහ අප්‍රේල් මාස වල සංචාරක ආගමනය වැඩි වීමත් සමග ඇති වන ඉල්ලුමද මේ තත්ත්වයට බලපානු ලබයි.

නුවරඑළිය ප්‍රාදේශිය සභාවට අයත්වන රුවන්පුර, මිපිලිමාන, කටුමාන හා බ්ලැක්ෆුල්, ශාන්තිපුර ප්‍රදේශය සඳහා වෙන වෙනම ප්‍රාදේශිය හා ග්‍රාමීය ජල සැපයුම් පද්ධති ක්‍රියාත්මක වන අතර ඒ සඳහා නුවරඑළිය ප්‍රාදේශිය සභාව මගින් විධිමත්ව මැදිහත්වීමක් නොමැත.

සිතියම් අංක 2.8 - පානීය ජල මූලාශ්‍ර



පානීය ජල මූලාශ්‍ර
විසල් නුවරඑළිය සංවර්ධන සැලසම්

නාගරික සංවර්ධන අධිකාරිය
නුවරඑළිය
2019

නුවරඑළිය නාගරික සංවර්ධන සැලසම් (2019-2030)

සැකසුම -මදුෂානී

12. අධ්‍යාපන තත්වය පිලිබඳ සැලකීමේදී අනෙක් ප්‍රදේශන් වලට සාපෙක්ෂව සාමාන්‍ය පෙළ හා උසස් පෙළ සමත් ප්‍රතිශතය අඩු අගයක් ගනී. අ.පො.ස සා.පෙළ ප්‍රතිඵල වල සාමාන්‍යය- වර්ධනයක් පෙන්නුම් කරත් සමත්**වීමේ** සාමාන්‍ය 50% පමණ වේ. විසල් නුවරඑළිය සංවර්ධන කලාපය තුල ප්‍රාථමික හා ද්විතික අධ්‍යාපන මට්ටම දිස්ත්‍රික්කයේ අනෙක් කලාප සමග සංසන්දය කිරීමේදී පහල අගයක් ගනි. 2016 වසරේදී ජාතික වශයෙන් අ.පො.ස (සාපෙළ) සමත් ප්‍රතිශතය 71%ක් ලෙස හා උසස්පෙළ සමත් ප්‍රතිශතය 70%ක් ලෙස පැවතියද මෙම කලාපයේ එය පිලිවෙලින් 53% ක් හා 35% අගයක් ගනී. මෙම කලාපයේ පාසල් 14 පවතින අතර ලමුන් 8600පමණ අධ්‍යාපනය ලබයි අ.පො.ස(සා.උ.පෙළ) .

වගු අංක 2.8 - අධ්‍යයාපන තත්වය, අ.පො.ස (ස.පෙළ)

අ.පොස.සා.පෙළ ප්‍රතිඵල වල සාමාන්‍යය-						
ප්‍රතිඵළ සාමාන්‍යය	2011	2012	2013	2014	2015	2016
සිංහල මාධ්‍ය	42	34	40	45	51	54
ද්‍රවිඩ මාධ්‍ය	34	25	16	56	32	52
මාධ්‍ය දෙකේම සාමාන්‍යය	38	30	28	51	42	53

මූලාශ්‍රය - කලාප අධ්‍යාපන කාර්යාලය ,නුවරඑළිය

වගු අංක 2.9 - අධ්‍යයාපන තත්වය අ.පො.ස (උ.පෙළ)

අ.පොස.උ.පෙළ ප්‍රතිඵල වල සාමාන්‍යය					
විස්තරය	වර්ෂය				
ප්‍රතිඵළ සාමාන්‍යය	2012	2013	2014	2015	2016
සිංහල මාධ්‍ය	33	27	34	35	38
ද්‍රවිඩ මාධ්‍ය	62	42	50	36	32
මාධ්‍ය දෙකේම සාමාන්‍යය	48	34	42	36	35

මූලාශ්‍රය - කලාප අධ්‍යාපන කාර්යාලය ,නුවරඑළිය

රූපසටහන අංක 2.8 - අ.පො.ස උ.පෙ. සාමාන්‍යය



මූලාශ්‍රය - කලාප අධ්‍යාපන කාර්යාලය ,නුවරඑළිය

2.3 සංවර්ධන සැලසුම් සීමාව තීරණය කිරීම

පරිච්ඡේද 3.1 මගින් දක්වා ඇති පරිදි අධ්‍යන ප්‍රදේශය සමස්ථ ග්‍රාම නිලධාරී වසම් 30 පිළිබඳව සලකා බැලීමේදි සැලසුම් සකස් කල යුතු ප්‍රදේශය හඳුනා ගැනීම සඳහා පවත්නා පරිපාලන සීමා මායිම භූගෝලීය ලක්ෂණ අනුව සීමා මායිම හා ප්‍රදේශයේ ආර්ථික සාමාජීය හා පාරිසරික පිළිබඳව අධ්‍යනය කරමින් තීරණය කරනු ලබන ක්‍රියාකාරි සීමා මායිම පිළිබඳව අධ්‍යනය කරන ලදි.

1. පරිපාලන සීමා මායිමපරිපාලන සීමාව ලෙස නුවරඑළිය මහ නගර සභා සීමාව හඳුනා ගන්නා ලදි. දැනට පවත්නා 2004-2017 නුවරඑළිය නගර සංවර්ධන සැලැස්ම ද ක්‍රියාත්මකව පවතින්නේ මෙම සීමාවට වේ. මෙම සීමාව තුළ ග්‍රාම නිලධාරී වසම් 12කින් සමන්විත වේ.

සිතියම් අංක 2.9 - නුවරඑළිය මහ නගර සීමාව



2. භෞතික සීමා මායිමප්‍රදේශයේ භෞතික පරිසරය අනුව නුවරඑළිය මහ නගර සභාව හා ඒ ආශ්‍රිත ප්‍රදේශය භෞතික වශයෙන් ප්‍රධාන කදු පන්තින් 06ක් මගින් සීමාව තීරණය කර ඇත. ඒ අනුව පිදුරුතලාගල, සිංගල් ට්‍රී, කිකිළියාමාන, හග්ගල වන අතර ඒ ආශ්‍රිත වනාන්ත ද භෞතික මායිම ලෙස ගත හැකිය. ඒ අනුව සිතියම් අංක 2.10 අනුව ටොප්පාස්, කලාපුර, බංගලාහත, වින්ඩකෝනර්, රුවන්එළිය, ගොරඩිහෙල, ජයලංකා, පීඩa ග්‍රාම නිලධාරී වසම් වල කොටස් ලෙස මෙම වනාන්තර පද්ධතින් වල මායිම පිහිටා ඇත.

සිතියම් අංක 2.10 - භෞතික සීමාව



3. ක්‍රියාකාරී සීමා මායිම

සැලසුම්මය දෘශ්ටි කෝණය අනුව වඩාත් ප්‍රවණතාවයක් ඇති හා යෝග්‍ය සැලසුම් ප්‍රදේශ හඳුනා ගැනීම සඳහා විස්තරාත්මක අධ්‍යයනයක් කරන ලදි. ඒ සඳහා වගු අංක 2.8 මගින් පෙන්වා ඇතා නිර්නායක භාවිතා කරමින් එම නිර්නායක අනුව බර තැබීම් යොදා බහු විධ නිර්නායක විශ්ලේෂණය(ඇමුණුම් 2) මගින් වඩාත් සංවර්ධන උපනතින් මෙන්ම පරිසර සංවේදිතාවය ආරක්ෂා කල යුතු ප්‍රදේශ ලෙස වගු අංක 2.9 මගින් ප්‍රදේශ හඳුනා ගන්නා ලදි.යථෝක්ත සිමාව පාදක ග්‍රාම නිලධාරි වසම් 30 අතුරින් සංවර්ධන සැලැස්ම සඳහා වඩාත් උචිත ප්‍රදේශය හඳුනාගැනීම සිදු කරන ලදි. ඒ අනුව මේ සඳහා සලකා බලනු ලබන දර්ශක හඳුනා ගන්නා ලදි. මෙම දර්ශක තිරණය කිරීමේදී හා නුවරඑළිය නගරය හා ආශ්‍රිතව පිහිටීම හා පාරිසරික සමතුලිකතාව මෙන්ම සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම පිළිබඳව සලකා බලන ලදි.

ඒ අනුව යෝජිත සංවර්ධන සැලැසුම් ප්‍රදේශය තීරණය කිරීම සඳහා පාදක කරගන්නා ලද දර්ශක හා ඒවා බර තැබීම් පහත වගු මගින් පෙන්නුම් කෙරේ.

වගු අංක 2.10 - පාදක කරගන්නා ලද දර්ශක

	දර්ශකය	ස්ථානය	බර තැබීම
01	සංවර්ධන හෝටල්/ලැගුම්හල් ප්‍රමාණය	1	10
02	ගොඩනැගිලි තත්වය	2	9
03	ජල මූලාශ්‍රය/ජලපද්ධතින්	2	9
04	වන ගහන අඩුවීමේ ප්‍රවණතාව	2	8
05	සංචාරක ආකර්ශන ප්‍රමුඛතාව	3	7
06	අපරව්‍යුහ පහසුකම්	4	6
07	ජනගහන ඝණත්වය	5	5
08	ආපදා කලාප පිහිටීම	6	4
09	සංවර්ධන උපනතීන්(සංවර්ධන බලපත්‍ර හා අනුමත කිරීම)	7	3
10	වාර්ෂික ජනගහන වර්ධන අනුපාතය	8	2
11	සේවාවන් වල ඝණත්වය	9	1

ඒ අනුව උක්ත බර තැබීම් භාවතා කරමින් බහුවිධ නිර්නායක විශ්ලේෂණය මගින් වඩාත් සංවර්ධනය සඳහා යොමු වී ඇති හා සංවර්ධන උපනෙතින් වැඩි මෙන්ම පාරිසරික සංවේදිතාවය ආරක්ෂා කල යුතු ග්‍රාම නිලධාරි කොට්ටාශ 2 ක් සංවර්ධන සැලසුම් ප්‍රදේශ ලෙස හඳුනාගන්නා ලදි. ඒ අනුව පහත සඳහන් ග්‍රාම නිලධාරි වසම් නව සංවර්ධන සැලසුම් ප්‍රදේශයට යටත්වේ.



*සිතියම් අංක **2.11**- සැලසුම් ප්‍රදේශය*



සැලසුම් ප්‍රදේශය
විසල් නුවරඑළිය සංවර්ධන සැලස්ම

නාගරික සංවර්ධන අධිකාරිය
නුවරඑළිය
2019

නුවරඑළිය නාගරික සංවර්ධන සැලස්ම (2019-2030)

සැකසුම -මදුෂානී

මෙම අධ්‍යන ප්‍රදේශය තුළ පාරිසරික තත්වය පිළිබඳව සැලකීමේදි ප්‍රධාන කදු පන්ති වන කිකිළියාමාන, පිදුරුතලාගල, සිංගල් ට්‍රි, හග්ගල කදු සීමාවන් අයත් වන අතර ඉහළම උස මුහුදු මට්ටමේ සිට මීටර් 2400 වන අතර පහළම මට්ටම මීටර් 1500 වේ. එසේම ප්‍රධාන ජල මාර්ග වශයෙන් නානුඔය ඇල, බැරැක්ප්ලේන් ඇල සීමාව තුළ පිහිටා ඇති අතර ඒවා මහවැලි ගඟේ ජල පෝෂක ගංගාවේ.

ඒ අනුව යමින් 2019-2030 විසල් නුවරඑළිය සංවර්ධන සැලැස්ම සකස් කිරීම සඳහා වඩාත් උචිත හා සැලසුම්මය දෘශ්ටි කෝණයෙන් සලකා බැලීමේදි ක්‍රියාකාරී සීමා මායිම සුදුසු බව හැගි යයි. කෙසේ වෙතත් මෙම ක්‍රියාකාරී සීමා මායිම තුළ සැලසුම් සකස් කිරීම, බලාත්මක කිරීම හා පසු විපරම් කිරීම පහසුව තකා ඊට ආසන්න ග්‍රාම නිලධාරී සිමා මායිම සැලසුම් සීමාව ලෙස සලකා බලනු ලැබේ. ඒ අනුව 2019-2030 විසල් නුවරඑළිය සංවර්ධන සැලැස්ම සඳහා පාදක කර ගනු ලබන ග්‍රාම නිලධාරී වසම් පහත වගු අංක 2.10 පෙන්නුම් කෙරේ.

වගු අංක 2.10 සංවර්ධන සැලසුම් බලප්‍රදේශය

	ග්‍රාම නිලධාරි කොට්ඨාශ	කොට්ඨාශ අංකය
1	බඹරකැලේ	535K
2	බංගලාහත	476C
3	බුලුඇල	535I
4	හාවාඑළිය E	535H
5	හාවාඑළිය N	535G
6	හාවාඑළිය W	535F
7	කලාපුර	535N
8	කලුකැලේ	535B
9	කැලේගාල	535C
10	මාගස්තොට	535A
11	මීපිලිමාන	476H
12	මිහිදුපුර	476G
13	නුවරඑළිය	535
14	නුවරඑළිය මධ්‍යම	535D
15	නුවරඑළිය W	535L
16	රුවන් එළිය	476D
17	සඳතැන්න	535E
18	සීතාඑළිය	478A
19	ශාන්තිපුර	535M
20	ටොප්පාස්	535J
21	වින්ඩිකොනර්	476E

පරිච්ඡේදය 03

සංවර්ධන සැලැස්මක අවශ්‍යතාව



3.සංවර්ධන සැලැසුම් අවශ්‍යතාවය

වර්තමානයේ සංවර්ධන නගරයක අවශ්‍යතාවය පිළිබඳව මෙම පරිච්ඡේදය මගින් සලකා බලනු ලැබේ. විශේෂයෙන් ඉහල උන්නතාංශයක පිහිටි සංවේදී පරිසරික පද්ධතියක් හිමි නුවරඑළිය නගරය ඒ ආශ්‍රිත ප්‍රදේශය තුල සංවර්ධන ඉලක්කය සපුරාගනිමින් පාරිසරික සුන්දරත්වය හා පාරිසරික සංවේදීතාව ආරක්ෂා කරගනිමින් බෙහෙවින් සිරුමාරුවට සිදුකලයුතු කරුණක් වේ.

1. ඒ අනුව මුලිකව ප්‍රදේශයේ සදහා සංවර්ධන සැලැස්මක අවශ්‍යතාව පිළිබඳව සැලකීමේදී වර්තමානයේ නුවරඑළිය නගර සීමාව සදහා නාගරික සංවර්ධන අධිකාරිය මගින් ප්‍රකාශිත සංවර්ධන සැලැස්ම 2018 වසරේදී අවසන් වේ.
2. එසේම වර්තමාන සංවර්ධන උපනතින් හා සංවර්ධන ඉල්ලුම් පිළිබඳව සලකා බැලීමේදී නුවරඑළිය නාගරික බල ප්‍රදේශයෙන් බාහිරටද විහිදිමද ප්‍රධාන සාධයක් ලෙස ගත හැකිය. ඉහත පරිච්ඡේද 03 මගින් නව සංවර්ධන ඉපුලුම් නුවරඑළිය නගර සීමාවට ඔබ්බෙන් පෙන්නුම් කරයි.
3. පවත්නා සංවර්ධන සැලැස්ම මගින් මෙම පරිච්ඡේදය මගින් හඳුනාගන්නා ලද ආකාරය දුර්වලතා සදහා විසදුමක් නොවීම හා ඉදිරි සංවර්ධන අභියෝගයන්ට නිවරදි මගපෙන්වීමක් ඒ තුළින් නොලැබීම.
4. විශේෂයෙන් හඳුනාගන්නා ලද ප්‍රධාන ගැටලු රාශියක් ප්‍රදේශියේ උද්ගතව පැවතීම.

3.1 ගැටලු හඳුනා ගැනීම



ප්‍රදේශයේ පවත්නා ගැටලු පිළිබඳව හැදෑරීමේදී ප්‍රධාන වශයෙන් අංශ 06ක් මගින් තොරතුරු ලබාගෙන ඒවා සම්පීඩනය කරන ලදි. ඉහත සටහන මගින් පෙන්නුම් කරන ආකාරයට විවිධ පැතිකඩ මගින් මෙම මූලික තොරුතුරු ආශ්‍රිතව පවත්නා ගැටලු පිළිබඳ අධ්‍යයනයක් සිදු කරන ලදි.

විශේෂයෙන් 2017.12.17 දින නුවරඑළිය මහ නගර සභා ශාලාවේදී පැවති සම්පත් දායක සමුළුවේදී හඳුනා ගන්නා ලද මූලික ගැටලු මෙන්ම විවිධ පැතිකඩ මගින් විවිධ ආයතන හා පුද්ගලයන් මගින් මූලිකවම ගැටලු 16ක් හඳුනාගන්නා ලද අතර ඉන් ප්‍රධාන ගැටලු 06ක් මූලික කර ගන්නා ලදි.

ඒඅනුව,

01. සංවේදී භූමි ආක්‍රමණය

02. පානීය ජල දූෂණය

03. ජල මූලාශ්‍ර පද්ධතියේ දූෂණය

04. ජල මූලාශ්‍ර හා ජල පෝෂක ප්‍රදේශ ආක්‍රමණ

05. මාර්ග වල පහසුකම් ප්‍රමාණවත් නොවීම

06. වියලිකාලයේදී ජලය හිඟකම

07. නුවරඑළිය පිළිබඳව පිළිඹඹිබුවන චිත්ත රූපය වෙනස්වීම

08. දර්ශන තල ආවරණය වන ආකාරයට ගොඩනැගිලි ඉදිකිරීම

09. වන ගහනය අඩුවීම

10. ඉඩම් පරිහරණය වෙන් වීම

11. මල අපවහන ජල මූලාශ්‍රවලට මුසු වීම

12. සංචාරකයින් සදහා මූලික සම්පත් හීනවීම

13. නුවරඑළියට අවේනික ගෘහනිර්මාණ ලක්ෂණ වෙන් වීම

14. නගර අලංකරණය අඩුවීම

15. පදික ධාවනය /ඇවිදීමේ පහසුකම් ප්‍රවණතාවය අඩුවීම



විවිධ වූ ගැටලු හඳුනාගන්නා ලද ඉහත විවිධ වූ ගැටලු අතුරින් ප්‍රධාන ගැටලු 06ක් යටතේ ශීර්ෂ ගත කරන ලදි.

3.1.1.ගැටලු ප්‍රමුඛතාකරණය

01. නුවරඑළිය පිළිබඳව මානසික චිත්‍රය (image) (පිළිඹිබුව වෙනස් වීම.)

02. ජල මූලාශ්‍ර හා ප්‍රමාණවත් බව හා ගුණාත්මක බව හීන වීම.

03. රජයේ ඉඩම් නිසි සංවර්ධනයක් සදහා යොමු නොවීම.

04. සංචාරක පහසුකම් අවම වීම.

05. පැල්පත් හා මුඩුක්කු

06. පොදු මාර්ගවල පහසුකම් අවමවීම

3.2. මූලික ගැටලු පිළිබඳව විස්තරාත්මක අධ්‍යයනය

3.2.1. නුවරඑළිය පිළිබඳව ඇති පිළිබිඹු/චිත්තරූපය වෙනස් වීම.

ප්‍රවීන නගර සැලසුම් විද්‍යාඥ කෙවින් ලින්චින් ද ඉමේජ් ඔෆ් ද සිටි ග්‍රන්ථයට අනුව නගරයක පිළිබිඹුව හෙවත් මානසික චිත්‍රරූපය (image)වශයෙන් එකී නගරය හෝ ප්‍රදේශය පිළිබඳව පුද්ගලයකුගේ මනස තුල තැන්පත්ව ඇති දැක්ම,මතකය හා සිතුවිල්ල අර්ථ ගැන්විය හැකිය. එසේම භෞතික පරිසරය, හා එහි අංගෝපාංග පුද්ගලයකුගේ මනසේ තැන්පත් වන මානසික චිත්තරූපය කෙරෙහි බෙහෙවින් බලපායි.

ඒ අනුව අති සුන්දර වූ සංවේදී පාරිසරික පද්ධතියක් හිමි, නුවරඑළිය පිළිබඳව දේස් විදෙස් පුද්ගලයකුගේ මනස තුල තැන්පත්ව ඇති නුවරඑලියට ආවේනික වූ භෞතික හා පාරිසරික ලක්ෂණ කිහිපයක් වේ.

- ඉහල උන්නතාංශ පද්ධතින්
- සීතල හා වර්ෂාව සහිත පරිසරය.
- ස්වභාවික භූ අලංකරණ ලක්ෂන (ආවේනික භාවය) මල් වර්ග, දියඇලි, පිරිසිදු ජල මූලාශ්‍ර)
- යටත් විජිත සමයේ පැවති ගෘහ නිර්මාණ ලක්ෂණ
- උඩරට එළවලු වගාව.
- පෙයාර්ස් හා ස්ටෝබෙරි වගාව
- තේ වගාව

එහෙත් වර්තමානයේ ප්‍රධාන වශයෙන් මානව ක්‍රියාකාරකම් හේතුවෙන් මෙම නුවරඑළිය පිළිබඳව පවතින පිළිඹිබුතාව/මානසික විග්‍රහය හීන වී ඇත. එනම් නුවරඑළියට ආවේනික උක්ත සංකල්ප හා ගති ලක්ෂන හීනවීමෙන්, විනාශයට පත් වෙමින් පවති. විශේෂයෙන් ඉඩම් ආක්‍රමණය, මතුපිට ජල මූලාශ්‍ර, අපිරිසිදු වීම, දර්ශන තල ගොඩනැගිලි වලින් ආවරණය වීම, ගෘහ නිර්මාණ ලක්ෂන වෙනස්වීම, සංවේදිව භූ දර්ශනය විනාශවීම., ඉඩම් පරිහරණය වෙනස් වීම, වනගහනය අඩුවීම, ජල මූලාශ්‍ර වල ඉඩම් ආක්‍රමණය ඉදිකිරීම් මගින් දියඇලි වැසී යාම, එකී හේතු රාශියක් මගින් මූලිකවම නුවරඑළිය පිළිබඳව පුද්ගලයකු පිලිඹිබුව වෙනස් වී ඇත. මේ හේතුවෙන් යම් පුද්ගලයකු තුල නුවරඑළිය කෙරෙහි ඇති මානසික විග්‍රහය

හා ඇල්ම(image) අඩුවීම ඒ කෙරෙහි පවතින ආකර්ශනය මෙන්ම සංචාරක ආර්ථිකයට හානිදායක වීමට බලපානු ලැබේ. අවසානයේ ආර්ථික හානියක් දක්වාම නිර්මාණය වීමේ අවධානය පවති. මෙහි ඇමුණුම් 03 මගින් පෙන්වන බලපෑම් හා ප්‍රතිඵල විශ්ලේණය මගින් වඩාත් හොදින් දැනගත හැකිය.

- භූ දර්ශන පත අවහිර වීම

නුවරඑළිය ආවේනික කඳු පන්තින් මෙන්ම තේ වතු වල හා දියඇලි වල භූදර්ශනය අවහිර වන ආකාරයට නව ගොඩනැගිලි ඉදිවීම හේතුවෙන් නගරයේ සංචාරය කරනු ලබන පුද්ගලයන්හට ආවේනික දර්ශන තල වල දර්ශනයක් නොවීම හේතුවෙන් නුවරඑළිය පිළිබඳව පුද්ලයන්තුල ඇති යට කී පිළිඹිබුව / මානසික චින්තනය නොමැතිවීමට ගැටලුවක් වේ. විශේෂයෙන් මාගස්තොට කඳු පන්තිය, නේස්බි වතුයාය, සින්ගල් ට්‍රී කඳු පංතිය, යුනික්විව් කඳු පන්තිය, පිදුරුතලාගල කඳු පන්තිය, ග්ලෙන්ෆෝල් දිය ඇල්ල, ලවර්ස්ලිප් දිය ඇලි වල දර්ශන තල නව උස ගොඩනැගිලි හේතුවෙන් අවහිර වී ඇති බව ඇමුණුම් 4 මගින් පෙන්වන දර්ශන තල විශ්ලේෂනය මගින් පෙන්වා ඇත.

රූපසටහන 3.1 අවිධිමත් ඉදිකිරීම් තුළින් කඳු පන්තින් වල ස්වභාවික දර්ශන තල අවහිර වීම



ග්‍රහනය - නිලන්ත පරනගම 2017,අගෝස්තු

ජල මූලාශ්‍ර ආශ්‍රිතව ආක්‍රමණ හා අනවසර වගාව හේතුවෙන් දිය ඇලි පෝෂක සිදි ඇත. ඒ අනුව ප්‍රධාන දිය ඇල්ලක් වන ග්ලේන්ෆෝල් ඇල්ලේ ක්‍රියාකාරීත්වය දක්නට නොමැත

රූපසටහන 3.2 දිය ඇලි සිදී යෑම



තිස්වසරකට පෙර 'මරාදැමූ' නුවරඑළියේ ග්ලේන්

By [illegible] // 2017 අගෝ 20 වන ඉරිදා Facebook Twitter Google+ බැලුවෝ - 1624

ඉංග්‍රීසින් විසින් 1828 දී ඇරඹූ නුවරඑළිය පාරිසරික පාරාදීසයක් බව දෙස් විදෙස් කාගේත් මතයයි. එහෙත් අද මේම සොඳුරු පාරාදීසය දින දින මහත් අර්බුදයකට යමින් පවතී. ගෙවුණු දශක 04ක පමණ කාලයක සිට නුවරඑළිය හැඩකළ සුන්දර පාරිසරික වටපිටාවට විශාල බලපෑම් එල්ලවී ඇත. එදා අප දුටු සුන්දර නුවරඑළිය අද දැක ගත නොහැකි බව නුවරඑළියට එන යන අයගේද මතයයි. ඊට විවිධ හේතු පදනම්වී ඇති බව නොරහසකි.

මේවන් වූ පරිසරයක් තුළ නගරයට සුන්දරත්වය එක්කළ ග්ලෙන් නුවරඑළිය නගරයේ සියලුම වැසියන් බලා සිටියදී මිය යෑම පිළිබඳව අද දවසේදී කතාබහක් කළ යුතු තැනකට පත්ව ඇත.

1828 දී නුවරඑළිය නගරයක් බවට පරිවර්තනය කර සර් එඩ්වඩ් බාන්ස් ආණ්ඩුකාරවරයාගේ කාර්ය මණ්ඩලය ඔහුගේ නිල නිවාසයට යාබද ප්‍රදේශයක පදිංචිවී සිටි බවට ඕනෑතරම් තොරතුරු එකතු කළ හැක. එම නිවාස පද්ධතියට ඉහළින් මීටර් 60 - 70ක් පමණ උසැති දර්ශනීය දිය ඇල්ලක් ඇදහැළී ඇත. එම දිය ඇල්ලට ග්ලෙන් යන නාමය ආදේශ වී ඇත්තේ බාන්ස් ආණ්ඩුකාරවරයාගේ කාර්ය මණ්ඩලයේ කාගේ හෝ නමක් විය හැක. එහෙත් අද මේම දිය ඇල්ල දකින්න නොහැක. නමුත්, ග්ලෙන් ෆෝල් යන නමින් මාවතක්ද එම මාවත ඔස්සේ ග්ලෙන් ෆෝල්



අන්තර්ජාලය ඇසුරෙන්

ග්‍රහණය - නිලන්ත පරනගම ,2017 මාර්තු

මේ අනුව පෙනී යන්නේ නුවරඑළියට අවේනික වූ කදු පන්තින් හා දියඇලි වල දර්ශන තල අවිධිමත් මනුෂ්‍ය ක්‍රියාකාරකම් හේතුවෙන් අවහිරවී ඇති බවයි. මෙය නුවරඑළියට අවේනික වූ පිළිඹිබුව වෙනස් වීමට ප්‍රධාන වශයෙන් බලපා ඇත.

- ජල පෝෂක ප්‍රදේශ ආක්‍රමනය

නුවරළියට ආවේනික ජල මූලාශ්‍ර හා ජල නල පද්ධතින්ගේ රක්ෂිත කොටස් ආක්‍රමණය කිරීම හේතුවෙන් තව දුරටත් ප්‍රධාන ජල මූලාශ්‍ර අවහිරවීම මෙන්ම එහි පවිත්‍රතාවටද ගැටලුවක් පවති. නුවරඑළිය පිළිබඳව ඇති පිරිසිදු ජල මූලාශ්‍ර පිලිබඳ පිලිඹිඹුව(image) මෙහි දක්නට නොලැබී ඇත.

ඒ අනුව සිතියම් අංක 3.1 මගින් ප්‍රධාන ගැටළුවල ආක්‍රමණය පෙන්නුම් කරන අතර බඹරකැලේ, හාවාඑළිය නැගෙනහිර, හාවාඑළිය බටහිර, හාවාඑළිය උතුර, බුලු ඇල, නුවරඑළිය බටහිර, නුවරඑළිය මධ්‍යම,

සඳතැන්න, රුවන්එළිය, වින්ඩිකෝනර්, නුවරඑළිය යන ග්‍රාමනිලධාරී කොට්ඨාශවල මෙම ජලමූලාශ්‍ර ආක්‍රමණය බහුල වශයෙන් ඇති අතර එය මුලු ඉඩම් ප්‍රමාණයෙන් 5%ක ආසන්න ප්‍රමාණයක් වේ.

සිතියම් අංක 3.1- ජල මූලාශ්‍ර ආක්‍රමණය



නාගරික සං.අ.-නුවරඑළිය

- වනගහන අඩුවීම

  නුවරඑළිය පිළිබඳව ප්‍රධාන වශයෙන් ස්වභාවික වනාන්තර හා ඒ ආශ්‍රිත කඳු පන්තින් ප්‍රධාන වේ. එහෙත් නුවරඑළිය ප්‍රදේශයේ ඉහල කඳු ආශ්‍රිත වනාන්තර ගහනය 2010 සිට 2017 වන විට 15%කින් පහත වැටීඇත.

  එනම් 2010 දී 40% ක්ව තිබූ වනාන්තර ගහනය 2017 දී 34%ක් ලෙස අඩු වී ඇත. මේ අනුව වනගහනය අඩුවීමත්, ඒ තුලින් හරිත කඳුපන්තින් වල දර්ශන අවම වීමටත් තුලින් නුවරඑළිය පිළිබඳව ප්‍රතිරූපය (image) වෙනස් වී ඇත.

සිතියම් අංක 3.2 - 2010 - වනාන්තර ගහනය (40% ව.කි.මී 55.1)



ඉඩම් පරිහරණ රටාව
විසල් නුවරඑළිය සංවර්ධන සැලස්ම

නාගරික සංවර්ධන අධිකාරිය
නුවරඑළිය
2019

නුවරඑළිය නාගරික සංවර්ධන සැලසුම (2019-2030) සැකසුම -මදුෂානි

සිතියම් අංක 3.3 2017 - වනාන්තර ගහනය 34% ව.කි.මී 46.92



2017 - වනාන්තර ගහනය
විසල් නුවරඑළිය සංවර්ධන සැලස්ම

නාගරික සංවර්ධන අධිකාරිය
නුවරඑළිය
2019

නුවරඑළිය නාගරික සංවර්ධන සැලසුම (2019-2030) සැකසුම -මදුෂානි

- නුවරඑළියට අවේනික ගෘහ නිර්මාණ ශිල්පීය ලක්ෂණ වෙනස් වීම

බ්‍රිතාන්‍ය යුගයේ සිට නුවරඑළිය ප්‍රදේශයේ ඉදිකිරීම් වල දක්නට ලැබුණුයේ වික්ටෝරියානු, ජෝර්ජියානු, ගෘහ නිර්මාණ ලක්ෂණ මිශ්‍ර වූ ගොඩනැගිලි වන අතර මෑත යුගයේ එකී ආවේනික ගෘහ නිර්මාණ ශිල්පීය ලක්ෂණ උල්ලංඝනය කරමින් විවිධ වූ හා මිශ්‍ර වූ නිර්මාණ භාවිතා කිරීම හේතුවෙන් ආවේනික ගොඩනැගිලි වෙනුවට වෙනත් ආකාරයේ ගොඩනැගිලි ඉදිකරමින් පවති. මෙය නුවරඑළිය පිළිබඳව ඇති පිළිඹිබුව හා ආකර්ෂණය හීන වීමට තවත් කරුණක් වී ඇත.

රූපසටහන 3.3 ගෘහනිර්මාණ ලක්ෂණ වෙනස් වීම



ග්‍රහනය - නිලන්ත පරණගම ,මාර්තු 2017

3.2.2 ජල මූලාශ්‍ර වල පවතින ප්‍රමාණාත්මක හා ගුණාත්මක භාවය අඩුවීම

ලංකාවේ ඉහලම පිහිටි සංවේදී පරිසර පද්ධතින් පිහිටි වනාන්තර හා ඒ ආශ්‍රිත ජල මූලාශ්‍ර පද්ධතිය ප්‍රධාන වශයෙන් නගරයේ හදවත බදු ග්‍රෙගරි වැව, නානුඔය ඇල, තලගල ඇල, වෝටර් ෆීල්ඩ් ඩ්‍රයිව්, බැරක් ප්ලේන්ඇල, ග්ලේන්ෆෝල් ඇල, කන්දේඇල, බුලුඇල, ප්‍රධාන වේ. මෙම ජල මූලාශ්‍ර අපවිත්‍රවීම කොටස් දෙකකට බෙදා වෙන් කල හැකිය.

01. පානිය ජලය අපවිත්‍ර වීම.
02. මතුපිට ජල මූලාශ්‍ර, ජල වගා පද්ධති අපවිත්‍ර වීම.



01. ජල මුලාශ්‍ර වල ජලය අපවිත්‍ර වීම.

ග්‍රෙගරි වැවේ ජලයේ ගුණාත්මකභාවය පිළිබඳව නුවරඑළිය මහ නගර සභාව මගින් කරන ලද පරීක්ෂනයේ දී තහවුරු වූ දත්තයන් වගු අංක 03 මගින් පෙන්නුම් කෙරේ.

වගු අංක 3.1 ග්‍රෙගරි වැවේ ජලයේ තත්වය

Test	Unit	Method		Results					L.O.D	E.U % (K=2)
			SLS 614: 2013	Lake Gregory Inlet	Lake Gregory Mid-Point	Lake Gregory near the School	Lake Gregory near the Bridge	Lake Gregory near the Sluice		
Odour	-	CML 1		Objec *	Objec *	Objec *	Objec *	Objec *	-	-
# Turbidity	NTU	APHA 213 0 B	2	118	222	94.6	50.4	121	-	20
# pH at 25° C	-	APHA 4500 – H^+ B	6.5-8.5	7.62	8.21	8.26	8.22	8.32	-	-
# Chioride (as Cl)	Mg/L	APHA 4500 Cl - B	250	22	22	22	22	22	-	4
# Total Alkanlinity (as $CaCO_3$)	Mg/L	APHA 2320 B	200	43	46	47	43	46	-	4
Free Ammonia (as NH_3)	Mg/L	SLS 614 : 2013, Appendix A	0.06	2.4	2.4	2.0	1.6	2.4	-	-
Albuminoid Ammonia ((as NH_3)	Mg/L	SLS 614 : 2013 Appendix A	0.15	2.8	1.8	0.80	2.4	2.0	-	-
Nitrare (as NH_3)	Mg/L	CML /MM/02/02/019/V 1.2	50	5.0	5.0	4.8	5.3	4.8	-	-
# Nitrite (as NH_2)	Mg/L	APHA 4500- NO_2B	3	0.11	0.09	0.20	0.06	0.04	-	14
# Fluoride (as F)	Mg/L	APHA 4500-F C	1.0	0.37	0.36	0.36	0.50	0.36	-	6
# Total Phosphates (as PO_4)	Mg/L	APHA 4500 – P B & C	2.0	1.4	1.5	1.1	1.4	1.3	-	10
# Total Dissovled Soilds	Mg/L	APHA 2540 C	500	140	101	146	130	131	-	5
# Total Hardness (as $CaCo_3$)	Mg/L	APHA 2340 C	250	45	49	51	45	44	-	4
Sulfate (as SO_4)	Mg/L	Modified APHA 4500 SO_4 ^{2}E	250	ND	ND	16	ND	ND	10	-
Calcium (as Ca)	Mg/L	APHA 3500 Ca- D	100	14.5	15.7	18.9	15.1	14.9	-	-
Magnesium (as Mg)	Mg/L	APHA 2340 C & 3500 Ca - D	30	2.0	2.4	3.4	1.8	1.7	-	-
Cyanide (as CN)	Mg/L	CML 18	0.05	ND	ND	ND	ND	ND	0.05	-
Sodium (as Na)	Mg/L		200	9	9	8	9	8	-	-
Iron (as Fe)	Mg/L		0.3	0.75	0.46	0.66	0.80	0.50	-	-
Copper (as Cu)	Mg/L		1.0	ND	ND	ND	ND	ND	0.05	-
Manganese (as Mn)	Mg/L		0.1	0.08	0.08	0.11	0.11	0.10	-	-
Zinc (as Zn)	Mg/L		3.0	0.03	ND	ND	ND	ND	0.02	-
Aluminum (as Al)	Mg/L		0.2	0.84	0.65	0.94	0.91	0.53	-	-
Chromium (as Cr)	Mg/L		0.05	ND	ND	ND	ND	ND	0.05	-
Nickel (as Ni)	Mg/L	USEPA -200.8	0.02	ND	ND	ND	ND	ND	0.01	-
Arsenic (as As)	Mg/L		0.01	ND	ND	ND	ND	ND	0.001	-
Cadmium (as Cd)	Mg/L		0.003	ND	ND	ND	ND	ND	0.001	-
Lead (as Pb)	Mg/L		0.01	ND	ND	ND	ND	ND	0.01	-
Selenium (as Se)	Mg/L		0.01	ND	ND	ND	ND	ND	0.001	-
Mercury (as Hg)	Mg/L		0.001	ND	ND	ND	ND	ND	0.001	-
# COD	Mg/L	Modified APHA 5220 D	10	110	110	85	100	105	-	4
Phenolic compounds (as C_6H_5OH)	Mg/L	APHA 5530 B & D	0.001	ND	ND	ND	ND	ND	0.1	
Oil & Grease	Mg/L	APHA 5520 B	0.2	ND	ND	ND	ND	ND	2	-

මූලාශ්‍රය - නුවර එළිය මහ නගර සභාව

ඒ අනුව ග්‍රෙගරි වැවේ ස්ථාන 5න ජල සාම්පල් අනුව එම ස්ථානවල ජලයේ තිබිය යුතු නියමිත තත්වයන් වලට වඩා ඉක්මවා ඇති බව පැහැදිලි වේ.

එසේ වගු අංක ඇමුණුම් 3 මගින් පෙන්වා ඇති ග්‍රෙගරි වැවේ, කටුමාන ඇලේහා බැරැක් ප්ලේන් ජලාශයේ ජලයේ තත්වය පිළිබඳව වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් කරන ලද පරීක්ෂාවේදී එකී ස්ථානවල ජල වල තත්වය පෙන්නුම් කෙරේ. 2017 හා 2016 වසරවල අඛන්ඩව මෙම ජලයේ අපවිත්‍රතාව වර්ධනය වී ඇති බව පැහැදිලිව පෙනේ. විශේෂයෙන් 2017 දී ග්‍රෙගරි වැවේ COD,BOD,DO,COLIFERM ,PH ප්‍රමාණයක් නියමිත සාන්ද්‍රනයට වඩා වැඩි පෙන්නුම් කෙරේ.

එසේම කටුමාන වැවේ හා කටුමාන ජලය පිටවීමේදීද බැරැක් ප්ලේන් ජලාශයේ 2016 වසරට වඩා 2017 වසරේදී ජල පැවතිය යුතු සාන්ද්‍රණය ප්‍රොස්පරස් අගය වැඩි වී ඇත.

එසේම කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හිටපු අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය සරත් අමරසිරි විසින් ඉදිරිපත් කර ඇති පර්යේෂණ නිබන්ධනය අනුව නුවරඑළිය ප්‍රදේශයේ ගොවීන් තම වගාව සඳහා පොහොර වගා ප්‍රමාණයට වඩා 8ගුණයක් ගෙවන බවත් මෙයින් වැඩි ප්‍රමාණයක් පොස්පරස් බවත් හඳුනාගෙන ඇත. එසේම එකි නිබන්දන අනුව පරිහරනය කරනලද සාම්පල් 1600 අතරින් 50%ක ප්‍රමාණයක් සාම්පල් වල පොස්පරස් අන්තර්ගහනය වැඩි වී ඇති බව හඳුනාගෙන ඇත.

එමෙන්ම වාරිමාර්ග දෙපාර්තමේන්තුව පරීක්ෂණ මගින් මෙම ජලය දූෂණය වීම හා එහි වැඩී වීමට මූලිකවම බලපා ඇති බව පෙන්වා ඇත්තේ වගාවට යොදන පොහොර හා කෘමිනාශක ජලයට මුසුවීමයි.

එසේම නගරයේ වාණිජ,සංචාරක හා නේවාසික කටයුතු වලින් බැහැර කරනුලබන අප ජලය,මළ අපවහන සෘජුව ජල මූලාශ්‍ර වලට මුසුවීමෙන්ද මෙමෙ ස්වාවික ජල පද්ධතිය දූෂණයට හේතු වී ඇත.

02. පානීය ජලය ගුණාත්මක භාවය හා ප්‍රමාණාත්මක භාවය අඩු වීම

විශේෂයෙන් ජල පෝෂිත ප්‍රදේශයක් වුවද නුවරඑළිය ප්‍රදේශයේ වියලි කාලයේදී පානීය ජලයේ හිගතාවය මෙන්ම පිරිසිදු පානිය ජලය මහජනතාවට නොලැබීමද ප්‍රධාන ගැටළුවක් වී ඇත.

නුවරඑළිය මහ නගර සභා සීමාව සඳහා ප්‍රධාන වශයෙන් ජල සැපයුම සිදුකරන්නේ නුවරඑළිය මහ නගර සභාව මගිනි. නුවරඑළිය මහ නගර සභා සිමාව සඳහා කලාප 7 මගින් ජලය බෙදාහරිනු ලබන අතර 75% පමණ පානීය ජලය (කි.මී.3350) බෙදාහරිනු ලබන්නේ හැඩන්හිල් පොම්පාගාරය මගිනි.

රූපසටහන් 3.4 ජල බෙදාහැරීම් කලාප



මූලාශ්‍රය - නු.එ.ම.න.ස.



සමස්ථ ජල සැපයුම වියලි සමයේදී කි.මී.3500 දක්වා පහත බසින අතර ඉල්ලුම කි.මී.5500 දක්වා ඉහල යන් ලබයි.ස්වභාවික ජල මූලාශ්‍ර වල ජල සැපයුම අඩුවීම මෙන්ම වියලි සමයේ සංචාරක ආගමනය වැඩිවීමත් කෘෂිකර්මාන්ත බාවිතය සදහා නළ ජලය යොදාගැනීමත් හේතුවෙන් ඉල්ලුම වැඩිවී ඇත.මෙම සමයේ නගරයේ පිහිටුවා ඇති නල ලිං 9 මගින් සැපයනු ලැබේ.

මේ අතර 2017 වසරේදි නුවරඑළිය මහ නගර සභාව මගින් කරන ලද ජල සාම්පල් පරීක්ෂාවේදි තෝරා ගනු ලැබූ ස්ථාන 19ක ජල සාම්පල් පරීක්ෂාවේදි ස්ථාන 12කම කොලිෆෝම් බැක්ටීරියා ප්‍රතිශතය ඉහළ අගයක් ගන්නා බව හඳුනාගන්නා ලදි. (වගු අංක 3.2)

*වගු අංක **3.2** - පානීය ජලයේ තත්වය*

සාම්පල් ලබාගත් ස්ථාන	මුළු කොලිපෝන් බැක්ටිරියා සෙන්ටිග්‍රේට් 35 දී (මි.ලි.100)	මුළු කොලිපෝන් බැක්ටිරියා සෙන්ටිග්‍රේට් 44 දී (මි.ලි.100)
පීඩaa	38	4
ටොප්පාස්	68	10
හෙවන් සෙවන් හොටෙල්	10	0
ගැමුණු මාවත තැපැල් පෙට්ටි හන්දිය	72	8
පීඩaa ජල ටැංකිය අසල	52	2
කාර්මික විද්‍යාලය	0	0
හැඩන්හිල් පොම්පාගාරය	0	0
නානුඔය පාර කදිරේෂන් කෝව්ලි අසල	12	0
හැඩන්හිල් ජල පොම්පාගාරය	48	0
ග්‍රෙගරි වැව අදියර 111	4	0
ඒ.එල්.ඒ.පී උදයකාන්ත මයා, කලුකැලේ	0	0
හිමලුව හෝටලය, මාගස්තොට	38	8
සඳතැන්න වීදියේ එළවළු වතුයාය	18	2
විජිතපුර වීදියේ සන්හිල් කඩය	10	0
මාගස්තොට	0	0
බදුල්ල පාර	60	14
නුවරඑළිය ලේඩිමැක්ලම් පාර, වජිරඥාන විද්‍යාලය	368	240
නුවරපාර, බඹරකැලේ	120	54
නුවරඑළිය නගරසභා කාර්යාලය.	710	480

මූලාශ්‍රය - නුවර එළිය මහ නගර.සභාව 2017

මෙම අගය පානීය ජලයේ තිබිය යුතු සම්මත කොලිෆෝම් ප්‍රමාණය ඉක්ම යාමකි. කොලිෆෝම් ප්‍රමාණය ඉක්ම යාමට හේතුව වී ඇත්තේ පානීය ජලය සඳහා මලපවාහන මිශ්‍ර වීමයි.

එසේම පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි අංශයේ එච්.පී හේනගම, එන්.ඩී.කේ දයාවංශ, සාලින්ද සිල්වා කරන ලද නිබන්ධන වාර්තාවෙන් පෙන්වා ඇත්තේ ද නුවරඑළිය ප්‍රාදේශිය සභාව හා මහ නගර සීමාව තුළ පිහිටි නිවාස 50ක නියැදි සමීක්ෂණයේදි 55%ක අධික පානීය ජලය ලබා ගන්නා ළිං පිහිටා ඇත්තේ ගොවිබිම් ආශ්‍රිතවයි. (ඇමුණුම් 4 මගින් ඒ ඒ ග්‍රාම නිලධාරී මට්ටමෙන් ජලය ලබා ගන්නා මූලාශ්‍ර පිළිබඳව තොරතුරු දැක්වේ.)

ඒ අනුව නුවරඑළිය මහ නගර සභා සීමාව තුළ පිහිටි පවුල් වලින් 70%කට ආසන්න ප්‍රමාණයක් ජල නල මගින් ද නුවරඑළිය ප්‍රාදේශිය සභා සීමාව තුළ පිහිටි පවුල් වලින් 70%ක ප්‍රමාණයක් ළිං මගින් ද ජලය සපයා ගනු ලබන බවයි.

මේ අතර සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් කරන පරීක්ෂණය අනුව ශ්‍රී ලංකාවේ පාචනය රෝගය වැලදීමේ ප්‍රවණතාවයේ 04 වන ස්ථානය නුවරඑළියට හිමි වී ඇති බවයි. (ඇමුණුම් 05) එසේම ශ්‍රී ලංකාවේ මානව සංවර්ධන වාර්තාව 2012 අනුව ආරක්ෂිත පානීය ජලය අඩුම ස්ථානය නුවරඑළිය බව පෙන්වා ඇත. (ඇමුණුම් 6)

3.2.3.සංචාරක පහසුකම් ප්‍රමාණවත් නොවීම

ප්‍රධාන සංචාරක ආකර්ෂණීය නගරයක් ලෙස නුවරඑළිය හඳුනා ගත හැක. විශේෂයෙන් පාරිසරික සංචාරක කටයුතු සඳහා මනා පාරිසරික සංවේදි කලාපයක් පිහිටා තිබීම හා ශ්‍රී ලංකාවේ අනෙකුත් ප්‍රදේශ වලට සාපෙක්ෂව සීත හා සෞම්‍ය දේශගුණයක් තිබීම මේ සඳහා ඉවහල් වේ.

කෙසේ වෙතත් ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයින් සලකා බැලීමේදි 2016 වසරේදි මිලියන 02ක් පමණ වන අතර, 2016 වසරේ සංචාරක මණ්ඩල ප්‍රගති වාර්තාව අනුව ඉන් 6%ක සංචාරකයින් ප්‍රමාණයක් මධ්‍යම කඳුකරයේ සංචාරය කරනු ලබයි.

එසේම ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයින් අතරින් වැඩිම ප්‍රමාණයක් විනෝදාස්වාද කටයුතු සඳහා පැමිණෙන සංචාරකයින් වේ. එය 2016 වසරේදි 23% , 2015 දී 66%ක් ලෙස දැක්වේ.

කෙසේ වෙතත් නුවරඑළිය පැමිණෙන දේශිය හා විදේශිය සංචාරකයින් පිළිබඳ සලකා බැලීමේදි නිශ්චිත සංචාරකයින් ප්‍රමාණයක් ගණන කර නොමැත. නමුත් සංචාරක ආකර්ෂණය වැඩි ස්ථාන වල දත්ත උපයෝගී කර ගෙන නුවරඑළිය පැමිණෙන සංචාරක ප්‍රමාණය පිළිබඳව නිගමනයකට එළඹිය හැකිය.

ඒ අනුව වඩාත් සංචාරක ආකර්ෂණීය ස්ථාන ලෙස හග්ගල උද්‍යානය, හෝර්ටන් තැන්න, ග්‍රෙගරි උද්‍යානය, වික්ටෝරියා උද්‍යානය, ගැල්වේස් උද්‍යානය, සඳහා සංචාරකයින්ගේ පැමිණීම වගු අංක 3.3 මගින් පෙන්නුම් කෙරේ.



වගු අංක 3.3 - සංචාරක ආගමනය

	2012	2013	2014	2015	2016
විදේශීය සංචාරකයින්					
හග්ගල	12489	14713	18071	24188	29192
හෝර්ටන්තැන්න	39123	34065	69979	87962	**131670**
ගැල්වේස්	82	29	84	49	198
ග්‍රෙගරි උද්‍යානය					61622
වික්ටෝරියා උද්‍යානය					47294
සඳතැන්න					8673
දේශීය සංචාරකයින්					
හග්ගල	587749	511879	578825	742133	**956815**
හෝර්ටන්තැන්න	184744	46511	198374	228858	319999
ගැල්වේස්	1521	1084	1669	2047	3345
ග්‍රෙගරි උද්‍යානය					**721495**
වික්ටෝරියා උද්‍යානය					643725

මූලාශ්‍රය - සංචාරක සංවර්ධන අධිකාරිය 2017

මේ අනුව නුවරඑළියට පැමිණෙන සංචාරකයින්ගේ ප්‍රමාණය දළ වශයෙන් 2016 වසරේ දී දේශීය 950,000 හා විදේශීය 135,000 වන අතර වර්තමානයේ නුවරඑළිය ප්‍රදේශයේ පවතින පහසුකම් මෙම සංචාරකයින් සඳහා හා ඉදිරියේ සංචාරක ප්‍රවර්ධන කටයුතු සඳහා ප්‍රමාණවත් නොවීම ගැටළු තත්වයකි.

සංචාරක හෝටල් කාමර ප්‍රමාණය 1800 පමන වන අතර සාමාන්‍ය සංචාරක රාත්‍රී ගනන දින 02 ක් වේ. මෙම සංචාරකයින් උදෙසා පවතින පහසුකම් පිලිබඳව අධ්‍යනයක් සිදුකරන ලදී.

විශේෂයෙන් සංචාරක අපරවියුහ පහසුකම් හා සේවාවන් කොටස් 04කට වෙන් කල හැකිය. එනම්,

භෞතික සම්පත්	සංස්කෘතික හා විශේෂාංග	සේවා	පරිපාලන හා නීති
හෝටල්, ආපනශාලා, නවාතැන් ස්ථාන, ප්‍රවාහන, සන්නිවේදන පහසුකම්, ජලය , විදුලිය, උද්‍යාන, සනිපාරක්ෂක පහසුකම්	සංස්කෘතික හා උත්සව කටයුතු, ඓතිහාසික ලක්ෂණ හා ස්මාරක, සංගීත, නැටුම් ගැයුම්	බැංකු, රක්ෂණ, මාර්ගොපදේශය, සංචාරකයින් නියෝජිතයින්	නීති, පරිපාලන රෙගුලාසි, රෙගු හා ආගමන හා විගණන නීති

මේ අනුව නුවරඑළිය නාගරික සංවර්ධන අධිකාරිය මගින් 2017 අගෝස්තු කරන ලද සමීක්ෂණයට අනුව සංචාරකයින්ගේ පහසුකම් පිළිබඳව හා අඩුපාඩු පිළිබඳව තොරතුරු ලබාගන්නාලදී. ඒ අනුව පොදුවේ ගත් කල සංචාරකයින්ගේ අපරවියුහ පහසුකම් නුවරඑළිය නගරය තුළ අවම මට්ටමේ පවති.

පවතින සංචාරක අපරව්‍යුහ පහසුකම් පිළිබඳ සංචාරකයින් මගින්ම(ඇමුණුම් 5) පෙන්වා ඇති අතර, එමගින් ඔවුන්ගේ භෞතික හා අනෙකුත් අපරව්‍යුහ පහසුකම් හිඟතාවයක් ඇති බව පෙනවයි. මෙය සංචාරක ක්ෂේත්‍රයේ ප්‍රගමනයට බාධාවක් වෙයි.

3.2.4.අඩු පහසුකම් නිවාස සහ පැල්පත්

නුවරඑළිය නගර සීමාව තුළ හා ඉන් පිටත ඇති නිවාස අතරින් 20%ක ප්‍රමාණයක් ඒකාබද්ධ නිවාස පේලී නිවාස හා ලයින් නිවාස වලින් සමන්විත වේ. විශේෂයෙන් විසල් නුවරඑළිය සංවර්ධන සැලැස්ම පාදක කරනු ලබන ග්‍රාම නිළධාරි වසම් 21 තුළ නිවාස තත්වය හා එහි පදිංචි පවුල් සංඛ්‍යාව පිළිබඳ පහත වගු අංක මගින් පෙන්නුම් කෙරේ. මීට අමතරව නුවරඑළිය මහ නගර සභා සීමාව තුල අඩු පැල්පත් නිවාස 590ක් තුල පවුල් 638ක් හා ජනඝගහනය 3331ක් වාසය කරනු ලබයි. මෙය නුවරඑළිය මහ නගරසභා සීමාවේ ජනගහනයෙන් 7.5%ක ප්‍රමාණයක් වේ . එසේම ප්‍රදේශයේ දරද්‍රතා මට්ටම සැලකිමේදී බඹරකැලේ බංගලාහත, හාවාඑළිය නැගෙනහිර කලාපුර, රුවන්එළිය, සීතාඑළිය හා ශාන්තපුර ග්‍රාම නිලධාරි වසම් වල අඩු තත්වයෙන් යුතු නිවාස හා ඒ අනුව ඉහල දරද්‍රතා මට්ටමෙන් පෙන්නුම් කරනු ලබයි. සිතියම් අංක හා වගු අංක මෙය සංචාරක නගරයක් වන නුවරඑළියේ පිලිඹිබුවට මෙන්ම ආර්ථික සංවර්ධනයටද බාධාවක් වී ඇත

*වගු අංක **3.4** නිවාස වල තත්වය*

ග්‍රාම නිලධාරි කොට්ඨාශ	පවුල් සංඛ්‍යාව	නිවාස සංඛ්‍යාව	නිවාස හිඟය	තනි මහල් නිවාස	මහල් 2 නිවාස	මහල් 2ට වැඩි නිවාස	ඒකාබද්ධ නිවාස	මහල් නිවාස	යුගල නිවාස	පේලි නිවාස	පැල්පත්
එකතුව	11008	10784	224	6861	791	71	483	19	231	2184	144
පවත්නා නිවාස සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස			**2.1**	**63.6**	**7.3**	**0.7**	**4.5**	**0.2**	**2.1**	**20.3**	**1.3**

මූලාශ්‍රය - ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව

විසල් නුවරඑළිය සංවර්ධන සැලසුම් කලාපය තුල 21% පමණ නිවාස අඩු ආදායම් ලාභී නිවාස වන අතර මෙම නිවාස පැල්පත්,මුඩුක්කු,පේලි නිවාස හා වතුනිවස වේ.මේ තුල ජනගහනය 5300 පමන වාසය කරයි.එසේම නුවර එළිය මහ නගර සභා සීමාවේ ද පවුල් 630 පමන අඩු පහසුකම් නිවාස වල ජීවත් වෙයි. මේ හේතුව නිසාම ප්‍රදේශයේ දරිද්‍රතා මට්ටමද ඉහල අගයක් ගනී.



වගු අංක 3.5 -මහනගර සීමාව තුල අඩු ආදායම් නිවාස

ස්ථානය	ජනගහනය	පවුල්	නිවාස	ඉඩම් ප්‍රමාණය	ඉඩම් අයිතිය
තුරග තරග පිටිය පාර	240	56	48	1 Arce	ක්‍රීඩා අමාත්‍යාංශය
යුනික්විව්	222	52	33	1.5 Arces	පෞද්ගලික
ජේම්ස් වීදිය	65	15	14	40 Perches	ගෝල්ෆ් සමාජය
නගර සභා ඉඩම්	826	225	120	3 Arces	මහ නගර සභාව
බඹරකැලේ වත්ත	1676	207	306	4 Acres	ඉ.ප්‍ර.බ.ම.
බඹරකැලේ පීඩබ්ඩී නිවාස	166	52	42		N.H.D.A
සමගි උයන (අන්ඩර්බැන්ක්)	49	12	12		ප්‍රදේශිය ලේකම්
ඉහළ වැව පාර	72	19	15		පෞද්ගලික
එකතුව	**3316**	**638**	**590**		

මූලාශ්‍රය - නු.එ.ම.න.ස.

රූපසටහන් 3.5 - අඩුපහසුකම් නිවාස.



ග්‍රහනය - නිලන්ත පරණගම

2017 - මාර්තු

වගු අංක 3.6 - දරිද්‍රතා මට්ටම

ග්‍රාම නිලධාරී වසම	නිවාස තත්ව දර්ශකය	නිවාස තත්වය	දරිද්‍රතා මට්ටම
බඹරකැලේ	-0.71	පහළ	ඉහළ
බංගලාහත	-0.85	පහළ	ඉහළ
බුළුඇල	-0.23	සමාන්‍ය	සමාන්‍ය
හාවාඑළිය - නැගෙනහිර	-0.51	පහළ	ඉහළ
හාවාඑළිය - උතුර	-0.24	සමාන්‍ය	සමාන්‍ය
හාවාඑළිය - බටහිර	0.24	ඉහළ	පහළ
කලාපුර	-0.56	පහළ	ඉහළ
කළුකැලේ	0.45	ඉතා ඉහළ	ඉතා පහළ
කැලේගාල	0.29	ඉහළ	පහළ
මාගස්තොට	-0.38	සමාන්‍ය	සමාන්‍ය
මිපිලිමාන	0.17	ඉහළ	පහළ
මිහින්දුපුර	0.23	ඉහළ	පහළ
නුවරඑළිය මධ්‍යම	0.16	ඉහළ	පහළ
නුවරඑළිය බටහිර	0.13	ඉහළ	පහළ
නුවරඑළිය	0.11	ඉහළ	පහළ
රුවන්එළිය	-0.75	පහළ	ඉහළ
සදතැන්න	-0.17	සමාන්‍ය	සමාන්‍ය
සීතාඑළිය	-0.72	පහළ	ඉහළ
ශාන්තිපුර	-1.04	පහළ	ඉහළ
වින්ඩිකෝනර්	-0.39	සමාන්‍ය	සමාන්‍ය

මූලාශ්‍රය - ජන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව

*සිතියම් අංක **3.4** - දරිද්‍රතා මට්ටම*



දරිද්‍රතා මට්ටම
විසල් නුවරඑළිය සංවර්ධන සැලස්ම

නාගරික සංවර්ධන අධිකාරිය
නුවරඑළිය
2019

නුවරඑළිය නාගරික සංවර්ධන සැලස්ම (2019-2030)

සැකසුම -මදුෂානී

5.මාර්ග වල තත්වය ප්‍රමාණවත් නොවීම.

සංචාරක පුරවරයක් ලෙස නුවරඑළිය හා ඒ අවට පිහිටි මාර්ග වල තත්වය පිළිබඳව අධ්‍යයනය කිරීමේදී එහි ගුණාත්මක භාවය පිළිබඳව නිර්නායක 6ක් අනුව අධ්‍යයනය කරන ලදි. (වගු අංක 3.5) ඒ අනුව සිතියම් අංක මගින් ගුණාත්මක භාවය පිළිබඳ පෙන්නුම් කරන අතර නුවරඑළිය මහ නගර සභා සීමාව තුල මාර්ග පද්ධතිය තුල තරමක ගුණාත්මක භාවය ඇති මුත් ඉන් භාහිර ප්‍රෙද්ශයන්හි මාර්ගවල ගුණාත්මක තත්වය පහල මට්ටමක පවතී. (සිතියම් අංක 3.3.)

නිර්නායක	බර තැබීම්
ප්‍රමාණවත් පළල	6
පදික මාර්ග තිබීම	5
මතු පිට තත්වය	4
ජලය බැස යන කාණු තිබීම	3
පදික ආවරණ	2
විදි රවුම් කිරීම	1

සිතියම් අංක 3.5 - මාර්ග වල තත්වය



මාර්ග වල තත්වය
විසල් නුවරඑළිය සංවර්ධන සැලස්ම

නාගරික සංවර්ධන අධිකාරිය
නුවරඑළිය
2019

නුවරඑළිය නාගරික සංවර්ධන සැලස්ම (2019-2030)

සැකසුම -මදුෂානි

විසල් නුවරඑළිය සංවර්ධන සැලැස්ම

2019 - 2028

II කොටස



ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය

නුවරඑළිය මහ නගර සභාව සහ නුවරඑළිය ප්‍රාදේශීය සභාව (කොටසක්) බල ප්‍රදේශයන්ගෙන් සමන්විත වන නුවරඑළිය නාගරික සංවර්ධන ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක වන මම, 1982 අංක 4 දරණ පනතෙන් සංශෝධිත 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 8ඊ වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2019 ජූලි මස 09 වන දින නාගරික සංවර්ධන අධිකාරියේ කළමණාකරන මණ්ඩලය විසින් කරන ලද නිර්දේශයන් සැලකිල්ලට ගෙන නුවරඑළිය මහ නගර සභාව සහ නුවරඑළිය ප්‍රාදේශීය සභාව (කොටසක්) බල ප්‍රදේශයන්ගෙන් සංයුක්ත වන නුවරඑළිය නාගරික සංවර්ධන ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම මෙයින් අනුමත කරමි.

.....

පාඨලී චම්පික රණවක,

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය.

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය,

17 හා 18 වන මහල,

"සුහුරුපාය",

සුභූතිපුර පාර,

බත්තරමුල්ල.

2019 අගෝස්තු මස 01 වන දින.

පරිච්ඡේදය 4

සැලසුම් හැටිය



4.1.විසල් නුවරඑළිය 2018 – 2028 ඉදිරි දැක්ම

නුවරඑළිය නගරයේ ඉදිරි වසර 10 තුළ සකස් විය යුතු ආකාරය පිළිබඳව පිළිඹුබ කිරීම සඳහා එහි දැක්ම බෙහෙවින් උපකාරී වේ. ඒ අනුව දැක්ම තීරණය කර ගැනීම සඳහා ඉහතින් විස්තර කරන ලද ගැටළු පිළිබඳවත් නුවරඑළියට ආවේනික පාරිසරික සාධක හා විභවතා පිළිබඳව සලකා බැලිය යුතුවේ. එමෙන්ම නුවරඑළිය නගරය භාවිතා කරන සංචාරකයින් පදිංචිකරුවන් සේවා සපයන්නන් වෙළඳුන් සේවා සැපීයම සඳහා ඒකාරාශි වී ඇති රාජ්‍ය ආයතන හා එහි සේවකයින් කොටස් කරුවන් ලෙස සැලකිලි මත් විය යුතුයි.

මේ සියල්ල සලකා ඉදිරි දැක්ම වශයෙන්



4.2. දැක්ම හැඳින්වීම

මිහිදුම් කඳුකරයේ (Misty hills) - යන්නෙන් නුවරඑළියට ආවේනික හා නුවරඑළියට පමණක් සීමාවූ දේශගුණික / කාලගුණික නම්‍යතාවයන් පිළිබඳව සැලකිල්ලට ගනිමින් ද

පාරාදීසය (Paradise) - නුවරඑළියට අවේනික පාරිසරික හා ඉදිකිරීම් පරිසරය ආරක්ෂා කර ගනිමින් තිරසාර සංවර්ධන ඉලක්ක පෙරටු කර ගනිමින් සියළු පාර්ශවයන්ට උපරිම උපයෝගිතාවයෙන් යුක්තව ජීවත් වීමට, සංචරණයට සුදුසු ප්‍රදේශයක් ලෙස පත් කිරීම

4.3.අරමුණු (Goals)

ඉහත දැක්ම උදෙසා ප්‍රධාන ඉලක්කයන් 03ක් හඳුනා ගනු ලැබේ.

01. පවතින පරිසර පද්ධතිය ආරක්ෂා කරමින් පිරිසිදු ජල මූලාශ පද්ධතියක්

Preserve the natural environment and improve the water quality

02. නුවරඑළියට අවේනික ගති ලක්ෂණ මුර්තිමත් කිරීම

Imaging Unique Context of NuwaraEliya.

03. දිදුලන ඉසුරුමත් පුරවරයක් Creating vibrant wealthy town

4.4.පරමාර්ථ (Objectives)

01.පවතින පරිසර පද්ධතිය ආරක්ෂා කරමින් පිරිසිදු ජල මුලාශ පද්ධතියක්

Preserve the natural environment and improve the water quality

1. 2028 වන විට නේවාසික ජනගහනය 60000ක් හා දෛනික සාමාන්‍ය සංචාරක ආගමනය 24,000ක් සඳහා දෛනික ජල ධාරිතාව කියුබික් මීටර් 9500ක් ඉලක්ක කර ගත් පිරිසිදු පානිය ජලය සැපයීම
2. ග්‍රෙගරි වැවේ, නානුඔය ඇලෙහි හා අනෙකුත් ජල මුලාශ්‍ර වල ජලයේ තත්වය මධ්‍යම පරිසර අධිකාරියේ අනුමත සීමාව වන PH-6.5-8.5/Turbidity – 08ntu/Bod -<smg/1/COD – 10MG/1 , Fe – 0.3mg /1 දක්වා ලඟා කර ගැනීම
3. ජල මුලාශ්‍ර හා දියඇලි වල රක්ෂිත ආශ්‍රිතව ඇති හෙක්. 05කට ආසන්න අනවසරයෙන් අල්ලා ගත් ඉඩම් ප්‍රමාණයක් 2025 වන විට නැවත නිදහස් කර ගැනීම හා ඒවා භූදර්ශන අලංකරණ කටයුතු සඳහා භාවිතා කිරීම
4. දැනට පවත්නා හෙක්. 1782ක් වූ වන ගහනය ඒ ලෙසම පවත්වා ගෙන යාම හා 34%ක් වූ වනාන්තර ප්‍රතිශතය එලෙසම පවත්වා ගෙන යාම
5. ග්‍රෙගරි වැව හා බැරැක්ප්ලේන් ජලාශයේ පෝෂිත ප්‍රදේශ වල හෙක් 28කට ආසන්න සියළුම කෘෂිකාර්මික ඉඩම් සඳහා 2025 වන විට GAP සහතිකරණය ක්‍රමවේදය අදාල ආයතන මගින් කෘෂිකර්මාන්තයේ යෙදෙන ගොවීන් දැනුවත් කර ක්‍රියාත්මක කිරීම



02.නුවරඑළියට අවේනික ගති ලක්ෂණ මුර්තිමත් කිරීම

Imaging Unique Context of NuwaraEliya.

1 විසිල් නුවරඑළිය සංවර්ධන සැලැසුම් කලාපය තුළ නුවරඑළියට අවේනික ගෘහ නිර්මාණ ශිල්පී හා භූදර්ශන ලක්ෂණ සහිත කලාපයක් බවට 2030 වන විට පත් කිරීම

2 නගරයට සුවිශේෂී වූ පිදුරුතලාගල, යුනික්විව්, ග්ලේන්ෆෝල්, ගැල්වෙස්, ලවර්ස්ලීප් හා තේ වතු ආශ්‍රිත දර්ශන තල ඉදිකිරීම් මගින් අවහිර වීම් වැලැක්වීම

3 නුවරඑළිය නගරයේ ප්‍රධාන පිවිසුම් ස්ථාන වන බ්ලැක්ෆුල්, ටොප්පාස් හා කටුමාන ස්ථාන වල නුවරඑළියට ආවේනික ගති ලක්ෂණ පෙන්නුම් කරන භූදර්ශනය ඇති කිරීම

5 ප්‍රධාන විනෝදාත්මක කලාපය (Recreational) වන ග්‍රෙගරි වැව කලාපය හා ප්‍රධාන වාණිජ හා සේවා කලාපය අතර 2030 වන විට හරිත ප්‍රවාහන ක්‍රම සංකල්පය හඳුන්වා දීම

6 පැල්පත්, මුඩුක්කු හා අඩු පහසුකම් නිවාස ප්‍රමාණය මුළු නිවාස ගහනයෙන් 10%ක් දක්වා වන ලෙස 2030 වන විට අඩු කිරීම

7 කටුමාන, සදතැන්න, මීපිලිමාන, මිහිදුපුර හා බුළු ඇල කලාප වල නව සංවර්ධන ආකර්ෂණ ඇති කිරීම

03.දිදුලන ඉසුරුමත් පුරවරයක

Creating vibrant wealthy zone

01. ශ්‍රීලංකාවට පැමිණෙන මුළු සංචාරකයින්ගෙන් වසරකට නුවරඑළිය නගරයට පැමිණෙන මුළු විදේශ සංචාරකයින්ගෙන් ප්‍රමාණය 6% සිට 12%ක ප්‍රමාණයක් දක්වා (මිලියන 0.7) වැඩි කිරීම හා දේශීය සංචාරකයින් ප්‍රමාණය වාර්ෂිකව මිලියන 4.5ක් ලෙස 2030 වන විට ඉලක්ක කිරීම
02. අවම වශයෙන් රාත්‍රී 04ක සංචාරක පැකේජයක් හදුන්වා දීම
03. අප්‍රේල්, අගෝස්තු සහ දෙසැම්බර් මාස සඳහා සංචාරකයින් ඉලක්ක කර ගත් උත්සව හා සැණකෙළි සඳහා පහසුකම් සැපයීම හා ජනවාරි - මාර්තු, මැයි - ජුලි, සැප්. - නොවැම්බර් කාර්තු 03 සඳහා සුවිශේෂ දේශීය සංචාරක කණ්ඩායම් සඳහා ඉලක්ක ගත වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම
04. වන රක්ෂණ දෙපාර්තමේන්තුව මගින් නිදහස් කර ඇති අනවසරයෙන් අල්ලා ගත් හෙක්. 101 ක් වන ඉඩම් සඳහා 2025 වන විට කෙටි කාලීන කෘෂිකාර්මික භෝග වෙනුවට දිගු කාලීන කෘෂිකාර්මික භෝග හදුන්වා දීම
05. පවත්නා කෘෂිකාර්මික භාවිතය වන 17% ප්‍රතිශතය ඒ අයුරින්ම පවත්වා ගෙන යාම
06. හෙක්ටයාර් 50ක පමණ වූ ඌන භාවිත රජයේ ඉඩම් සඳහා තීරසාර භාවිතයන් හදුන්වා දීම

පරිච්ඡේදය 4

SWOT (විශ්ලේෂණය)



SWOT (විශ්ලේශණය)

මෙම ඉලක්කයන් සම්පූර්ණ කිරීම උදෙසා නුවරඑළිය ප්‍රදේශය සතු ප්‍රබලතාවයන් (Strength) දුබලතායන් (Weakness) ඉඩ ප්‍රස්තා (Opportunities) හා තර්ජන (Thread) සලකා බැලිම උදෙසා SWOT විග්‍රහය පහත අයුරින් වේ



ශක්තීන් S	දුබලතාවයන් W
1. පවත්නා ජල මූලාශ්‍ර පද්ධතින් (නානුඔය ඇල, වෝටර්ෂිල්ඩ් බ්‍රයිව්, ග්‍රෙගරි වැව, බ්‍රැක්ප්ලේන්, ග්ලේන් හෝල්, ලවර්ස්ලීප්) 2. අධි උන්නතාංශ කඳු පන්තින් (පිදුරුතලාගල, සිංගල්ට්‍රී, කිකිළියාමාන, ලවර්ස්ලීප්) 3. සැපදායක දේශගුණික තත්වය (වර්ෂාපතනය, ආර්ද්‍රතාවය හා උෂ්ණත්වය) 4. පවත්නා වනාන්තර පද්ධතිය (ගැල්වේස්, පිදුරුතලාගල, හග්ගල)	1. ජල මූලාශ්‍ර අපවිත්‍ර වීම 2. පානීය ජලයේ අපවිත්‍රතාවය 3. වගා කටයුතු සඳහා පොහොර හා රසායනික ද්‍රව්‍ය අධි භාවිතය 4. වනගහනය අඩු වීම හා රක්ෂිත ආක්‍රමණය

6.1.පවතින පරිසර පද්ධතිය ආරක්ෂා කරමින් පිරිසිදු ජල මූලාශ පද්ධතියක්

අවස්ථා O	තර්ජන T
1. රජයේ ප්‍රතිපත්ති - * ජාතික භෞතික සැලැස්ම * ශ්‍රීලංකා සංචාරක ප්‍රවර්ධන සැලැස්ම 2. කාබනික කෘෂි භෝග සඳහා ඉල්ලුම් වැඩි වීම 3. යේජිත නව අප ජල අපවහන ව්‍යාපෘතිය 4. තීරසාර සංවර්ධන දර්ශක (SDG - 203)	1. බහු ජාතික සමාගම් වල කෘතිම පොහොර හා කෘමිනාශක සඳහා වන වෙළඳ ප්‍රචාර

5.1.1 ශක්තීන්

01. පවත්නා ජල මුලාශ්‍ර පද්ධතින් (නානුඔය ඇල, වෝටර්ෆිල්ඩ්

ඩ්‍රයිව්, ග්‍රෙගරි වැව, බිරැක්ප්ලේන්, ග්ලේන් ෆෝල්, ලවර්ස්ලීප්)

සිතියම් අංක 5.1 - ජල මූලාශ්‍ර පද්ධතිය



රූපසටහන 5.1



රූපසටහන 5.2



ග්‍රහනය -නිලන්ත පරණගම ,මාර්තු 2017

සංවේදී පරිසර පද්ධතියක් හිමි විසල් නුවරඑළිය කලාපය තුළ විශේෂත්වය වන්නේ වසරේ අඛණ්ඩව පවතින ජල මුලාශ්‍ර පද්ධතියයි. එසේම වසරේ දින 200කට වඩා වර්ෂාව ලැබීමත් මුළු භූමි ප්‍රමාණයෙන් 2%කට ආසන්න ප්‍රමාණයක් ජල බැස්මක් සහිත ප්‍රදේශ පැවතීමත් තව දුරටත් පරිසර පද්ධතිය සමතුලිත කිරීම සඳහා දායකවේ. විශාලම ජල මුලාශ්‍රය වන්නේ හෙක්. 09කින් යුත් ග්‍රෙගරි වැවයි. බ්‍රිතාන්‍ය යුගයේ ආණ්ඩුකාරි ශ්‍රීමත් විලියම් ග්‍රෙගරි විසින් (1872-1877) ඉදිකරන ලද්දකි. ග්‍රෙගරි වැවේ උපරිම ධාරිතා මට්ටමේදී හෙක්. 40ක ප්‍රමාණයක ජලය පැතිරේ. එසේම උපරිම ගැඹුර මීටර් 03ක් වන අතර වර්ග කි.මී 17.75ක වපසරයකින් යුත්

ප්‍රධාන හා සුළු ජල මාර්ග 20කින් පමණ පෝෂණය වේ. එමෙන්ම හෙක් 40කින් සමන්විත බැරැක්පෙලෙන් ජලාශයද තවත් ප්‍රධාන ජල මූලාශ්‍රයක් වන අතර එය වර්ග කි.මී 3.21කින් වපසරයකින් යුත් ඇල මාර්ග 7කින් පෝෂණය වේ.

එසේම කටුමාන ජලාශය, මාගස්තොට ජලාශය හා ඒ හා බැඳුනු ජල මාර්ග පද්ධතින්ද මනා ජල වහනයක් පවත්වා ගෙන යාම සඳහා උපකාරී වේ. පවතින පරිසර පද්ධතිය ආරක්ෂා කරමින් පිරිසිදු ජල මූලාශ්‍ර පද්ධතියක් යන ඉලක්කය සම්පූර්ණ කර ගැනීමට මෙම පවත්නා ජල මාර්ග හා ජලාශ බෙහෙවින් උපකාරී වේ.

පානීය ජල මූලාශ්‍ර - මතුපිට ජල මූලාශ්‍ර 9ක් හා මීට අමතරව නල ළිං 09ක් මගින්ද ජල සම්පාදනය සිද කරනු ලබයි.

රූපසටහන 5.3- පානීය ජල බෙදාහැරීම



මූලාශ්‍රය : නුවරඑළිය මහ නගර සභාව

02. ඉහළ උන්නතාංශයකින් යුක්ත කදු පන්තින්

විසල් නුවරඑළිය සංවර්ධන සැලැස්මේ සීමාව තුළ මීටර් 200ට වඩා උස්වූ කදු ශිඛර පිහිටා ඇති බැවින් ඒ ආශ්‍රිත වනාන්තර හා පරිසර පද්ධතිය නුවරඑළියට අවේනික පෙනුම ලගා කර ගැනීම සඳහා මහත් උපකාරී වේ. විශේෂයෙන් සිංගල් ට්‍රී, කලාපුර, ශාන්තිපුර, කිකිළියාමාන, මාගස්තොට හා බඹරකැලේ කදු මෙම සීමාවේ පිහිටා තිබීමත් පිදුරුතලාගල කදු පන්තිය නුවරඑළිය නගරයට සම්පූර්ණයෙන් දර්ශනය වීමත් ස්වභාවික සෞන්දර්ය තීවෘ කරයි.

පිදුරුතලාගල කන්ද මුහුදු මට්ටමේ සිට 2524කින් ද කිකිළියාමාන කන්ද 2037කින් ද හග්ගල කන්ද 2169 කින්ද යුක්ත වේ. නගරයේ පහළම උස වූ මුහුදු මට්ටමේ සිට 1890ක් හා සාමාන්‍ය උස 1950 වන අතර උක්ත කදු පන්තින් මනාව දර්ශනය වීම තවදුරටත් ඉවහල්වේ.

සිතියම් අංක 5.2 - භූගෝලිය පිහිටීම



භූගෝලිය පිහිටීම
විසල් නුවරඑළිය සංවර්ධන සැලස්ම

නාගරික සංවර්ධන අධිකාරිය
නුවරඑළිය
2019

නුවරඑළිය නාගරික සංවර්ධන සැලස්ම (2019-2030)

සැකසුම -මඩුෂානී

සිතියම් අංක 5.3 - කඳු පන්තීන්



භූ විෂමතාවය 20 m
විසල් නුවරඑළිය සංවර්ධන සැලස්ම

නාගරික සංවර්ධන අධිකාරිය
නුවරඑළිය
2019

නුවරඑළිය නාගරික සංවර්ධන සැලස්ම (2019-2030)

සැකසුම -මඩුෂානී

03.සැපදායක දේශගුණික තත්ත්වය

නුවරඑළිය ප්‍රදේශය සඳහා සංචාරක ආකර්ෂණය වීමට එහි සීත දේශගුණික තත්වය, වසරේ වැඩි කාලයක් පවතින වර්ෂාව හා සදාහරිත පරිසරය විශේෂයෙන් හේතු සාධක වී ඇත. ලංකාවේ අඩුම උෂ්ණත්වය නුවරඑළියෙන් වාර්තා වෙන අතර, එය පසුගිය වසර 10 සැසඳෙන විට සාමාන්‍ය උෂ්ණත්වය සෙ.අංශක 20ක් පවති. අඩුම උෂ්ණත්වය සෙ.අංශක 4 දක්වා පහත වැටේ. සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය අගල් 180ක් වන අතර, අවම වර්ෂාපතනය අගල් 140කට වඩා අඩු නොවේ.

*රූපසටහන අංක **5.4** - වාර්ෂික උෂ්ණත්වය හා වර්ෂාපතනය*



මූලාශ්‍රය : කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

*වගු අංක **5.1** - වාර්ෂික උෂ්ණත්නය හා වර්ෂාපතනය*

Year	Average Annual Maximum Temperature	Average Annual Rainfall	Average Annual Minimum Temperature
2007	20.0	139.6	12.32
2008	20.2	132.2	12.24
2009	20.3	136.7	11.51
2010	20.4	181.9	12.60
2011	20.1	141.6	12.08
2012	20.5	147.6	11.76
2013	19.9	179.8	12.08
2014	20.2	154.8	12.32
2015	20.5	168.4	12.30
2016	20.6	94.8	12.39

මූලාශ්‍රය : කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

තෝරාගන්නා ලද විසල් සංවර්ධන සැලැස්ම තුල හෙක්ටයාර් 1782ක වනාන්තර සංයුතියක් ඇති අතර එය මුළු භූමි ප්‍රමාණයෙන් 34.8%ක ප්‍රතිශතයක්ය. ඉලක්කය වන පවතින පරිසර පද්ධතිය ආරක්ෂා කරමින් පිරිසිදු ජල මුලාශ පද්ධතියක් සදහා මනා පිටුවහලක් වන මෙය නගරයේ සදාහරිත පරිසරය විදහා දක්වයි. විශේෂයෙන් ශ්‍රී ලංකාවට ආවේනික ශාක හා සත්ව කොට්ඨාස ඇතුලත් නොයිදුල් වනාන්තර කොටස් පිහිටා ඇති අතර එය සිංගල් ට්‍රී හග්ගල, පිදුරුතලාගල කිකිලියාමාන, බ්‍රැක්ප්ලේන් සහ අවට වනාන්තර ඒ අතර ප්‍රධාන වේ.

සිතියම් අංක 5.4 - වනාන්තර පද්ධතිය



5.1.2.දුබලතාවයන්

01. පානීය ජලයේ ගුණාත්මක භාවය අඩු වීම.

පරිසර පද්දතිය ආරක්ෂා කිරීමත් පිරිසිදු ජල මාර්ග පද්ධතියක් හදුන්වා දීමත් හා නුවරඑළිය ආවේනික ගති ලක්ෂණ විදහා දැක්වීම යන ඉලක්කයන් කරා ගමන්කිරීමේදී මුහුණ දීමට සිදුවන ප්‍රධාන දුබලතාවයක් වශයෙන් දැනට පවතින දුෂිත ජල මුලාශ්‍ර පද්ධතිය ප්‍රධාන වශයෙන් හදුනා ගත හැකිය. විශේෂයෙන් ග්‍රෙගරි වැව හා ඒ ආශ්‍රිත නානුඔය ඇල ද බැරැක්ප්ලෙන් ජලාශය හා ඒ ආශ්‍රිත් ඇල මාර්ග පද්ධතින්ද දැඩි ලෙස දූෂණයට පත්ව ඇත. 2016දී හා 2017 දී කරන ලද ග්‍රෙගරි වැව, කටුමාන වැව, බ්‍රැක්ප්ලේන් වැව් වල කර ලද ජල සාම්පල් පරික්ෂාවේදී (***වගු අංක 5.2 හා වගු අංක 5.3***) බොහෝමයක් ස්ථානවල ජලයෙහි තිබිය යුතු ගුණාත්මක භාවය අවම වී ඇති බව පෙන්වා දී ඇත. එහි Turbidity, Bod, Fe, Cod හා Do ප්‍රමාණයන් අනුමත





ප්‍රමාණය ඉක්මවා වී ඇති බව තහවුරු වී ඇත. ප්‍රධාන වශයෙන් ජල මූලාශ්‍ර සඳහා මලාපවාහන මිශ්‍රවීමත් කෘෂිකර්මාන්තයේදී භාවිතා වන පොහොර හා කෘමි නාශක මිශ්‍ර වීමත් නිසා මේ තත්වය ඇති වී ඇති බව පෙන්වා දී ඇත.ග්‍රෙගරි වැවේ මෙම ජලය දූෂණය වීමට ප්‍රධාන ලෙස බලපා ඇත්තේ එහි පෝෂිත අතුඇලවල් වල දූෂණය වීමයි. මේතත්වය ඉදිරි ඉලක්කයන් වලට බාධාවක් වේ.

*රූපසටහන **5.5**- ජලාශ්‍ර වල තත්ව වාර්තාව - **2017***



ඉ අධ්‍යක්ෂ කාර්යාලය-මධ්‍යම ඳසාව
கீகளம்வுலயர்ப்பாசனப் பணிப்பாளர்காரியாலயம்-மத்தியவலயம
OFFICE OF THE ZONAL DIRECTOR OF IRRIGATION – CENTRAL ZONE

OFFICE OF THE ZONAL DIRECTOROF
IRRIGATION-CENTRAL ZONE, KUNDASALE

Telephone Office 081-2060737
Fax 081-2060737
E-mail:di_centralzone@hotmail.com

My Number ..... Your Number ..... Date ...../...../.....

LABORATORY REPORT OF WATER QUALITY MONITORING UNIT

Name Of The Division :-Nuwaraeliya
Schemes: Gregory Lake, Katumana, Barrakplain
Date of Sample collection :- 20.03.2017
Weather condition:- Dry Weather
Name of the Tester :- Ms. Rathnayake , Ms. Punchihewa

	Gregory Lake	Katumana Exit	Katumana wewa	Barrakplain wewa	Barrakplain Entry Canal	Permissil e level
PH -	7.93	7.39	6.64	6.75	6.63	6.5-8.5
Temperature	23	23	23	23	23	-
Conductivity	191.6	215.7	215.4	200.1	239	750 µS/cr
Turbidity	17.5	17.0	6.95	3.28	43.8	08 NTU
Hardness (as CaCO-3)	25	70	61	52	65	250 mg/
BOD	12	2.9	1.0	7.2	19	< 5mg/l
DO	8.41	6.51	6.37	4.22	5.63	>5 mg/l
Nitrate/NO_3^-	1.4	3.0	2.1	1.1	2.8	10 mg/l
Phosphate/PO_4^{-3}	1.02	0.22	1.55	1.78	0.82	2.0 mg/l
Sulfate/SO_4^{2-}	17	11	13	19	20	200mg/l
UIA	0.0251	0.002096	0.000104	0.005096	0.3822	0.06 mg/
Fe	7	6	4	5	16	0.3 mg/l
Remarks	Turbidity, BOD and Fe Concentrations are greater than the permissible level	Turbidity and Fe Concentrations are greater than the permissible level	Fe Concentration is greater than the permissible level	DO concentration is less than the permissible level and Fe, BOD concentrations are greater than the permissible levels	Turbidity, BOD, UIA and Fe concentrations are greater than the permissible levels.	

Prepared By: .....
M.Rathnayake
Development Officer

Checked By:.....
Eng. R.M.P.P. Rathnayake
Irrigation Engineer
Central Zone

UIA
un Ionized
Amonia

Recommended By :.....
Eng. T. Batagoda
Central Zone

Approved By :.....
Eng. R.M.P. Karunaratne
Central Zone

වැසිදිය හසුරුවා සිරිලක සසිරිමත් කරමු
மழை நீரை முகாமைப்படுத்தலும் இலங்கையை செழுமையூட்டலும்
Managing Rain Water - Make Sri Lanka Prosperous

*රූපසටහන **5.6**- ජලාශ්‍ර වල තත්ව වාර්තාව - **2016***



දියාචාර්මාර්ග අධ්‍යක්ෂකාර්යාලය-මධ්‍යමද්සාව
நீர்ப்பாசனத் திணைக்களம்வுலயநீர்ப்பாசனப் பணிப்பாளர்காரியாலயம்-மத்தியவலயம
OFFICE OF THE ZONAL DIRECTOR OF IRRIGATION – CENTRAL ZONE

OFFICE OF THE ZONAL DIRECTOROF
IRRIGATION-CENTRAL ZONE, KUNDASALE

Telephone Office 081-2060737
Fax 081-2060737
E mail:di_centralzone@hotmail.com

My Number ..... Your Number ..... Date ...../...../.....

LABORATORY REPORT OF WATER QUALITY MONITORING UNIT

Division :Nuwaraeliya
Weather condition:-Dry Weather
Date of Sample collection :-30.12.2016Time of sample collection:- 10.00 am to 12.00 pm
Name of the Tester :-Ms.Rathnayake&Mr. Jayasundara

Test	Barakplain Exit	Barakplain Entry	Katumana Exit	Katumana Tank	Katumana Entry	Permissible level
PH	6.42	6.54	6.47	6.45	6.32	6.5-8.5
Temperature	19	19	19	19	19	-
Conductivity	305	333	349	365	301	750 µS/cm
Turbidity	24	16.9	9.34	9.42	5.54	08 NTU
Alkalinity (total as $caco_3$)						200 mg/l
Hardness (as $caco_3$)	73	54	112	105	72	250 mg/l
COD	215	130	68	110	131	10 mg/l
DO	1.94	0.98	3.57	3.17	4.91	>5 mg/l
Nitrate/NO_3^-	1.6	4.1	3.5	3.0	3.5	10 mg/l
Phosphate/PO_4^{-3}	0.21	0.79	0.11	0.14	0.07	2.0 mg/l
Sulfate/SO_4^{2-}	36	34	42	42	33	200mg/l
UIA	0.014	0.0429	0.0020	0.00195	0.00304	0.06 mg/l
Iron/Fe	1.98	1.23	0.70	0.63	0.53	0.3 mg/l
Remarks	pH and DO are less than the permissible levels. Turbidity, COD and Fe concentrations are greater than the permissible levels	DO is less than the permissible level. Turbidity, COD and Fe concentratio ns are greater than the permissible levels	pH and DO are less than the permissible levels. Turbidity, COD and Fe concentratio ns are greater than the permissible levels	pH and DO are less than the permissible levels. Turbidity, COD and Fe concentratio ns are greater than the permissible levels	pH and DO are less than the permissible levels COD and Fe concentrations are greater than the permissible levels	

Checked By
Certified By
Date

Eng. Wasantha Bandara Palihawadana
Director of Irrigation

වැසිදිය හසුරුවා සිරිලක සසිරිමත් කරමු
மழை நீரை முகாமைப்படுத்தலும் இலங்கையை செழுமையூட்டலும்

මූලාශ්‍රය : වාරි මාර්ග දෙපාර්තමේන්තුව

වගු අංක 5.2 - ග්‍රෙගරි වැව ජල තත්ව වාර්තාව

Test	Unit	Method		Results					L.O.D	E.U % (K=2)
			SLS 614: 2013	Lake Gregory Inlet	Lake Gregory Mid-Point	Lake Gregory near the School	Lake Gregory near the Bridge	Lake Gregory near the Sluice		
Odour	-	CML 1		Objec *	Objec *	Objec *	Objec *	Objec *	-	-
# Turbidity	NTU	APHA 213 0 B	2	118	222	94.6	50.4	121	-	20
# pH at 25° C	-	APHA 4500 – H^+ B	6.5-8.5	7.62	8.21	8.26	8.22	8.32	-	-
# Chioride (as Cl)	Mg/L	APHA 4500 Cl - B	250	22	22	22	22	22	-	4
# Total Alkanlinity (as $CaCO_3$)	Mg/L	APHA 2320 B	200	43	46	47	43	46	-	4
Free Ammonia (as NH_3)	Mg/L	SLS 614 : 2013, Appendix A	0.06	2.4	2.4	2.0	1.6	2.4	-	-
Albuminoid Ammonia ((as NH_3)	Mg/L	SLS 614 : 2013 Appendix A	0.15	2.8	1.8	0.80	2.4	2.0	-	-
Nitrare (as NH_3)	Mg/L	CML /MM/02/02/019/V 1.2	50	5.0	5.0	4.8	5.3	4.8	-	-
# Nitrite (as NH_2)	Mg/L	APHA 4500- NO_2B	3	0.11	0.09	0.20	0.06	0.04	-	14
# Fluoride (as F)	Mg/L	APHA 4500-F C	1.0	0.37	0.36	0.36	0.50	0.36	-	6
# Total Phosphates (as PO_4)	Mg/L	APHA 4500 – P B & C	2.0	1.4	1.5	1.1	1.4	1.3	-	10
# Total Dissovled Soilds	Mg/L	APHA 2540 C	500	140	101	146	130	131	-	5
# Total Hardness (as $CaCo_3$)	Mg/L	APHA 2340 C	250	45	49	51	45	44	-	4
Sulfate (as SO_4)	Mg/L	Modified APHA 4500 SO_4 ^{2}E	250	ND	ND	16	ND	ND	10	-
Calcium (as Ca)	Mg/L	APHA 3500 Ca- D	100	14.5	15.7	18.9	15.1	14.9	-	-
Magnesium (as Mg)	Mg/L	APHA 2340 C & 3500 Ca - D	30	2.0	2.4	3.4	1.8	1.7	-	-
Cyanide (as CN)	Mg/L	CML 18	0.05	ND	ND	ND	ND	ND	0.05	-
Sodium (as Na)	Mg/L		200	9	9	8	9	8	-	-
Iron (as Fe)	Mg/L		0.3	0.75	0.46	0.66	0.80	0.50	-	-
Copper (as Cu)	Mg/L		1.0	ND	ND	ND	ND	ND	0.05	-
Manganese (as Mn)	Mg/L		0.1	0.08	0.08	0.11	0.11	0.10	-	-
Zinc (as Zn)	Mg/L		3.0	0.03	ND	ND	ND	ND	0.02	-
Aluminum (as Al)	Mg/L		0.2	0.84	0.65	0.94	0.91	0.53	-	-
Chromium (as Cr)	Mg/L		0.05	ND	ND	ND	ND	ND	0.05	-
Nickel (as Ni)	Mg/L	USEPA -200.8	0.02	ND	ND	ND	ND	ND	0.01	-
Arsenic (as As)	Mg/L		0.01	ND	ND	ND	ND	ND	0.001	-
Cadmium (as Cd)	Mg/L		0.003	ND	ND	ND	ND	ND	0.001	-
Lead (as Pb)	Mg/L		0.01	ND	ND	ND	ND	ND	0.01	-
Selenium (as Se)	Mg/L		0.01	ND	ND	ND	ND	ND	0.001	-
Mercury (as Hg)	Mg/L		0.001	ND	ND	ND	ND	ND	0.001	-
# COD	Mg/L	Modified APHA 5220 D	10	110	110	85	100	105	-	4
Phenolic compounds (as C_6H_5OH)	Mg/L	APHA 5530 B & D	0.001	ND	ND	ND	ND	ND	0.1	
Oil & Grease	Mg/L	APHA 5520 B	0.2	ND	ND	ND	ND	ND	2	-

මූලාශ්‍රය : මධ්‍යම පරිසර අධිකාරිය

වගු අංක 5.3- පානීය ජල තත්ව වාර්තාව

සාම්පල් ලබාගත් ස්ථාන	මුළු කොලිපෝන් බැක්ටීරියා සෙන්ටිග්‍රේට් 35 දී (මි.ලි.100)	මුළු කොලිපෝන් බැක්ටීරියා සෙන්ටිග්‍රේට් 44 දී (මි.ලි.100)
පීඩaa	38	4
ටොප්පාස්	68	10
හෙවන් සෙවන් හොටෙල්	10	0
ගැමුණු මාවත තැපැල් පෙට්ටි හන්දිය	72	8
පීඩaa ජල ටැංකිය අසල	52	2
කාර්මික විද්‍යාලය	0	0
හැඩන්හිල් පොම්පාගාරය	0	0
නානුඔය පාර කදිරේෂන් කෝච්ලි අසල	12	0
හැඩන්හිල් ජල පොම්පාගාරය	48	0
ග්‍රෙගරි වැව අදියර 111	4	0
ඒ.එල්.ඒ.පී උදයකාන්ත මයා, කලුකැලේ	0	0
හිමලුව හෝටලය, මාගස්තොට	38	8
සඳතැන්න වීදියේ එළවළු වතුයාය	18	2
විජිතපුර වීදියේ සන්හිල් කඩය	10	0
මාගස්තොට	0	0
බදුල්ල පාර	60	14
නුවරඑළිය ලේඩිමැක්ලම් පාර, වජිරඥාන විද්‍යාලය	368	240
නුවරපාර, බඹරකැලේ	120	54
නුවරඑළිය නගරසභා කාර්යාලය.	710	480

මූලාශ්‍රය : මහ නගර සභාව, නුවරඑළිය

02.පානීය ජලයේප්‍රමාණාත්මක බව අඩු වීම.

නුවරඑළියේ නගර සීමාව තුල පෘනිය ජලය ලබා ගනු ලබන්නේ ප්‍රධාන ජල පොම්පාගාර 13ක් මගින් වන අතර ඒවාගේ දළ ධාරිතාව වියලි සමයේ කි.මීටර් 3500ක් දක්වා පහත යන අතර දෛනික ඉල්ලුම කියුබික් මීටර් 5500ක් ලෙස වැඩි වීඹක් සිදුවේ. මේ සමයේදි ජල පෝෂක වල මෙම හිඟ ජල ප්‍රමාණය සදහා නල ලිං මගින් සපයා ගනු ලැබේ. මෙම පානීය ජලයේ හිඟ තාවය සෘජුවම සංචාරක ප්‍රවර්ධනය උදෙසා බලපානු ලබයි.

03.වනගහන අඩුවීමහා රක්ෂිත අක්‍රමණය

නුවරඑළිය සංවේදී පරිසරය පිළිබඳව සැලකීමේදී ප්‍රධාන වශයෙන් ස්වභාවික වනාන්තර හා ඒ ආශ්‍රිත කඳු පන්තින් ප්‍රධාන වේ. එහෙත් මෙම විසල් නුවරඑළිය සංවර්ධන බල ප්‍රදේශයේ ඉහල කඳු ආශ්‍රිත වනාන්තර ගහනය 2010 සිට 2017 වන විට 15%කින් පහත වැටීඇත. එනම් 2010 දී 40% ක්ව තිබූ වනාන්තර ගහනය 2017 දී 34%ක් ලෙස අඩු වී ඇත. මේ අනුව වනගහනය අඩුවීමත්, ඒ තුලින් හරිත කඳුපන්තින් වල දර්ශන අවම වීමටත් තුලින් නුවරඑළිය පිළිබඳව ප්‍රතිරූපය වෙනස් වී ඇත.මේ පිළිබඳව සිතියම් අංක 5.5 හා 5.6 මගින් පෙන්නුම් කෙරේ..

*සිතියම් අංක **5.5** - භූමී පරිහරණ රටාව -2010*



ඉඩම් පරිහරණ රටාව විසල් නුවරඑළිය සංවර්ධන සැලස්ම	නාගරික සංවර්ධන අධිකාරිය නුවරඑළිය 2019
නුවරඑළිය නාගරික සංවර්ධන සැලස්ම (2019-2030)	සැකසුම -මදුෂානී

*සිතියම් අංක **5.6** - භූමී පරිහරණ රටාව -2017*



ඉඩම් පරිහරණ රටාව විසල් නුවරඑළිය සංවර්ධන සැලස්ම	නාගරික සංවර්ධන අධිකාරිය නුවරඑළිය 2019
නුවරඑළිය නාගරික සංවර්ධන සැලස්ම (2019-2030)	සැකසුම -මදුෂානී

5.1.3.අවස්ථා

- රජයේ ප්‍රතිපත්ති -
- * ජාතික භෞතික සැලැස්ම
- * ශ්‍රීලංකා සංචාරක ප්‍රවර්ධන සැලැස්ම

ශ්‍රීලංකාවේ ව්‍යුහාත්මක සැලසුම් සකස් කරනු ලබන ජාතික භෞතික සැලසුම අනුව නුවරඑළිය ප්‍රදේශය ආශ්‍රිත මධ්‍යම කඳුකරය පරිසර සංවේදි ප්‍රදේශයක් ලෙස නම් කර ඇත. එසේම ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන උපාය මාර්ග යටතේ මධ්‍යම කඳුකරය පාරිසරික සංචාරක කටයුතු සඳහා උපාය මාර්ග හඳුන්වා දී ඇත. ඒ අනුව මෙම ඉලක්ක සපුරා ගැනීම සඳහා ප්‍රධාන අවස්ථාවක් ලෙස රජයේ ප්‍රතිපත්ති හඳුනා ගත හැකියි.

- **2. කාබනික කෘෂි භෝග සඳහා ඉල්ලුම් වැඩි වීම**

වර්තමානයේ කාබනික වගාවන් සඳහා කාබනික බෝග සඳහා වැඩි ඉල්ලුමක් පැවතීම හේතුවෙන් මෙකී ඉලක්ක මගින් බලාපොරොත්තු වන පාරිසරික පද්ධතිය ආරක්ෂා කර ගැනීම සඳහා කෘතිම පොහොර භාවිතය අවම කිරීම යන අරමුණු සඳහා සහයෝගයක් වේ.

- **3. යේජිත නව අප ජල අපවහන ව්‍යාපෘතිය**

නුවරඑළිය මහ නගර සභාව මගින් JICA ආධාර යටතේ දැනට යෝජනා කර ඇති මලාපවහන පද්ධතිය පිරිසිදු පරිසර පද්ධතියක් ඇති කිරීම සඳහා පිටුවහලක් වනු ඇත.

- **4. තීරසාර සංවර්ධන දර්ශක (SDG - 2030)**

5.1.4. තර්ජන

- **01. බහු ජාතික සමාගම් වල කෘතිම පොහොර හා කෘමිනාශක සඳහා වන වෙළඳ ප්‍රචාර**

ජල මූලාශ්‍ර වල ප්‍රධාන අපවිත්‍ර සාධකයක් ලෙස ඉහතින් හඳුනා ගෙන ඇත්තේ උඩරට කෘෂිකර්මාන්ත සඳහා භාවිතා කරනු ලබන කෘතිම පොහොර හා කෘමි නාශක අධිකව යෙදීමයි. මෙය ගොවීන්ගේ නොදැනුවත් භාවය හා ඒ සඳහා වන පෙළඹීම් ද හේතුවී ඇත. කෘතිම පොහොර හා කෘමිනාශක ආනයනික කරනු ලබන සමාගම් වල ආකර්ෂණීය වෙළඳ ප්‍රචාරද මෙම ගොවියන්ගේ අධික පොහොර භාවිතයට හේතුවී ඇත.



ශක්තීන් S	දුබලතාවයන් W
1.පවත්නා ජල මූලාශ්‍ර පද්ධතින් (නානුඔය ඇල, වෝටර්ෆිල්ඩ ඩ්‍රයිව්, ග්‍රෙගරි වැව, බ්‍රැක්ප්ලේන්, ග්ලේන් හෝල්, ලවර්ස්ලීප්) 2. අධි උන්නතාංශ කඳු පන්තින් (පිදුරුතලාගල, සිංගල්ට්‍රී, කිකිළියාමාන, ලවර්ස්ලීප්) 3. සැපදායක දේශගුණික තත්වය (වර්ෂාපතනය, ආර්ද්‍රතාවය හා උෂ්ණත්වය) 4. පවත්නා වනාන්තර පද්ධතිය (ගැල්වේස්, පිදුරුතලාගල, හග්ගල) 5. සංචාරක ආකර්ශන ස්ථාන 6. පවත්නා බ්‍රිතාන්‍ය සම්ප්‍රධායේ ලක්ෂණ සහිත ගොඩනැගිල්ල 7. උඩරට එළවළු වගාව. 8. තේ වතු 9. නුවරඑළියට සුවිශේෂී මල් වගාව	1. ජල මූලාශ්‍ර අපවිත්‍ර වීම 2. පානීය ජලයේ අපවිත්‍රතාවය 3. වනගහනය අඩු වීම හා රක්ෂිත ආක්‍රමණය 4. නුවරඑළිය අවේනික ගෘහ නිර්මාණ සහිත ගොඩනැගිලි ඉදිකිරීම් අඩු වීම. 5. නව ඉදිකිරීම් හේතුවෙන් දර්ශන තල අවහිර වීම. 6. පැල්පත් මඩුක්කුක හා අඩු පහසුකම් නිවාස පැතිරීම. 7.කෘෂි කාර්මික ඉඩම් ගොඩනැගිලි ඉදිකිරීම සඳහා භාවිතා කිරීම.

5.2.නුවරඑළියට අවේනික ගති ලක්ෂණ මුර්තිමත් කිරීම

අවස්ථා O	තර්ජන T
1. ජාත්‍යන්තර වශයෙන් පරිසර සංවේදි සංචාරක සඳහා වැඩි ඉල්ලීම	01කාළගුණ විපර්යාස හා දේශගුණ තත්වයන් වෙනස්වීම් .

5.2.1.ශක්තීන්

1. පවත්නා ජල මුලාශ්‍ර පද්ධතින්

නුවරඑළියට ආවේනික ගති ලක්ෂණ මුර්තීමත් කිරීම යන ඉලක්ක සපුරා ගැනීම සඳහා දැනටමත් පවතින නානුඔය ඇල, වෝටර්හිල්ඩ් ඩ්‍රයිව්, ග්‍රෙගරි වැව, බ්‍රූක්පෙලෙන්, ග්ලේන්ෆෝල් හා ලවර්ස්ලීප් හා අනෙකුත් ජල මාර්ග හා ජලාශ පිටුවහලක් වී ඇත. ප්‍රදේශයේ මුළු භූමි ප්‍රමාණයෙන් 2%කට ආසන්න ප්‍රමාණයක් ජලයෙන් වැසි ඇති අතර දිය ඇලි හා පිරිසිදු ජල පද්ධතින් නුවරඑළියට සුවිශේෂී වූ ගති ලක්ෂණයන් නැවත නුවරඑළියට ආවේනික ගත ලක්ෂණ මූර්තිමත් කිරීම සඳහා ඉවහල් වනු ඇත.

2. අධි උන්නතාංශ කඳු පන්තීන්

නුවරඑළිය නගරය වටා ඇති මීටර් 2000ට වඩා උස් කඳු මුදුන් කඳු වලල්ලක් ආකාරයට පිහිටා ඇති බැවින් නගරයට දර්ශනිය භූදර්ශනයක් ඇති කරනු ලැබේ. විශේෂයෙන් පිදුරුතලාගල, කිකිලියාමාන, හග්ගල කන්ද පිහිටා ඇති අතර මෙම කඳු මුදුන් ස්වභාවික වනාන්තර වලින් හා තේ වගාවන් සහිත හරිත පෙනුමක් එක් කිරීමද තවදුරටත් නුවරඑළියේ ප්‍රතිමූර්තිය වැඩි කිරිමට සහයෝගය වනු ඇත.

3. සැපදායික දේශගුණික තත්වය

සංචාරක ආකර්ෂණිය කර ගත හැකි අඩු උෂ්ණත්වයක් සහිත එනම් සාමාන්‍ය සෙ.අංශක 20ක් පැවතීම හා ඉහළ ආර්ද්‍රතාවයක් පැවතීම නුවරඑළිය පමණක් වූ ගති ලක්ෂණයකි. දකුණු ආසියාව සමඟ සැසඳීමේදි නුවරඑළිය දේශගුණය හා සමකල තත්වයක් ඇති නගරයක් නොවීම නිසාම වැඩි ආකර්ෂණයක් එයට ලැබේ. මේ තුළින් නුවරඑළිය ආවේනික ගති ලක්ෂණ මූර්තිමත් කිරීම යන අරමුණු සපුරා ගැනීමට ඉවහල් වේ.

4. පවත්නා වනාන්තර පද්ධතිය

නුවරඑළියට ආවේනික ගති ලක්ෂණ පිළිබඳ හදුනා ගැනීමේදි වනාන්තර පද්ධතිය ප්‍රධාන තැනක් ගනී. ඒ අනුව ප්‍රදේශයේ ඇති ගැල්වේස්, පිදුරුතලාගල, හග්ගල ආශ්‍රිත වනාන්තර හරිත පැහැයෙන් යුත් අලංකරණයක් නගරයට ලබා දෙයි. ප්‍රදේශයේ මුළු භූමි ප්‍රමාණයක් 34%ක් එනම් හෙක්.18 ප්‍රමාණයක් වන ගහනයෙන් යුක්ත වීම මේ අරමුණු සම්පුර්ණ කර ගැනීමට ඉවහල් වනු ඇත.

5. යටත් විජිත කාලයට අයත් වර්තමානයේ පවතින ගෘහ නිර්මාණාත්මක ගොඩනැගිලි

යටත්විජිත පාලන සමයේදී ඉදිකරණ ලද වික්ටොරියානු,ජෝජ්ීයානු හා බ්‍රිතාන්‍ය ගෘහ නිර්මාණ ශිල්පි ලක්ෂණ වලින් සමන් විත ගොනැගිලි නුවරඑළියේ අනන්‍යතාව විදහා දැක්වීමට දායක වන ප්‍රධාන සාධකයකි.එම ගොඩනැගිලි 129 පමන හදුනාගෙන ඇත.මෙය සංචාරක ආනර්ශණයට මහඟු අත්වැලකි.

රූපසටහන 5.7



තැපැල් කාර්යාලය - මෙය ප්‍රදේශයේ පවතින පැරණිතම ගොඩනැගිල්ලක් වන අතර එය පුරා විද්‍යා දෙපාර්තමේන්තුව විසින් නම් කර ඇති සංරක්ෂිත ගොඩනැගිලි ලේඛනයට ද ඇතුලත්වඇත.

රූපසටහන 5.8-



ග්‍රහනය -නිලන්ත පරණගම ,මාර්තු 2017

හිල් ක්ලබ් - නුවරඑළියෙහි ඉතා අගනා හරිත පැහැයෙන් වටවූ වටපිටාවක පිහිටි පැරණි ගොඩනැගිල්ලක් ලෙස සුප්‍රසිද්ධය.

රූපසටහන 5.10



ග්‍රහනය -නිලන්ත පරණගම ,මාර්තු 2017

සෙන්ට් සේවියර් පල්ලිය - මෙය යටත් විජිත ගෘහ නිර්මාණ ආකෘතිය අනුව 1938 දි ගොඩනැගි ඇත.

ග්‍රෑන්ඩ් හෝටලය - මෙහි මුලිකම ගොඩනැගිල්ල තනි මහලකින් යුක්ත වූ අතර එය "බාන්ස් හෝල්" නමින් 05 වන ආණ්ඩුකාර වූ සර් එඩ්වඩ් බාන්ස්ගේ නිවාඩු නිකේතනය ලෙස පාවිච්චි විය.

රූපසටහන 5.9



ග්‍රහනය -නිලන්ත පරණගම ,මාර්තු 2017

ක්වීන්ස් කොටේජ් - මෙය එංගලන්ත ප්‍රදේශය ආශ්‍රිත අංග ලක්ෂණ වලින් යුක්තව නිර්මාණය වූ නිවසක් වූ අතර එය 19 වන සියවසේ දී බ්‍රිතාන්‍ය යටත් විජිත පාලන මධ්‍යස්ථානයක් ව 1948 වන තෙක් පැවතිණි. ආණ්ඩුකාර ජනරාල් වරයාගේ නිල නිවාඩු නිකේතනය බවට පත්ව තිබූ අතර පසුව 1972 සිට ජනාධිපති මැදුර බවට පත්විය.

ග්‍රහනය -නිලන්ත පරණගම ,මාර්තු 2017

රූපසටහන 5.11



ග්‍රහනය -නිලන්ත පරණගම ,මාර්තු 2017

6. සංචාරක ආකර්ශන ස්ථාන

ප්‍රධාන සංචාරක මරමස්තානයක් ලෙස නුවරඑළිය නගරය හා ඒ අවට ඇති සංචාරක නැරඹුම් ස්ථාන නුවරඑළියට අවේනික ගති ලක්ෂණ මුර්තිමත් කිරීම

යන ඉලක්කයන් සපුරා ගැනීම සදහා මනා පිටුවහලක් වේ. ඒ අතර ග්‍රෙගරි උද්‍යානය, වික්ටෝරියා උද්‍යානය, හග්ගග උද්‍යානය, ගැල්වේස් උද්‍යානය, ගොල්ෆ් ක්‍රීඩාංගනය, හෝර්ටන් තැන්න, සඳතැන්න, සීතාඑළිය, සීතාකෝවිල, අඹේවෙල කිරි නිෂ්පාදනාගාරය කුඩාඔය ලබුකැලේ හා බොරලන්ද තේ කර්මාන්ත ශාලා හා ඒ ආශ්‍රිත තේවතු ප්‍රධාන වශයෙන් මෙම කලාපයේ පිහිටි සංචාරක ආකර්ශණීය ස්ථාන වේ. මීට අමතරව ලවර්ස්ලිප් දිය ඇල්ල, බ්‍රිතාන්‍ය යුගයට අයත් ගෘහ නිර්මාණ ශිල්පීය ලක්ෂණ සහිත ගොඩනැගිලි, මල් උද්‍යාන, තව දුරටත් සංචාරකයන්ගේ ආකර්ශන ස්ථානවේ.

මෙම ස්ථාන වල සංචාරකයන්ගේ පැමිණීම පිළිබඳ තොරතුරු පහත වගු අංක 5.6 මගින් පෙන්නුම් කෙරේ.

*වගු අංක **5.6** - සංචාරකයන්ගේ පැමිණීම පිළිබඳ තොරතුරු*

	2012	2013	2014	2015	2016
විදේශිය සංචාරකයින්					
හග්ගල	12489	14713	18071	24188	29192
හෝර්ටන්තැන්න	39123	34065	69979	87962	131670
ගැල්වේස්	82	**29**	**84**	49	198
ග්‍රෙගරි උද්‍යානය					61622
වික්ටෝරියා උද්‍යානය					47294
සඳතැන්න					8673
දේශිය සංචාරකයින්					
හග්ගල	587749	511879	578825	742133	956815
හෝර්ටන්තැන්න	184744	46511	198374	228858	319999
ගැල්වේස්	1521	1084	1669	2047	3345
ග්‍රෙගරි උද්‍යානය					721495
වික්ටෝරියා උද්‍යානය					643725

මූලාශ්‍රය : සංචාරක සංවර්ධන අධිකාරිය / නුවරඑළිය ම.න.ස

රූපසටහන **5.12**



ඒ අනුව බලන කල නුවරඑළිය ප්‍රදේශයේ ඇති සංචාරක ආකර්ශනතාවය නිසාම වාර්ෂිකව දේශිය සංචාරකයින් මිලියන එකකට ආසන්න ප්‍රමාණයක් හා විදේශි සංචාරකයන් 130000කට ආසන්න ප්‍රමාණයක් පැමිණේ.මේ තුලින් ප්‍රෙද්ශයේ ආර්ථික වර්ධනයට මනා පිටුවහලක් වන අතර වාර්ෂිකව ප්‍රෙද්ශයට රු.මිලියන 12,000 පමණ මුදලක් ඇදී එයි. ප්‍රදේශය පුරා සංචාරක හෝටල් හා ලැගුම් හල් 180 ක් පමණ ව්‍යාප්තව ඇති අතර කාමර 1600 ක් පමණ සංචාරකයින් හට සපයනු ලබන බව නුවර එළිය මහ නගර සභා වාර්තා සනාත කරයි.මෙම සංචාරක ආකර්ශනිය තාවය නිසාම ආර්ථික සංවර්ධනයට සෘජු දායක්ත්වයක් ලැබේ.මේ බව ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ 2012 වර්තාව අනුව ප්‍ර දේශයේ සේවා නියුක්තිය 20%කට ආසන්න ප්‍රමාණයක් සංචාරක ක්ෂේත්‍රෙය් සෘජු රැකියවන්හි නියුක්තිය තහවුර කර ඇත. මෙම සාධක හේතුවෙන් 2030 වන විට දිදුලන ආර්ථිකයක් ලගා කර ගැනීමේ ඉලක්කය සපුරා ගැනීමට පහසු වනු ඇත.

රූපසටහන 5.13 සංචාරක ආකර්ශන ස්ථාන



මූලාශ්‍රය : අන්තර්ජාලය ඇසුරෙන්

7. උඩරට එළවළු ගොවිතැන

විසල් නුවරඑළිය සංවර්ධන කලාපය තුළ උඩරට කෘෂිකාර්මික ඉඩම් හෙක්. 897 ප්‍රමාණයක් වගා කරනු ලැබේ. නුවරඑළිය විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයෙහි දිනකට සාමාන්‍ය නිෂ්පාදන ටොන් 150 සාමාන්‍ය වාර්ෂික ආදායම - රු. මිලියන 5250. මෙය සමස්ත උඩරට එළවළු ආදායමෙන් 23%ක් වේ.



ග්‍රහනය -නිලන්ත පරණගම ,මාර්තු 2017



9. **ප්‍රදේශයට ආවේනික වන මල් වගාව සහ මල් වර්ග**

මල් වර්ග - ජේබරා, ඩේසි, බාබන්ඩේසියා, කානේෂන්, ක්‍රිෂාන්තිමම්, ඇස්තමේරියා, ලිලී, රෝස, හයිඩ්‍රන්ජියා

වගා කරන ප්‍රදේශ - මීපිලිමාන, වජිරපුර, ලවර්ස්ලීප්, ශාන්තිපුර, කන්දේ ඇල

දළ වශයෙන් 270කට ආසන්න මල් වගාකරුවන් පිරිසක් නුවරඑළිය මල් සංගමයෙහි සාමාජිකයන් ලෙස ලියාපදිංචි වී ඇත.

රු. මිලියන 10ක පමණ ආදායමක් මාසිකව උපයා ගත හැක.

සංචාරක ආකර්ෂණය අතින් හා ආර්ථික අංශයෙන් ප්‍රධාන ස්ථානයක් ලෙස ගන්නා මෙම මල් වගාව හා සම්බන්ධව නුවරඑළිය වසන්ත කාලයේදී ප්‍රදර්ශනයන්ද පැවැත්වේ.

රූපසටහන 5.15 උඩරට මල් වගාව



මූලාශ්‍රය : අන්තර්ජාලය ඇසුරෙන්

5.2.2.දුබලතාවයන්

1. ජල මූලාශ්‍ර අපවිත්‍ර වීම

ඉහත 5.1.2 යටතේ හඳුනාගත් පරිදි ප්‍රදේශයේ පානීය හා මතු පිට ජලයේ ගුණාත්මක භාවය හිනවිම නිසාම පිරිසිදු ජල පද්ධතියක් යන නුවරඑළියට හිමි ආවේනික ගති ලක්ෂණය ඉවත් වීම කෙරෙහි බලපෑම් වී ඇත. තවදුරටත් මෙම මූලාශ්‍රයන් අපවිත්‍රවීම මේ තුළින් පරිසර පද්ධතියට හානි සිදුවීම හා ජෛව විවිධත්වයට හානි සිදුවීම මෙම අරමුණු සපුරා ගැනීම සඳහා සිදුවන බලවත් දුබලතාවයකි.

2. වනගහනය අඩුවීම හා රක්ෂිත ආක්‍රමණය

5.2.2.දුබලතාවයන්

1. ජල මුලාශ්‍ර අපවිත්‍ර වීම

ඉහත 5.1.2 යටතේ හඳුනාගත් පරිදි ප්‍රදේශයේ පානීය හා මතු පිට ජලයේ ගුණාත්මක භාවය හිනවීම නිසාම පිරිසිදු ජල පද්ධතියක් යන නුවරඑළියට හිමි ආවේනික ගති ලක්ෂණය ඉවත් වීම කෙරෙහි බලපෑම් වී ඇත. තවදුරටත් මෙම මුලාශ්‍රයන් අපවිත්‍රවීම මේ තුළින් පරිසර පද්ධතියට හානි සිදුවීම හා ජෛව විවිධත්වයට හානි සිදුවීම මෙම අරමුණු සපුරා ගැනීම සඳහා සිදුවන බලවත් දුබලතාවයකි.

2. වනගහනය අඩුවීම හා රක්ෂිත ආක්‍රමණය

වනාන්තර ගහනය හා හරිත වැස්ම නුවරඑළියේ ගති ලක්ෂණ මූර්තිමත් කරන ප්‍රධාන අංගයක් වේ. 34%ක් වූ වනාන්තර ප්‍රමාණය ඒ සඳහා ඉවහල් වී ඇති නමුත් දිගින් දිගටම වනගහනය අඩු වීමත් පෙන්නුම් කෙරේ. එය 5.1.2 විස්තර කර පරිදි 2010 දි 40%ක් හා 2017දි 34%ක් ලෙස පහත වැටී ඇත. ඒ අනුව මෙම අරමුණු සපුරා ගැනීමට මෙම වනගහනය හීන වීම තර්ජනයක් වී ඇත.

3. නුවරඑළිය ආවේනික ගෘහ නිර්මාණ ලක්ෂණ වල වෙනස්වීම.

නුවරඑළියට ආවේනික පරිසරය හා ආර්ථික සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේදී අතීතයේ සිට පැවති කොලොනියල් ගෘහ නිර්මාණ ලක්ෂණ මේ වන විට විවිධ වූ අක්‍රමවත් ගොඩනැගිලි සැලසුම් තුලින් වෙනස් වී ඇත. සංචාරක ආකර්ශනීය ආවේනික ගෘහ නිර්මාණ ශිල්පීය ලක්ෂණ නොමැති වීමෙන් එහි පෙනුම නොමැතිවීමත් සංචාරක සංවර්ධනය බාධාවක් වී ඇත.

රූපසටහන 5.16 ගෘහ නිර්මාණ ලක්ෂණ වල



ග්‍රහනය -නිලන්ත පරණගම ,මාර්තු 2017

රූපසටහන 5.17 නව ඉදිකිරීම් හේතුවෙන් දර්ශණ තල අවහිර වී ඇති අයුරු









රූපසටහන 5.18



5. අඩු ආදායම් නිවාස හා පැල්පත්

නුවරඑළිය නගර සීමාව තුළ හා ඉන් පිටත ඇති නිවාස අතරින් 21%ක ප්‍රමාණයක් ඒකාබද්ධ නිවාස පේළී නිවාස හා ලයින් නිවාස වලින් සමන්විත වේ. විශේෂයෙන් විසල් නුවරඑළිය සංවර්ධන සැලැස්ම පාදක කරනු ලබන ග්‍රාම නිළධාරී වසම් 21 තුළ නිවාස තත්වය හා එහි පදිංචි පවුල් සංඛ්‍යාව පිළිබඳ පහත වගු අංක 5.7 මගින් පෙන්නුම් කෙරේ. මීට අමතරව නුවරඑළිය මහ නගර සභා සීමාව තුල අඩු පැල්පත් නිවාස 590ක් තුල පවුල් 638ක් හා ජනගහනය 3331ක් වාසය කරනු ලබයි. මෙය සංචාරක නගරයක් වන නුවරඑළියේ පිලිඹිබුවට මෙන්ම ආර්ථික සංවර්ධනයටද බාධාවක් වී ඇත එසේම මේ තත්වය යටතේ ප්‍රදේශයේ දරිද්‍රතා මට්ටමද ඉහල ගොස් ඇත.

රූප සටහන 5.19



රූප සටහන 5.20



රූප සටහන 5.21



වගු අංක 5.7 - නිවාස වල තත්වය

ග්‍රාම නිලධාරි කොට්ඨාශ	පවුල්සංඛ්‍යාව	නිවාසසංඛ්‍යාව	නිවාස හිඟය	තනි මහල්නිවාස	මහල් 2 නිවාස	මහල් 2ටවඩා වැඩි නිවාස	ඒකාබද්ධනිවාස	මහල්නිවාස	යුගලනිවාස	ෙප්ලිනිවාස	පැල්පත්
එකතුව	11008	10784	224	6861	791	71	483	19	231	2184	144
පවත්නා නිවාස සංඛ්‍යාවේ ප්‍රතිශතයක්ලෙස			2.1	63.6	7.3	0.7	4.5	0.2	2.1	20.3	1.3

මූලාශ්‍රය : ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව



සිතියම් අංක 5.7- දරිද්‍රතා මට්ටම



5.2.3.අවස්ථා

01.ජාත්‍යන්තර වශයෙන් පරිසර සංවේදී සංචාරක සඳහා වැඩි ඉල්ලීම

වගු අංක 5.8- සංචාරක ආගමනය -අංශ අනුව

	2006	2007	2008	2009	2010	2011	2012	2013	2014	2015	2016
විනෝදාත්මක	67.4	67.1	73.2	80.0	78.9	80.4	74.4	72.7	67.95	66.6	83.4
ව්‍යාපාර	17.8	10.5	8.5	8.6	12.7	8.0	9.0	5.2	1.33	1.3	1.8
ඥාතීන් හමුවීමට	7.6	8.3	8.3	5.2	5.4	8.2	11.7	12.4	27.45	25.5	11.5
සමුළු හා රැස්වීම්	3.0	1.5	1.3	1.4	1.0	1.7	2.2	2.0	.29	.3	.8
සංස්කෘතික හා ආගමික	1.7	2.8	2.6	2.0	.8	.3	2.2	4.8	0.01	0.1	0.0
සෞඛ්‍යය									0.53	3.2	0.6
ක්‍රීඩා									0.53	0.7	0.4
රාජකාරී									0.11	0.2	0.0
වෙනත්	2.5	9.8	6.1	2.8	1.2	1.4	0.5	2.9	1.49	1.7	1.2
මුළු	100	100	100	100	100	100	100	100	100	100	100

මූලාශ්‍රය : *සංචාරක සං.අධි*

ශ්‍රීලංකාවට පැමිණෙන සංචාරකයින්ගේ අරමුණ හා කාරණය පිළිබඳව සැලකීමේදී පසුගිය වසර කිහිපය තුළ පාරිසරික හා විනෝදාත්මක කටයුතු සඳහා පැමිණෙනන්ගේ සංඛ්‍යාව වැඩි වීමක් සිදුවී ඇති බව වගු අංක 5.8 මගින් පෙන්නුම් කෙරේ. ඒ අනුව පාරිසරික වැදගත්කමක් ඇති හා විනෝදාත්මක කටයුතු වලින් සමන්විත නගරයට සංචාරකයින්ගේ පැමිණීම වැඩි ප්‍රවණතාවයක් ඇති බව මෙයින් හඳුනාගත හැක. එය ඉදිරි ආර්ථික වර්ධනයට සෘජුවම බලපානු ලබයි.

5.2.4. තර්ජන

01කාළගුණ විපර්යාස හා දේශගුණ තත්වයන් වෙනස්වීම් .

රූපසටහන 5.22- කාළගුණ විපර්යාස හා දේශගුණ තත්වයන් වෙනස්වීම්



මූලාශ්‍රය - MMI සමීක්ෂණ වාර්තාව 2016

ගෝලීය කාලගුණ තත්වය වෙනස් වීම් හේතු කර ගෙන නුවරඑළිය ප්‍රදේශයේද පවතින දේශගුණ හා කාලගුණ තත්වයන් දිර්ඝ කාලයක පරාසයක් තුළ වෙනස් වීමකට භාජනය වන බව හඳුනාගත හැක. මෙය MMI ආයතනයේ සමීක්ෂණ අනුව තහවුරු වී ඇත.





ශක්තීන් S	W දුබලතාවයන්S
1. සංචාරක ආකර්ශන ස්ථාන 2. පවත්නා බ්‍රිතාන්‍ය සම්ප්‍රධායේ ලක්ෂණ සහිත ගොඩනැගිල්ල 3. උඩරට එළවළු වගාව. 4. තේ වතු 5. නුවරඑළියට සුවිශේෂී මල් වගාව 6. ඉහළ ආදායමක් සහිත මහ නගර සභාව 7. නුවඑළිය වසන්ත සැණකෙය 8.උඩරට දුම්රිය මාර්ගය ආසන්නයේ පිහිටීම 9.ජාත්‍යන්තර වශයෙන් ප්‍රසිද්ධ සංචාරක කේන්ද්‍රස්ථානයක් වීම. 10. යෝජිත හා ක්‍රියාත්මක නව සංවර්ධන ව්‍යාපෘතීන්	1. පානීය ජලයේ අපවිත්‍රතාවය හා වියලි කාලයේ ජල හිඟයක් පැවතීම. 2. රජයේ ඉඩම් ඌණ භාවිතය 3. නුවරඑළිය අවේනික ගෘහ නිර්මාණ සහිත ගොඩනැගිලි ඉදිකිරීම් අඩු වීම. 4. නව ඉදිකිරීම් හේතුවෙන් දර්ශන තල අවහිර වීම. 5. පැල්පත් මඩුක්කුක හා අඩු පහසුකම් නිවාස පැතිරීම. 6.කෘෂි කාර්මික ඉඩම් ගොඩනැගිලි ඉදිකිරීම සඳහා භාවිතා කිරීම. 7. සංචාරකයින් සඳහා ඇති පහසුකම් අවම වීම.

5.3.දිදුලන ඉසුරුමත් පුරවරයක්

අවස්ථා O	T තර්ජන
1. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන සැලැස්ම 2017-2020 2. ශ්‍රී ලංකාවෙ යෝජිත නව අධිවේගි මාර්ග පද්ධතිය 3. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම සංවර්ධන ව්‍යාපෘති 4. ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයින්ගේ වර්ධනය	1. නව සංචාරක ආරක්ශන නගර ලෙස නුවරඑරළිය අවට නගර සංවර්ධනය වීම. (ඇල්ල, බණ්ඩාරවෙල, හපුතලේ, නල්ලතන්නිය) 2. නුවරඑළිය සඳහා ඇති පිවිසුම් මාර්ග නිතරම කාළගුණ තත්වයන් තුලදී අවධානම් වීම. 3. අප්‍රේල් මස තුල දින කිහිපයකදී පමණක් දේශිය සංචාරකයන් විශාල ප්‍රමාණයක් ඇදී ඒම.

5.3.1.ශක්තීන්

05. ආර්ථික අංශයෙන් පොහොසත් මහ නගර සභාවක් පැවතීම

නුවරඑළිය මහ නගර සභාව සතුව වාර්ෂිකව අතිරික්ත ආදායමක් සහිත වීම හේතුවෙන් නගර සීමාව තුල ප්‍රාග්ධන ආයෝජන සඳහා වැඩි ඉඩ ප්‍රශ්ථා ඇත. ඒ හේතුවෙන් නගරය තුල සංවර්ධන කටයුතු සඳහා හා අපරව්‍යුහ පහසුකම් සංවර්ධනය සඳහා මෙය බලවත් රුකුලක් වේ. පසුගිය වර්ෂ 5ක මහ නගර සභාවේ ආදායම හා වියදම මෙන්ම අතිරික්තය ප්‍රස්ථාර අංක 5.2 මගින් පෙන්නුම් කෙරේ.

*රූපසටහන අංක **5.23** - නුවරඑළිය මහ නගර සභාව වාර්ෂික ආදායම් හා වියදම්*



මූලාශ්‍රය :නුවරඑළිය මහ නගර සභාව

06.නුවරඑළිය වසන්ත සැණකෙළිය

නුවරඑළිය නගරයේ වාර්ෂිකව අප්‍රේල් මාසය තුල පවත්වන වසන්ත සැණකෙළිය සඳහා දේශිය හා විදේශය සංචාරකයන්ගේ පැමිණීම ඉහල අගයක් පෙන්නුම් කෙරේ.

ප්‍රස්ථාර අංක 5.4 මගින් අප්‍රේල් මාසය තුල සංචාරකයින් පෙන්නුනම් කරන අතර ඔවුන් සඳහා මාසය පුරාම පැතිරුණු විවිධ උත්සව හා විනෝදාත්මක අංග සංවිධානය වී ඇත. මෙම කාල සීමාවේදී ප්‍රදේශයේ සංචාරක හෝටල් ලැගුම්හල් සම්පූර්ණයෙන් පිරි පවතින අතර එය ප්‍රදේශයේ ආර්ථික සංවර්ධණය සඳහා යොදා ගත හැකි ප්‍රධානම ශක්තියක් වනු ඇත.



රූපසටහන 5.24



ග්‍රහනය -නිලන්ත පරණගම ,මාර්තු 2017

07. උඩරට දුම්රිය මාර්ගය ආසන්නයේ පිහිටීම

විසල් නුවරඑළිය සංවර්ධන සැලැසුම් ප්‍රදේශය උඩරට දුම්රිය මාර්ගය ආසන්නයේ පිහිටීම සංචාරක ආකර්ශනය වැඩිවීමට හේතු වී ඇත. විශේෂයෙන් උඩරට දුම්රිය මාර්ගයේ ඇති මනස්කාන්ත දර්ශන හේතුවෙන් සංචාරකයින් වැඩි ප්‍රමාණයක් තෝරාගනු ලබන ප්‍රවාහන මාධ්‍යයක් ලෙස දුම්රිය ප්‍රවාහන මාධ්‍ය කැපී පෙනේ. නානුඔය දුම්රිය ස්ථානය ප්‍රෙද්ශයට ආසන්න දුම්රිය ස්ථාවන වන අතර එය ප්‍රධාන ගමනාන්තයක් වී ඇත.

රූපසටහන 5.25



මූලාශ්‍රය :අන්තර්ජාලය ඇසුරෙන්

රූපසටහන 5.26



ග්‍රහනය -නිලන්ත පරණගම ,මාර්තු 2017

රූපසටහන 5.27



ග්‍රහනය -නිලන්ත පරණගම ,මාර්තු 2017

9. ජාත්‍යන්තර වශයෙන් ප්‍රසිද්ධ සංචාරක කේන්ද්‍රස්ථානයක් වීම.

නුවරඑළිය නගරය දේශිය හා විදේශිය සංචාරකයින් අතර ප්‍රසිද්ධ ප්‍රධාන සංචාරක කේන්ද්‍රස්ථානයක් වීම මෙහි සංචාරක ප්‍රවර්ධනයෙහි ලා මනා පිටුවහලක් වේ. ලෝක පාරිසරික සංචාරක ස්ථාන වල වර්ගීකරණයේදී නුවරඑළියට සුවිශේෂී ස්ථානයක් හිමි වේ. එසේම ශ්‍රී ලංකාවේ සංචාරක ස්ථාන ලෙස ද නුවරඑළිය නගරය හඳුන්වා තිබීම තව දුරටත් බලපානු ඇත.

රූපසටහන 5.28



මූලාශ්‍රය :අන්තර්ජාලය ඇසුරෙන්

10. යෝජිත හා ක්‍රියාත්මක නව සංවර්ධන ව්‍යාපෘති

නුවරඑළිය නගරය තුල වර්තමානයේ ක්‍රියාත්මක ව්‍යාපෘතින් හා යෝජිත ව්‍යාපෘතින් පිළිබඳ විස්තර වගු අංක 5.8 මගින් පෙන්නුම් කෙරේ.

වගු අංක 5.9- යෝජිත හා ක්‍රියාත්මක ව්‍යාපෘති

අංකය	ව්‍යාපෘතිය	වර්තමාන තත්වය	ආයෝජන වටිනාකම මිලියන	අයෝජන ආයතනය
1	නුවරඑළිය නව රෝහල් සංවර්ධන ව්‍යාපෘතිය	ක්‍රියාත්මකයි	14000.00	සෞඛ්‍ය අමාත්‍යාංශය
2	ග්‍රෙගරි වැව සංවර්ධන ව්‍යාපෘතිය	ක්‍රියාත්මකයි	450.00	නා. සං.අධි/ නු. මහ. නගර සභාව
3	ඉහල උන්නතාංශ ක්‍රීඩා සංකීර්ණය	යෝජිතයි	12000.00	ක්‍රීඩා අමාත්‍යාංශය / පුද්ගලික ආයෝජන
4	නුවරඑළිය මධ්‍යම වෙළඳපොල සංවර්ධනය	ක්‍රියාත්මකයි	450.00	නා. සං.අධි/ නු. මහ. නගර සභාව
5	වතුසේවක නිවාස සංවර්ධන ව්‍යාපෘතින්	ක්‍රියාත්මකයි	-	වතු යටිතල පහසුකම් අමාත්‍යාංශය
6	ඕක්ලි කොටේජ් ඉකෝවිලා කොටේජ්ව්‍යාපෘතිය	යෝජිතයි	-	නා.සං.අධි
7	මධ්‍යම පාන්තික නිවාස ව්‍යාපෘතිය	යෝජිතයි	-	-
8	ඕෂන් විව් මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය	යෝජිතයි	-	-
9	නුවරඑළිය තේමා උද්‍යාන ව්‍යාපෘතිය	යෝජිතයි	-	-
10	මධ්‍යම අප ජලපිරිපහදු ව්‍යාපෘතිය	යෝජිතයි	-	-

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය - නුවරඑළිය

මෙම ප්‍රධාන ව්‍යාපෘතින් ප්‍රදේශයේ දිදුලන ආර්ථිකයක් ඇති කිරීම සඳහා වන ප්‍රධාන පිටුවහලක් වනු ඇත.



5.3.2.දුර්වලතා

07. සංචාරකයින් සඳහා ඇති පහසුකම් අවම වීම.

ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයින් සලකා බැලීමේදි 2016 වසරේදි මිලියන 02ක් පමණ වන අතර, 2016 වසරේ සංචාරක මණ්ඩල ප්‍රගති වාර්තාව අනුව ඉන් 7.5%ක සංචාරකයින් ප්‍රමාණයක් මධ්‍යම කඳුකරයේ සංචාරය කරනු ලබයි.

එසේම ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයින් අතරින් වැඩිම ප්‍රමාණයක් විනෝදාස්වාද කටයුතු සඳහා පැමිණෙන සංචාරකයින් වේ. එය 2016 වසරේදි 23% , 2015 දී 66%ක් ලෙස දැක්වේ.

මේ අනුව නුවරඑළියට වැර්ෂිකව පැමිණෙන සංචාරකයින්ගේ ප්‍රමාණය දළ වශයෙන් 2016 වසරේ දී දේශිය 950,000 හා විදේශිය 135,000 වන අතර වර්තමානයේ නුවරඑළිය ප්‍රදේශයේ පවතින පහසුකම් මෙම සංචාරකයින් සඳහා හා ඉදිරියේ සංචාරක ප්‍රවර්ධන කටයුතු සඳහා ප්‍රමාණවත් නොවීම ගැටළු තත්වයකි.

5.3.3. අවස්ථා

1. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන සැලැස්ම 2017-2020

සංචාරක සංවර්ධන අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කිරීමට යෝජිත ශ්‍රී ලංකාවේ සංචාරක සංවර්ධන සැලැස්ම සඳහා හදුනාගත් ප්‍රධාන නගරයක් ලෙස නුවරඑළිය නගරයද නම් කර ඇත. එය ද නුවරඑළියේ සංචාරක සංවර්ධන සඳහාද ප්‍රධාන පිටුවහලක් වේ.මෙම සැලැස්ම යටතේ හදුනාගත් සංචාරක කලාප අතරින් පළමු අදියරයේදී ක්‍රියාත්මක කිරීම සඳහා නුවරඑළිය නගරයද තෝරගෙන ඇත.

රූප සටහන ***5.29***



2. ශ්‍රී ලංකාවේ යෝජිත නව අධිවේගී මාර්ග පද්ධතිය

*රූපසටහන **5.30***



මූලාශ්‍රය : අන්තර්ජාලය ඇසුරෙන්

මාර්ග සංවර්ධන අධිකාරිය මගින් යෝජනා කර ඇති නව අධිවේගී මාර්ග පද්ධතිය අනුව නුවරඑළිය ආසන්නයේ එනම් මහනුවර, හා මත්තල ගමනාන්තය දක්වා අධිවේගී මාර්ග යෝජනා කර ඇති බැවින්ද රත්නපුර නගරය දක්වා අධිවේගී මාර්ග යෝජනා කර ඇති බැවින්ද ඉතා කෙටි කාලයකින් එම ගමනාන්ත නගරවල සිට නුවරඑළිය නගරයට ලගා වීමේ පහසුකම ඇත. මෙය නුවරඑළිය පැමිණෙන සංචාරකයින් සඳහා මෙන්ම නුවරඑළියේ නිෂ්පාදන භාහිර ප්‍ර දේශ සඳහා ප්‍රවාහනය කිරීමේ පහසුවන උපාය මාර්ගයකි.

3. කෘෂි කර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම සංවර්ධණ ව්‍යාපෘතිය

කෘෂිකර්ම දෙපාර්තමේන්නව හා ඒ ආශ්‍රිත ආයතන මගින් 2017-2020 කේන්ද්‍ර කර ගත් නව කෘෂිකර්ම සංවර්ධන සැලැසුම් හා ව්‍යාපෘතින් කෘෂිකර්මාන්තයේ වැඩි දියුණුවටත් ඉහල අස්වැන්නක් ලබා ගැනීමටත් මනා පිටුවහලක් වේ.

4. ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයින්ගේ වර්ධනයවාර්ෂිකව ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයින් ප්‍රමාණය වර්දනය වීමක් පෙන්නුම් කරන අතර ඒය ප්‍රස්ථාර අංක 5.3.හා 5.4 මගින් පෙන්නුම් කරන අතර එමගින් වැඩි සංචාරකයින් ප්‍රමාණයක් නුවරඑළිය ප්‍රදේශයට අද්දවා ගැනීමටද පිටුවහලක් වේ.

*රූප සටහන **5.31** - සංචාරක ආගමනය*



*රූප සටහන **5.32**- සංචාරක කර්මාන්තයේ වර්ධනය*



*රූප සටහන **5.33** - සංචාරක ආගමනය*

Market Growth Trends by Nationality - Growth Indices (Average 1963/1966 = 100) - 2006 to 2016

Table (a)

Market	2006	2007	2008	2009	2010	2011	2012	2013	2014	2015	2016	Average Annual Growth Rates
Western Europe	2,917	2,498	2,115	2,171	3,255	4,088	4,820	5,337	6,363	7,647	8,613	29.6
Asia	4,024	3,338	2,926	2,900	4,087	5,559	6,382	8,775	10,644	10,644	14,686	28.6
North America	1,014	806	660	712	1,153	1,525	1,612	1,990	2,065	2,614	3,216	7.2
Australasia	2,954	2,728	2,752	3,087	4,392	6,099	5,936	8,576	8,444	8,588	11,033	25.0
Others	3,536	5,749	6,492	6,507	9,461	11,980	17,092	23,193	30,450	30,776	30,776	54.0
All Markets	2,943	2,598	2,306	2,355	3,442	4,501	5,288	6,703	8,031	9,457	10,785	26.2

5.3.4.දුර්වලතා

1. නව සංචාරක ආකර්ශන නගර ලෙස නුවරඑළිය නගරය අවට නගර සංවර්දනය වීම.

   නුවරඑළිය නගරය අවට ප්‍රධාන සංචාරක නගර ඇල්ල බණ්ඩාරවෙල, හපුතලේ තහා නල්ලලතන්නිය නගර හදුනා ගත හැකි අතර ඒවායන්හි විදේශිය සංචාරකයින්ගේ ආකර්ශනය පසුගිය වසර වල සාපෙක්ෂව වැඩි වී ඇත. එය නුවරඑළිය නගරයට බෙහෙවින් බලපාන තර්ජනයක් වනු ඇත.

2. නුවරඑළිය නගරය සඳහා ඇති පිවිසුම් මාර්ගය කාළගුණික තත්වයන් වලදී අවධානම් සහගත වීම.

   නුවරඑළිය නගරයට ලගාවීම සඳහා ඇති ප්‍රධාන පිවිසුම් මාර්ග වල අවිස්සාවෙල්ල, හැටන් මාර්ගය, මහනුවර ගම්පොල මාර්ගය හා බදුල්ල වැලිමඩ මාර්ගය අධික වර්ෂා සමයන්හිදී දැඩි මීදුම් සහිත වීම හා නාය යෑමේ අවධානයට ලක් වීම නිසා සංචාරකයින්ගේ ආගමනය අඩු වී ඇත.

රූපසටහන 5.34

Nuwara Eliya district prepares to face landslides

By Shelton Hettiarachchi

With heavy rains expected in the next few months, the Government Agent and authorities in the Nuwara Eliya district are gearing up to face the possibility of landslides and other possible disasters in the Walapane area.



February 2011: The road close to Sri Sumangala Vidyalaya caved in due to heavy rains

In November 2007 the rains left eleven dead and three persons went missing in the Walapone and Hanguranketa divisions of the district. The area is also prone to landslides. In 1983 thirteen persons died in landslides at Ketayapathana, while Wathumulla was affected by landslides in 2006 and in 2007.

The Red Cross and a number of other NGOs continue to provide relief to victims of these landslides. To face this situation the Red Cross has identified a number of vulnerable areas and commenced setting up centres to house victims of landslides in addition to training community based organisations in disaster management.

Ven. Kudaligamuawe Seelavimala Thera of the Subodharamaya said the Red Cross had helped victims of the 2007 landslide. The Principal of the Pussadeva MMV A.K.R.M Dayarathne, said the Red Cross had trained the students of his school to help victims of such disasters.

He added in the event of earth slips or landslides his school would be used as a disaster management centre and a centre to house the victims. The school can house up to 3,000 victims he said. Mr. Dayarathne added the ICRC had undertaken to build a wall around the school for security reasons and provided first aid training to students to help victims of disasters.

He said the school also had adequate communication facilities but added it needed a stand-by electricity generator now that it had been designated a disaster management centre.



මූලාශ්‍රය : අන්තර්ජාලය ඇසුරෙන්

3. අප්‍රේල් මාසයතුල දින කිහිපයක තුල පමණක් දේශීය සංචාරකයන් විශාල ප්‍රමාණයක් ඇදී එම.

නුවරඑළිය වසන්ත සැණකෙළිය තුලදී දේශීය සංචාරකයින්ගේ පැමිණීම ඉහල අගයක් පෙන්නුම් කරන අතර (වගු අංක 6.5) අප්‍රේල් මස 10, 20 අතර කාලය තුල දෛනික සංචාරක ගහනය 100000- 150000 අතර වේ. මෙය ඔවුන් සදහා පහසුකම් සැපයීමේදී ප්‍රධාන ගැටලුවක් වන අතර තදබදය අඩු පහසුකම් හේතුවෙන් නැවත ඔවුන්ගේ පැමිණීම හීන කරයි.

රූපසටහන 5.35- සංචාරක පැමිණීම - නුවරඑළිය



මූලාශ්‍රය : සංචාරක සංවර්ධන අධිකාරිය / නු.එ. ම.න.ස

පරිච්ඡේදය 6

සාරාංශය



6.1. සංකල්පමය සැලැස්ම

6.1.1 හැඳින්වීම

නුවරඑළියට අවේනික සංවේදි පරිසර පද්ධතිය ආරක්ෂා වන ආකාරයට ඒ වටා ඇති වනාන්නතර සහිත කදු පන්නින් ආරක්ෂා කිරීමටත් ඒ හා බැදුනු ජල මූලාශ්‍ර පද්ධතින් ආරක්ෂා කිරීමටත් පෙර දැරි කරගත් සැලසුම් සංකල්පයන් මෙම සංවර්ධන සැලැස්ම මගින් අපේක්ෂා කෙරේ.

මෙම නගරය වටා ඇති කිකිළියාමාන, සිංගල් ට්‍රී, මාගස්තොට, සීතාඑළිය, ලවර්ස්ලීප්, පිදුරුතලාගල ආශ්‍රිත වනාන්තර අධි සංවේදි හරිත කලාපයක් ලෙස පවත්වා ගෙන යාමටත් එයින් පෝෂණය වන නානුඔය ඇල, තලගල ඇල, බ්‍රුක්ප්ලේන් ඇල හා ප්‍රධාන ඇල මාර්ග හා ඒ ආශ්‍රිත අතුරු ඇල මාර්ග හා ග්‍රෙගරි වැව, බ්‍රුක්ප්ලේන්, කටුමාන, ජලාශ වල පිරිසිදු උසස් ජල පද්ධතියක් ඇති කිරීමටත් ඒ වටා ඇති සංවේදි පරිසරය සමගින් නේවාසික, සංචාරක ජනතාව උදෙසා විනෝදාත්මක කලාප හා සංචාරක කලාප මගින් තීරසාර සංවර්ධනයක් ප්‍රදේශයට ලගා කර ගැනීමත් මෙම සැලැස්ම මගින් අපෙක්ෂා කෙරේ. එසේම නේවාසික ජනයාටම මෙන්ම සංචාරක ජනතාවට අවශ්‍ය වාණිජ අනෙකුත් සමාජීය ආර්ථික අපරව්‍යුහ පහසුකම් නගර මධ්‍ය කේන්ද්‍ර කර ගනිමින් සැපයීමටත් හාවාඑළිය, බඹරකැලේ, මිපිලිමාන, කටුමාන ආශ්‍රිත මිශ්‍ර නේවාසික භාවිතය වැඩි කිරීමටත් නුවරඑළිය ආවේනික උඩරට කෘෂිකාර්මික භාවිතය එලෙසම පවත්වා ගැනීමටටත් එමගින් සිදුවන පාරිසරික හානිය අවම කිරීමත් සමබර සංවර්ධනයකින් යුක්ත පාරිසරික උද්‍යානයක් ලෙස පවත්වා ගැනීමටත් මෙම සංකල්පය අතර වේ.



විසල් නුවරඑළිය සංකල්පීය සැලැස්ම



6.2 යෝජිත ඉඩම් පරිහරණ සැලැස්ම

නුවරඑළිය නගරය හා ඒ අවට කලාපයන්හි භූගෝලීය පිහිටීමත් පාරිසරික සංවේදිතාවයත් මෙන්ම ආකර්ෂණීය හා අද්විතීය පාරිසරික ලක්ෂණයන්ගෙන් සමන්විත වීමත් නිසාම සංචාරක ආකර්ෂණයට බෙහෙවින් පාත්‍රවී ඇත. එසේම මෙම දේශගුණික ලක්ෂණ නිසාම උඩරට එළවළු වගාවත්, තේ වගාවත් ප්‍රදේශයේ ඇති ප්‍රධාන සම්පත් වේ. මේ අනුව නුවරඑළිය ප්‍රදේශයේ ආර්ථිකය, සංචාරක, උඩරට එළවළු හා තේ වගාව ප්‍රධාන කර ගනිමින් ගොඩනැගී ඇති අතර පාරිසරික සමබරතාව මෙම අංශය කෙරෙහි මනාව බලපානු ලැබේ.

ඒ අනුව "මිහිදුම් කඳුකරයේ පාරාදීසය" ලෙස දැක්මක් සහිතව සමබර තිරසාර පරිසර හිතකාමී සංවර්ධනයක් තුළින් ඉදිරි ඉලක්ක ජය ගැනීමට අපේක්ෂා කෙරේ.

ඒ අනුව යමින් පරිසර සංවේදී වනාන්තර පද්ධති, ජල මූලාශ්‍ර හා සබැඳි අනෙකුත් ස්ථාන ආරක්ෂා වන ආකාරයටත් සංචාරකයින් හට උපරිම පහසුකම් සැපයීම සඳහා වැඩි සංචාරක ආකර්ෂණ ප්‍රදේශ හඳුනාගැනීම හා ඔවුන්ගේ විනෝදාත්මක පහසුකම් සඳහා ප්‍රදේශ විශේෂ කොට ගෙන සංවර්ධන උපාය මාර්ග හා ව්‍යාපෘතීන් හඳුනාගෙන ඇත. එසේම පදිංචි හා නේවාසික ජනාතවගේ පහසුකම් වැඩිදියුණු කරමින් සංචාරක කෘෂිකාර්මික ක්ෂේත්‍රයන්ගෙන් ඔවුනට ලැබෙන ආදායම් වැඩිකිරීම තුළින් ආර්ථික වර්ධනයක් ඇති කිරීමත් සඳහා ඉදිරි භූමි පරිහරණ රටාව හඳුනාගෙන ඇත. ඒ සඳහා කලාපකරණය, උපාය මාර්ග හා ව්‍යාපෘතීන් මෙන්ම රෙගුලාසි ද හඳුන්වා දෙනු ලැබේ.

සිතියම් අංක 6.2 - යෝජිත ඉඩම් පරිහරණ සැලැස්ම



සිතියම් අංක 6.2 - යෝජිත ඉඩම් පරිහරණ සැලැස්ම



නුරන තරන පිටිය හරහා හරස් කැපුම





6.3.ආර්ථික සංවර්ධන උපාය මාර්ග

6.3.1. හැඳින්වීම

විසල් නුවරඑළිය සංවර්ධන කලාපය තුළ ආර්ථික උත්පාදන මාර්ග ලෙස ප්‍රධාන වශයෙන් සංචාරක කර්මාන්තයත්, උඩරට එළවළු වගාව, තේ ප්‍රධාන තැනැක් ගනි.

සංචාරක ව්‍යාපාරය දේශිය හා විදේශිය සංචාරකයින් ලෙස දෙපිරිසකින්ගෙන් සැදුම්ලත් අංශයක් විම කැපී පෙනෙන ලක්ෂණයක් වේ. වාර්ෂිකව විදේශිය සංචාරකයින් 147470ද දේශිය සංචාරකයින් 1.400.000 ප්‍රදේශයට ඇදි එන අතර, ශ්‍රී ලංකාවට පැමිණෙන සමස්ත විදේශිය සංචාරකයින්ගෙන් 6%ක ප්‍රතිශතයක් නුවරඑළිය ප්‍රදේශයට පැමිණෙයි.

විදේශිය සංචාරකයින් මගින් ප්‍රදේශයට වාර්ෂිකව රු.මි. 6300.00 ආදායමක් ලැබෙන අතර එය සමස්ත දේශිය සංචාරක ආදායමෙන් 1.%ප්‍රතිශතයක් වේ.

දේශිය සංචාරකයින්ගෙන් වාර්ෂිකව රු.මි 5500පමණ ආදායමක් ප්‍රදේශයට උකහා ගනි. සංචාරක ක්ෂේත්‍රයේ පදනම් කර ගත් සංචාරක හෝටල් හා ලැගුම්හල් 180 න පමණ ප්‍රමාණයක ප්‍රදේශයේ ඇති අතර එහි සමස්ත කාමර ප්‍රමාණය 1500 ආසන්න ප්‍රමාණයක් වේ. මෙමගින් සෘජු රැකියා ද වක්‍රව ප්‍රමාණයක්ද බිහිවි ඇත. විශේෂයෙන් සංචාරක හෝටල් ආශ්‍රිතව, මග පෙන්වන්නන්, විනෝදාස්වාදක සේවා සපයන්නන් සහ අනෙකුත් සේවා සපයන්නන් මෙම රැකියා උත්පාදනයේදි ප්‍රධාන තැනක් ගනි.

2028 වන විට ශ්‍රී ලංකාවට වාර්ෂිකව පැමිණෙන විදේශිය සංචාරකයින්ගෙන් 10%ක් ප්‍රමාණයක් එනම් 650000. ක හා දේශිය සංචාරකයින මිලියන 4 ක්. ද වාර්ෂිකව ප්‍රදේශයට අද්දවා ගැනීම, දල සංචාරක රාත්‍රි ගණන 2 සිට 4 දක්වා වැඩි කිරීමට ද මෙම සංවර්ධන සැලැස්මෙන් අපේක්ෂා කරන ප්‍රධාන අරමුණක්වේ.

උඩරට එළවළු වගාව ආශ්‍රිතව දෛනික එළවළු ටොන් 125-150ත් අතර ප්‍රමාණයක් බැහැරට ප්‍රවාහනය කරනු ලැබේ. විසල් නුවරඑළිය සංවර්ධන කලාපය තුළ උඩරට කෘෂිකාර්මික ඉඩම් හෙක්. 897 ප්‍රමාණයක් වගා කරනු ලැබේ. මෙමගින් වාර්ෂික දල එළවළු ආදායම මිලියන 4200. පමන ලැබේ. එසේම නුවරඑළිය කේන්ද්‍රකර ගත් නුවරඑළිය විශේෂ ආර්ථික මධ්‍යස්ථානය හරහා වාර්ෂිකව මිලියන 5000ක පමණ ආදායමක් ප්‍රදේශයට ගලා එයි. මෙය සමස්ත උඩරට එළවළු ආදායමෙන් 23%ක අගයක් ගනි.

එසේම තේ වගාව මගින්ද ආර්ථිකය සවිමත් කරනු ලබන අතර සංචාරක ක්ෂේත්‍රය සඳහාද මෙමගින් සහයක් හිමිවේ. විසල් නුවරඑළිය සංවර්ධන කලාපය තුළ තේ හෙක්ටයාර් 1332. ක ප්‍රමාණයක් ඇති අතර එය සමස්ත භූමි ප්‍රමාණයෙන් 23% වේ. මෙම තේ කර්මාන්ත ආශ්‍රිතව වතු සේවකයින් 2550 ප්‍රමාණයක් නිරතව සිටියි. වාර්ෂිකව රු. මිලියන 250 පමන ආදායමක් ප්‍රදේශයේ තේ වගාව මගින් ලැබෙන අතර සමස්ත ශ්‍රී ලංකා තේ ආදායමෙන්0.01% වේ.

මීට අමතරව කිරි ගව පාලනය හා මල් වගාවද ආර්ථික උත්පාදන මාර්ගයක් ලෙස කැපි පෙනේ. විසල් නුවරඑළිය සංවර්ධන කලාපය තුළ කිරි ගොවීන් 54 වාර්තා වන අතර ඔවුන් ගේ වාර්ෂික ආදායම දල වශයෙන් රු.මි.65 පමණ වේ.

එසේම ප්‍රදේශයේ ආවේනික මල් වගාකරුවන් 270 වාර්තා වන අතර ගෙවතු ආශ්‍රිතව ද මල් වගාව බහුලව දක්නට ලැබේ. වාර්ෂිකව රු.මි.6 ක මුදලක් මල් වගාව මගින් නුවරඑළියට ලැබෙන අතර

ප්‍රධාන වශයෙන් ශාන්තිපුර, ලවර්ස්ලීප්, මිපිලිමාන බොරලන්ද ප්‍රදේශ ආශ්‍රිතව මල් වගාව බහුලව ඇත.

සංචාරක ව්‍යාපාරය ප්‍රමුඛ කරගත් විසල් නුවරඑළිය කලාපයතුල ප්‍රධාන ආර්ථික උත්පාදන මාර්ගය ලෙස සංචාරක ක්ෂේත්‍රය හදුනාගෙන ඇති අතර ඒ බැදුනු සංවර්ධන උපාය මාර්ග තුළින් ප්‍රධාන ඉලක්කය වන දිදුලන ආර්ථිකයක් සදහා මහෝපකාරී වේ. එසේම වැඩි සංචාරක ආකර්ශනයක් තුලින් මෙමගින් අපේක්ෂා කරන අරමුණු වන ශ්‍රී ලංකාවට පැමිණෙන සමස්ත විදේශ සංචාරකයින්ගෙන් 10% නුවරඑළියට අද්දවා ගැනිමටත් දළ සංචාරක රාත්‍රී ගණන 4ක් ලෙස වැඩි කර ගැනිමටත් මහෝපකාරී වේ.

6.3.2. උපායමාර්ග

01. සංචාරක පහසුකම් සංවර්ධනය හා සංචාරක ආකර්ශනීය ස්ථාන ප්‍රවර්ධනය සදහා වන උපාය මාර්ග

නුවරඑළිය ආර්ථිකයේ ප්‍රධාන මුලාශ්‍රය වන සංචාරක ක්ෂේත්‍රයේ වර්ධනය උදෙසා මෙම උපාය මාර්ගය මගින් බලාපොරොත්තු වනු ලැබේ. 2028 වන විට දෛනික අපේක්ෂා සාමාන්‍ය සංචාරකයින් ගණන 25,000ක් වන අතර එහි උපරිම දෛනිකව 50000ක් වනු ඇත. එසේම දිදුලන ආර්ථිකයක් හා ඉලක්ක සපුරා ගැනීම උදෙසා සංචාරක ක්ෂේත්‍රයේ වර්ධනය අත්‍යාවශ්‍ය සාධකයකි. එසේම දැනට පවතින සංචාරක රාත්‍රී ගණන සමාන්‍ය දින 2ක් වන අතර දින 4ක් දක්වා වැඩි කිරීම උදෙසා වන අරමුණුද වාර්ෂිකව නුවරඑළියට පැමිණෙන විදේශ සංචාරකයින් ගණන ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයින් 12%ක ප්‍රතිශතයක් ගෙන්වා ගැනිම සදහා වූ අරමුණද සම්පූර්ණ කර ගැනීම මෙම උපාය මාර්ග මගින් අපේක්ෂා කෙරේ.

ඒ අනුව මෙහි ග්‍රෙගරි වැව අවට කලාපය අංග සම්පූර්ණ සංචාරක විනෝදාත්මක කලාපයක් බවට පත් කිරීම හා සංචාරකයින් සදහා ක්‍රියාකාරකම් වැඩි කිරීම මෙමගින් අපේක්ෂා කෙරේ. ග්‍රෙගරි වැව ඉහල කොටසේ තේමා උද්‍යානයක් ඉදිකිරීම, ග්‍රෙගරි වැව වටා පදික, පාපැදි මන්තීරු සංවර්ධනය, ඉහල වැව පාර ආශ්‍රිතව මෝටර් සයිකල් හා මෝටර් රථ තරග ධාවන පත සංචාරක පහසුකම් මධ්‍යස්ථාන ඇති කිරීම ග්‍රෙගරි වැව විනෝදාත්මක කලාපය හා නගර මධ්‍යයේ වාණිජ කාලප අතර තිරසර ප්‍රධාන ක්‍රමයක් ලෙස ඇවිදීමේ මන්තීරු හා පා පැදි මන්තිරු ඉදිකිරීම තුලින් ග්‍රෙගරි වැව අවට කලාප තුල නුවරඑළියට පැමිණෙන සංචාරකයින් හට වැඩි ක්‍රියාකාරකම් බහුල ව්‍යාපෘති හදුන්වාදීමෙන් දේශිය සංචාරකයින් වැඩිකාලයක් රදවා ගැනීමටත් වසර පුරා විහිදුණු සංචාරක ආගමනයක්ද බලාපොරොත්තු විය හැකිය.

අලුත් සංචාරක ආකර්ශනය කර ගැනීම සමස්ථ සංචාරකයින් 12%ක් නුවරඑළියට අද්දවා ගැනීම සදහා වූ අරමුණ ඉටුකර ගැනීමක් වේ. එහි ආකර්ශනය වැඩි වන ආකාරයක් නව මහ පරිමාණ, මධ්‍යම හා කුඩා ව්‍යාපෘතියක් හදුන්වාදෙනු ලැබේ. ඒ අනුව නුවරඑළිය තුරඟ තරග පිටිය ආශ්‍රිතව ඉහල උන්නතාංශ ක්‍රීඩාංගනය ඉදිරි වසර 3 තුලදී ඉදිකිරීම මගින් දකුණු ආසියාවේම ඉහල උන්නතාංශයක් යටතේ ක්‍රීඩා පුහුණු සදහා ඉඩ ප්‍රස්ථා මෙම නගරයෙන්න් බිහිවේ. එය නව සංචාරකයන් වාර්ෂිකව 15,000ක ප්‍රමාණයක් ආකර්ශනය කර ගැනීමට මේ අනුව මෙම ප්‍රමාණය වර්තමාන සංචාරක ආගමනය 1% පමණ වර්ධනය කර ගැනීමට උපකාරිවන උපාය මාර්ගයකි. තවදුරටත් සංචාරක ආකර්ශනය කිරීමේ උපායමාර්ගයක් ලෙස දුම්රිය ස්ථානයේ සිට සිංගල් ට්‍රී කඳුපන්තිය හරහා ග්‍රෙගරි වැව කලාපයට හා නගර මධ්‍ය වෙත ලවර්ස්ලිප් දිය ඇල්ල ඇති කලාපය වෙනත් කේබල් කාර් ව්‍යාපෘතියක් ඇති කිරීම සංචාරකයින් ඉලක්ක කර ගත් ආයුර්වේද ප්‍රතිකාර හා පරිසර වින්දනීය මධ්‍යස්ථානයක් ඇති

කිරීම ප්‍රධාන වේ. වර්තමානයේ දේශිය හා විදේශිය සංචාරකයින්ගේ වැඩි කැමැත්තක් ඇති ආයුර්වේද තෙරපි හා ප්‍රතිකාර මධ්‍යස්ථානයක් ඇති කිරීම තුලින් අමතර සංචාරක ප්‍රමාණයක් අද්දවා ගැනිමට ඉවහල් වනු ඇත.

එසේම ලවර්ස්ලිප් කිකිලියාමාන කදු ආශ්‍රිතව කදු තරණය කිරීම සදහා ක්‍රියාකාරකම් ඇති කිරීම වනාන්තර මායිමේ ඇවිදීමේ මන්තීරු හදුන්වා දිම ශාන්තිපුර සිංගල් ට්‍රී කදු මුදුන් වල ආශ්‍රිතව නැරඹීම් කුළුණු ඉදිකිරීම වැනි කදු ආශ්‍රිතව සංචාරක ක්‍රියාකාරකම් වැඩි දියුණුකිරීම තුලින්ද වැඩි සංවර්ධන ප්‍රමාණයක් ආකර්ශනය කර ගැනීමක් සංචාරක දිනගණන වැඩි කර ගැනීමටත් ඉවහල් වනු ඇත.

බැරක්ප්ලේන් ජලාශය ග්‍රෙගරි වැව විනෝදාත්මක කලාපය ආකාරයටම විනෝදාත්මක කලාපයක් ලෙස සංවර්ධනය කිරීමටත් එම කලාප දෙක අතර පදික හා පාපැදි තුලින් සම්බන්ධ කිරිම සංචාරක ක්‍රියාකාරකම් වැඩි කිරීමද ඉවහල් වේ. නගර මධ්‍යයේ සංචාරක ඉලක්ක කර ගත් විවෘත ආපනශාලාවක් ඇති කිරීම, වික්ටෝරියා උද්‍යානය තුල ඉටි පිළිම හා මල් පැල ප්‍රදර්ශනාගාර ඇති කිරීම මෙන්ම සීතා දේවීකෝවිල ආශ්‍රීත ඉන්දීය සංචාරකයින් සදහා වූ පහසුකම් සපයන කලාපයක් ඇති කිරීම තුලින් සංචාරක අපර ව්‍යුහ පහසුකම් වර්ධනයද යුනික්විව් අධි සත්ව සංචාරක කලාපය තුල රාත්‍රී ක්‍රියාකාරකම් සදහා රෙගුලාසි ලිහිල් කිරීම මගින් කැරොකේ, රාත්‍රී සමාජ ශාලා සම්ඵාහන මධ්‍යස්ථාන වැනි ඉඩ ප්‍රස්ථා ලබා දීම තුලින් සංචාරකයින් හට වැඩි කාලයක් ගත කිරීම උදෙසා වන ක්‍රියාකාරකම් ඇති වනු ඇත. එසේම නගර මධ්‍යයේ ධර්මපාල වටරවුම් ග්‍රෑන්ඩ් හොටෙල් පාර ආශ්‍රිතව පදික මන්තීරු බයිසිකල් ධාවන පත ඉදිකිරීමද මෙම සංචාරක ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීමට හේතුව වනු ඇත.

02. සංචාරක අපරව්‍යුහ පහසුකම් සංවර්ධනය

මෙම විසල් නුවරඑළිය සංවර්ධන සැලැස්ම මගින් හදුන්වා දෙන ලද ප්‍රධාන ආර්ථික මුලය වශයෙන් සංචාරක කර්මාන්තය මත මෙම සංවර්ධන සැලැස්ම මගින් හදුනාගෙන ඇති අනෙකුත් සේවා මාර්ග සංවර්ධන ආශ්‍රිත අපරව්‍යුහ පහසුකම්ද සෘජුව හා වක්‍රව දායක වේ. ඒ අනුව මාර්ග ජලය මල අපද්‍රව්‍ය සඳහා හදුනාගන්නා ලද උපාය මාර්ග සෘජුව සංචාරක වර්ධනයට පිටුවහලක් වේ. විශේෂයෙන් පානීය ජලයේ ගුණාත්මක තත්වය වර්ධනය කිරීම මගින් සංචාරකයින් හට විශ්වාසනීය ජල සැපයුමක් සැපයීම තුලින් සංචාරක පැමිණිමේ වර්ධනයක් මෙන්ම ඔවුන්ට සපයන සේවාවේ ගුණාත්මක තත්වය වර්ධනයටද හේතුවක් වනු ඇත.

මධ්‍යගත මල අපවහන පද්ධතියක් ඇති කිරීම තුලින් පාරිසරික සුරක්ෂිත තාවය මෙන්ම ජල පද්ධතිය අපවිත්‍ර වීම වැලැක්වීම තුලින් පිරිසිදු පරිසරය හේතුවෙන් එයද සංචාරක ක්ෂේත්‍රයේ ප්‍රගමනයට මෙන්ම ආර්ථික සංවර්ධනයටද වක්‍රව බලපානු ලැබේ.එසේම කලාපකරන රෙගුලාසි මගින් අධිසඟත්ව සංචාරක කලාපයක් ඇති කිරීම තුල සංචාරක ඉලක්ක කරගත් කාර්යයක් සඳහා ප්‍රමුඛතාවය ලබා දීම තුලින් සංචාරක ක්ෂේත්‍රයේ ප්‍රගමනයට හේතු වනු ඇත.

භූදර්ශන අලංකරණ උපාය මාර්ග තුලින් පාරිසරික සුන්දරත්වය වැඩි දියුණු කිරීම හරහා තව දුරටත් සංචාරක ආරක්ශනය වැඩි කිරීමට හේතුවනු ඇත. මෙම සංවර්ධන සැලැස්ම මගින් පාරිසරික සුරක්ෂිත තත්වය මෙන්ම සංවර්ධනය උදෙසා රෙගුලාසි හා උපාය මාර්ග හදුන්වා දෙනු ලැබේ. එම උපාය මාර්ගද වක්‍රව සංචාරක ක්ෂේත්‍රය මෙන්ම ආර්ථික වර්ධනයටද බලපානු ලැබේ.

03. උඩරට එළවළු වගාව තුලින් ආර්ථිකය සවිමත් කිරීම.

උඩරට එළවළු වගාව තුලින් වර්තමානයේ නුවරඑළිය ආර්ථික වර්ධනය සිදු කරන දායකත්වය අඛණ්ඩව තබා ගැනීම තව දුරටත් ඉහල ආදායමක් ඒ තුළින් අද්දවා ගැනීමටත් මේ තුලින් සිදුවනු ඇත. දිවයිනේ විවිධ ප්‍රදේශ වෙත නුවරඑළිය සිට උඩරට එළවලු ප්‍රධානය කරනු ලබන අතර මෙය දෛනිකව ටොන් 100-150ක් වන ප්‍රමාණයක් වේ. කෙසේ වෙතත් මෙම එළවළු ගොවිපලෙන් ලබා ගන්නා ආකාරයටම සෘජුවම ප්‍රවාහනය කරන අතර සැකසුම් කිරීමකින් හෝ පිරිසිදු කිරීමකින් තොරව ප්‍රවාහනය කරනු ලැබේ. මෙම උපාය මාර්ග මගින් සකසන ලද හා පිරිසිදු කරන ලද එළවළු සැපයුම් සේවාවක් ඇති කිරීම සිදු කරනු ලැබේ. ඒ වෙනුවෙන් එළවලු සැපයීමේ මධ්‍යස්ථානයක් ඇතිකිරීම හදුනාගනු ලැබේ. එසේම දැනටමත් කෘෂිකාර්මික බහුල වශයෙන් සිදුවන සඳතැන්න, මීපිලිමාන, ශාන්තිපුර වැනි කලාපයන් තුල ජනඝණත්වය සීමා කිරීම හා කලාපකරණය යටතේ කෘෂිකාර්මික කලාපය ලෙස නම් කිරීමටත් මෙම කලාපයන්හි භූමි ආවරණ අනුපාතය අවම කිරීම තුලින් කෘෂිකාර්මික ඉඩම් තවදුරටත් අනුබෙදුම් කිරීම හා ඉදිකිරීම් කිරීම අවම කිරීම සිදු කරනු ලැබේ. ඒ තුලින් උඩරට එළවලු නිශ්පාදනය පවත්නා තත්වයෙන් පවත්වා ගැනීමටත් නුවරඑළියට ආවේනික මෙම කෘෂිකාර්මාන්තය සමග ඒකාබද්ධව සංචාරක කර්මාන්තයද සංවර්ධනය කිරීම සඳහා රෙගුලාසි පනවනු ලැබේ. ඒ අනුව කෘෂි සංචාරක ව්‍යාපෘති සඳහා මෙම කලාපයන්හි ඉඩදීම මෙම සැලසුම් මගින් සිදු කරනු ලැබේ. එසේම කාබනික කෘෂිකර්මාන්තයටද ගොවියන් නැඹුරු කිරීම උදෙසා කාබනික කෘෂිකර්මාතය සමග සංචාරක ව්‍යාපාරය සඳහා වන ව්‍යාපෘතින් සඳහා ද ඉඩදෙනු ලැබේ. එසේම ප්‍රදේශයේ සියලුම කෘෂි කාර්මික කටයුතු කෘෂිකාර්මික දෙපාර්තමේන්තුවේ GAP සහතිකය යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා මෙම සැලැස්ම මගින් නිර්දේශ කරනු ලබන අතර ඒ තුලින් ජල පෝෂිතයන් හි අපවිත්‍ර කිරීමත් අධික කෘමි නාශක හා භෞතික භාවිතයන් අවම කිරීම මගින් විශේෂිත කාබනික එළවලු සැපයුමක් ඇති කිරීමක් සිදු වනු ඇත. මෙම උපායමාර්ග පරිසර සමතුලිකතාව ඇති කිරීම සඳහා වන උපාය මාර්ග සපුරා ගැනීමට මෙන්ම ඒ යටතේ වන ප්‍රදේශයක් ජලාශ වල ජලයේ ගුණාත්මක භාවය මධ්‍යම පරිසර අධිකාරි නිර්දේශිත මට්ටම ලගාකර ගැනීම හා අරමුණු සපුරා ලිම සිදු වනු ඇත.

04. වාණිජ සේවා සංවර්ධනය

විශේෂයෙන් 2030 වන විට අපේක්ෂිත සංචාරක ජනගහනය හා නේවාසික ජනගහන උදෙසා වන ග වාණිජ අපරව්‍යුහ පහසුකම් නගර මධ්‍යයේ ඇති කිරීම මෙමගින් සිදු වනු ඇත. අධිඝණත්ව මිශ්‍ර කාලය තුල එනම් නුවරඑළිය මධ්‍යය හා හාවාඑළිය උප නගර කලාපය තුල වාණිජ ඉදිකිරීම් මෙම සංවර්ධන සැලැස්ම මගින් හදුනාගනු ලැබේ. ඒ අනුව නගර මධ්‍යයේ සිල්ලර හා තොග වෙළඳ කටයුතු ප්‍රවර්ධනය උදෙසා හා පාරිභෝගික පහසුකම් සංවර්ධනය උදෙසා නුවරඑළිය මධ්‍යම වෙළඳපොල ප්‍රතිසංස්කරණය කාගිල්ස් පිටිය ආශ්‍රිත ඕෂන් විව් සාප්පු සංකීර්ණය ශාන්ත ඇන්ඩෘස් සාප්පු සංකීර්ණය, හා පැරණි කච්චේරි ඉඩම තුල සංචාරක ඉලක්ක කරගත් විවෘත ආපන ශාලාවක් ඉදිකිරීම මෙන්ම උද්‍යානපාර සාප්පු සංකීර්ණය ඉදිකිරීම තුලින් නගර මධ්‍යයේ කාර්යාල වාණිජ සේවා සඳහා වන පුළුල් ඉඩ ප්‍රශ්ථා ඇතිවනු ඇත.

සිතියම් අංක 6.3- යෝජිත ආර්ථික සංවර්ධන උපාය මාර්ග



යෝජිත ආර්ථික සංවර්ධන උපාය මාර්ග **විසල් නුවරඑළිය සංවර්ධන සැලසුම**	නාගරික සංවර්ධන අධිකාරිය නුවරඑළිය 2019
නුවරඑළිය නාගරික සංවර්ධන සැලසුම (2019-2030)	සැකසුම -මිදුණාති

6.4.පාරිසරික තිරසාර භාවය සඳහා වූ උපාය මාර්ග

6.4.1.පරිසර සංරක්ෂණ සඳහා වන උපාය මාර්ග

6.4.1.1 හැඳින්වීම.

නුවරඑළිය පිහිටි ඉහළ උන්නතාංශ කලාපය ස්වභාවික පරිසර පද්ධතිය වලින් අනුන හා අධි සංවේදි ලක්ෂණයන්ගෙන් හෙබි ප්‍රදේශයකි. 2011 ජාතික භෞතික සැලසුම් අනුවද 2017 නව ජාතික භෞතික සැලසුම් අනුවද නුවරඑළිය කලාපය අධි සංවේදි පරිසර කලාපයක් බවට නම් කර ඇත.

විසල් නුවරඑළිය කලාපය තුල පිහිටී කදු පන්තින්, ජල මුලාශ ,වනාන්තර පද්ධතින් හා සංචාරක ආකර්ෂණිය ස්වභාවික දර්ශන තල ද සංවේදීතාවය තීව්‍ර කරනු ලැබේ. විසල් නුවරඑළිය සංවර්ධන කලාපය තුළ හෙක්. 59.6ක් එනම් 1.08% ක ප්‍රමාණයක් ජල මුලාශ හා ජලාශ වලින් සමන්විත වේ.

ප්‍රධාන වශයෙන් ග්‍රෙගරි වැව නානුඔය ඇල හා ඒ ආශ්‍රිත අතුරු ඇලවල්, බ්‍රැක්ප්ලෙන් ජලාශය හා ඒ ආශ්‍රිත ජල මාර්ග, ලවර්ස්ලීප් දිය ඇල්ල, ග්ලේන්ඔවර් දිය ඇල්ල ,කටුමාන ජලාශය හා මාගස්තොට වාරි ජලාශය ඒ අතරින් ප්‍රධාන තැනක් ගනි. ග්‍රෙගරි වැව හෙක්. 90ක ප්‍රමාණයෙන්ද බ්‍රැක්ප්ලෙන් ජලාශය හෙක්. 40 කින් ද සමන්විත වේ.

පාරිසරික සාධක අතර ප්‍රදේශය වටා ඇති කදු පන්තින්ද වැදගත් කොට සැලකිය හැකිය. ශ්‍රී ලංකාවේ උසම කදු පන්තිය වන පිදුරුතලාගල හා කිකිළිමාන, හග්ගල කදු පන්තීන්ද ඒ අතර වේ.මෙවා මුහුදු මට්ටමේ සිට මීටර් 2500කට වඩා වූ කදු මුදුන්වේ.

එසේම සංවර්ධන සැලසුම් කලාපය තුළ වනාන්තර හෙක්. 1782ක් පිහිටා ඇති අතර එය සමස්ත ඉඩම් ප්‍රමාණයෙන් 34.8%ක් වේ. සිංගල්ට්‍රී, හග්ගල, පිදුරුතලාගල හා බොඹුරුඇල්ල වනාන්තර මෙහි ප්‍රධාන තැනක් ගනී. උඩරට කදුකරයේ ප්‍රධාන ජල මුලාශ වන මෙම ප්‍රදේශය ජල මාර්ග මහවැලි ගඟේ ප්‍රධාන අතු ගංගා 2ක් වන කොත්මලා ඔය හා උමා ඔය පෝෂණය කරනු ලබයි.

මෙම ප්‍රදේශය වටා ඇති හෙක්. 1332ක් වූ තේ වගාවද නුවරඑළිය ප්‍රදේශයට දර්ශනීය පෙනුමක් හා සංවේදි පරිසර පද්ධතියක් බිහිකර දීමට තවදුරටත් ඉවහල් වන සාධකයකි. නගරය තුළ පිහිටා ඇති ලවර්ස්ලීප් දිය ඇල්ල හා ග්ලෙන්ඩෝව දිය ඇල්ලද මෙම පරිසර අලංකාරත්වය තීව්‍ර කරයි. නගර මධ්‍යයේ පිහිටා ඇති හේක. 29.42කින් සමන්විත ගැල්වේස් ජාතික වන උද්‍යානයද සංවේදි පරිසර පද්ධතියේ තවත් එක් සන්දිස්ථානයකි. 1938 ගැල්වේස් අභය භූමිය ලෙස 2006 දී ජාතික උද්‍යානයක් බවටත් මෙය පත් කර ඇත. ශ්‍රී ලංකාවට අවේනික කුරුළු වර්ග හා සත්ව වර්ග 20ක පමණ මෙහි දකින්නට ලැබේ.

මිදුම් කදුකරයේ පාරාදිසය යන දැක්ම යටතේ සංවේදි පරිසර පද්ධතිය ආරක්ෂා කරමින් සියළු දෙනාට තෘප්තිමත් විය හැකි නගරයක් බිහි කිරීමේ දැක්ම යටතේ ප්‍රධාන ඉලක්ක වශයෙන් පවතින පරිසර පද්ධතිය ආරක්ෂා කරමින් පිරිසිදු ජල මුලාශ්‍රයක් ඇති කිරීම හදුනා ගෙන ඇති අතර එය මෙම සංවේදි පරිසර පද්ධතිය ආරක්ෂා කර ගැනීමෙහිලා සම්පූර්ණ කර ගත යුතු ඉලක්කයක් වේ. ප්‍රධාන අරමුණු වශයෙන් පවතින වනාන්තර පද්ධතිය ආරක්ෂා කර ගැනීම ජල මුලාශ්‍රවල ජලයේ ගුණාත්මක බව ඉහළ නැංවීම, ගැප් (GAP) සහතික කෘෂිකාර්මික භාවිතයන් ඇති කිරීම යන අරමුණු හදුනාගෙන ඇත්තේ මෙම පාරිසරික සංවේදිතාව ආරක්ෂා කිරීමටයි.

මෙම සංවර්ධන සැලැස්මේ දැක්ම වන්නේ මිහිදුම් කදුකරයේ පාරාදීසය වන අතර ඒ සඳහා වන ප්‍රධාන ඉලක්ක ලෙස පවත්නා පරිසර පද්ධතිය ආරක්ෂා කර ගැනීම හා පිරිසිදු ජල මුලාශ්‍ර පද්ධතියක් යටතේ

අරමුණු 5ක් හඳුනාගෙන ඇත. ඒ අතුරින් 2028 වන විට පිරිසිදු පානීය ජලය සැපයීම ප්‍රධාන ජලාශ වල ජලයෙහි ගුණාත්ම භාවය වැඩි කිරීම ජල මූලාශ්‍ර ආශ්‍රිතව අනවසරයෙන් අල්ලාගත් ප්‍ර දේශ නිදහස් කර ගැනීම හා දැනට පවත්නා වනාන්තර ප්‍රතිශතය එලෙසම පවත්වා ගැනීම යන අරමුණු ප්‍රධාන වන අතර ඉහත කී සංවේදී පරිදර පද්ධතිය ආරක්ෂාක කර ගැනීමේ උපාය මාර්ග තුලින් මෙකී ඉලක්ක හා අරමුණු සපුරා ගැනීමට සෘජුව දායක වේ.

එසේම දිදුලන ආර්ථික සංවර්ධනයක් හා නුවරඑළිය ආවේනික ගති ලක්ෂන මුර්තිමත් කිරීම යන අනෙකුත් ඉලක්ක සම්පුර්ණ කිරීමද පුර්ණ ලෙස මෙම උපාය මාර්ගය දායක වේ. විශේෂයෙන් නුවරඑළියට ආවේනික වනාන්තර පද්ධති ආරක්ෂා කිරීම තුලින් නගරයට පිවිසෙන සංචාරකයින්ගේ දර්ශනීය තල හා භූ දර්ශන අලංකරණද වැඩි වේ. පරිසර සංවේදී හරිත සංචලන නගරයක් බවට පත් කිරීම ඒ තුලින් සංචාරක වර්ධනය ඇති කර ගැනීමත් හේතු වේ. මෙය දල සංචාරක රාත්‍රී 4ක් සදහා වන අරමුණු ලගා කර ගැනීමටද වක්‍රාකාරව සහය වේ.

6.4.1.2. උපාය මාර්ග

1 - සංවේදි සංරක්ෂිත වාන්නතර පද්ධතියක්

පසුගිය වසර 5ක් තුළ ප්‍රදේශයේ වනාත්තර ගහනය 6%කින් පමණ අඩු වී ඇති බැවින් ඉදිරියේදි දැනට පවත්නා 34%ක් වූ වන ගහනය අඩු නොවීමට මෙයින් බලාපොරොත්තු වේ. පවතින වනාන්තර සීමාවන් වෙන් කොට කලාපකරණයට ලක් කිරීම එම වනාත්තර කලාප කිසිදු ඉදිකිරීමක් සඳහා ඉඩ නොදීමේ රෙගුලාසි පැනවීමත් මෙයින් තවදුරටත් තහවුරු වේ. තවදුරටත් අනවසරයෙන් වනාන්තර එලිකිරීම් වැලැක්වීම සඳහා යාබද කලාප වල මායිම් දිගේ අවරෝධක උපක්‍රමයක් ලෙස අඩි පාරවල් සැකසීම සිදුකල යුතුයි. මෙම මාර්ග ජනතාවගේ ඇවිදීමේ හා පරිසරය විඳීමේ අවශ්‍යතාවන්ද සම්පුර්ණ කරනු ලැබේ.

එසේම වනාන්තර කලාපයට මායිම් වන කලාප අවරෝධක කලාපයක් ලෙස නම් කිරීම එහි සංවර්ධන කටයුතු සීමා කිරීමත් වනාත්තර මායිමේ සිට අවම මීටර් 6ක රක්ෂිතයක් ඉදිකිරීම් සඳහා පවත්වා ගැනීමට රෙගුලාසි පැනවීමත් පවත්නා වනාන්තර පද්ධතිය ආරක්ෂා කර ගැනීමට උපකාරී වේ.





සිතියම් අංක 6.4- යෝජිත වනාන්තර පද්ධතිය

2 - ජල මුලාශ්‍ර සඳහා රක්ෂිත වෙන් කිරීම

ප්‍රධාන ජල මාර්ග සඳහා අවම රක්ෂිතයක් පැන වීමත් ග්‍රෙගරි වැව අවට කලාපය සංවේදි පරිසර සීමාවක් ලෙස නම් කර ඉදිකිරීම් පාලනය කිරීමත් බ්‍රැක්ප්ලේන් ජලාශය අවට සීමා මායිම් පනවා ඒ වටා පදික හා පාපැදි මංතීරු ඉදිකිරීම තුළින් ජල මුලාශ්‍ර ආරක්ෂා කිරීමට බලාපොරොත්තු වේ.

එසේම ජලවහන පද්ධතියට මල අපද්‍රව්‍ය හා අනෙකුත් අප ජලය එක්වීම වැලැක්වීම සඳහා නව ඉදිකිරීම් සඳහා අපජලය පිරිපහදු පද්ධතියක් අනිවාර්යය කිරීමේ රෙගුලාසි පැන වීමද නව ක්‍රියා මාර්ගයකි. පවතින හෝටල් හා සංචාරක හෝටල් සඳහා පොකුරු ක්‍රමයට පිරිපහදු පද්ධතින් ඇති කිරීමත් දැනට නුවරඑළිය මහ නගර සභාව හා JICA ආයතනය ඒකාබද්ධව ක්‍රියාත්මක කරනු ලබන මධ්‍යම මලාපවාහන පද්ධතිය ක්‍රියාත්මක කිරීමත් තවදුරටත් පරිසර සංවේදිතාවය ආරක්ෂා කර ගැනීමට ඉවහල් වේ. යෝජිත මලාපවාහන පද්ධතිය සඳහා ඉඩම් කොටස් වෙන් කිරීමත් මෙම සැලසුම මගින් හඳුනාගෙන ඇත. ජල මුලාශ්‍ර ආශ්‍රිත හා එහි ආවරණය කරන ඉඩම් වල යහපත් කෘෂිකර්මය (ගැප්) අනිවාර්යය කිරීම සඳහා රෙගුලාසි පැනවීම.

3 – ජලාශ්‍රිත ක්‍රියාකාරකම් (Water front activity)

නානුඔය ඇල, බ්‍රැක්ප්ලෙන් ඇල හා අතුරු ඇල මාර්ග අවම රක්ෂිතයක් නියම කිරීමත් එකී රක්ෂිතයන් තුළින් ජනතාවට ඇවිදීමේ මංතීරු හා ජල මාර්ග වල පාරිසරික තත්වය විදගැනීමේ පහසුකම් සැපයීම තුළින් ජල මාර්ග රක්ෂිත ආක්‍රමණය කිරීමත් අපවිත්‍ර වීමත් අවම වේ.

4 - පාරිසරික සංවේදි ස්ථාන ආරක්ෂා කිරීම උදෙසා සීමා කොන්දේසි පැනවීම

පාරිසරික වශයෙන් සංවේදි ස්ථාන හඳුනා ගැනීම හා සංවේදි කලාප ලෙස නම් කිරීම ද ඒ අනුව සංවේදි කලාප 1,2, 3 ලෙස කලාපකරණයේදි වෙන් කිරීම ප්‍රධාන උපාය මාර්ගයක් වේ. සංවේදිතා අධ්‍යයනයන් අධිසංවේදි කලාප ලෙස හඳුනා ගන්නා ලද ප්‍රදේශයන් මෙම කලාපකරණයට භාජනය කරන ලදි.

ශාන්තිපුර හා උඩරදැල්ල වනාන්තර සීමාවට මායිම් ප්‍රදේශය, ශාන්තිපුර පිවිසුම් මාර්ගය බඹරකැලේ අධි බැවුම් කොටස, බඹරකැලේ නානුඔය ඇල දෙපස කොටස, ශාන්ත ඇන්ඩrස් පාර පල්ලිය ඒ ආශ්‍රිත වනාන්තර ප්‍රදේශය, ග්‍රෙගරි වැව ජලය පිටවාන සිට බ්ලැක්ෆුල් දක්වා ඇල දිගේ බිම් තීරුව, යුනික්විව් වනාන්තරයට යාබද කොටස මේ අතර ප්‍රධාන තැනක් ගනි. මෙම ප්‍රදේශයන් වල ඉදිකිරීම් සඳහා දැඩි කොන්දේසි පැනවීමත් වන වගාව ආරම්භ කිරීමත් සංවේදි තාවය ප්‍රගුණ කිරීමට සහයක් වන ඇත. එසේම සංවේදි දර්ශන පද්ධති තේ වගා බිම් කොටස් ද ඉදිකිරීම් වලින් නිදහස් කිරීම සඳහා රෙගුලාසි පැනවීමට මෙමගින් කටයුතු කරනු ලැබේ. ඒ යටතේ වින්ඩකෝනර් ප්‍රදේශය ආශ්‍රිත තේ වගාව බඹරකැලේ තේ වගා භූමිය සංවේදි කලාප ලෙස හඳුනා ගෙන ඇත.



සිතියම අංක 6.5 - සංවේදී කලාප

උපාය මාර්ග 5 - දර්ශන තල අවහිර වීම වැලැක්වීම හා හරිත ගහනය වැඩි කිරීම

පාරිසරික සුන්දරතාවය හා සංවේදිතාව නුවරඑළියට පැමිණෙන සංචාරකයින්ටත් අනෙකුත් ජනතාවටත් විදගැනීම සැලැස්වීම සඳහා මේ තුළින් තවදුරටත් සංචාරක ආකර්ෂණය වැඩි කිරීම මෙම ගින් අරමුණු කෙරේ. නගරය වටා ඇති කඳු පන්තින් වල දර්ශන තල අවහිර වන ආකාරයේ ඉදිකිරීම් සඳහා ඉඩ නොදීමටත් සෑම කඳු පන්තියකම 2/3 ක ප්‍රමාණයක් ප්‍රධාන පිවිසුම් මාර්ග ආශ්‍රිතව දර්ශනය වීමට සැලැස්වීම සඳහා ඉදිකිරීම් පාලනය කිරීම මෙහි අදහස් කෙරේ.

එසේම ප්‍රදේශයේ ඉදිකරනු ලබන සියළුම ඉදිකිරීම් හා සමගාමීව ඒ ඒ පරිශ්‍රයන් වල අවම වශයෙන් ගස් 5ක් සිටුවීමේ රෙගුලාසි පැනවීමත් දැනටමත් ඉදිකර ඇති ගොඩනැගිලි ආවරණය කිරීම සඳහා නව වන වගාවක් සෑම පරීශ්‍රයක් තුළ ආරම්භ කිරීමත් සිදුකල යුතුයි. එසේම ග්‍රෙගරි වැව වටා නව වන වගාව ආරම්භ කිරීමත් නගරයේ අනෙකුත් ප්‍රදේශ වල මාර්ග මායිමට යාබදව රුක් රෝපණ ව්‍යාපෘති සිදුකිරීමත් මෙම සංවේදි පරිසරය පවත්වා ගෙන යාම සඳහා තවදුරටත් ඉවහල් වනු ඇත.

උපාය මාර්ග 6 - පාරිසරික හිතෛෂි කෘෂිකාර්මික භාවිතයක්

විසල් නුවරඑළිය සංවර්ධන සැලැසුම් කලාපය තුළ ප්‍රධාන ආර්ථික මාර්ගයක් ලෙස උඩරට එළවළු වගාව හදුනාගෙන ඇති වුවද ඒ තුළින් පරිසරයට ජල මූලාශ්‍ර වලට සිදුවන අපවිත්‍රතාවය පිළිබඳව ගැටළු තුළින් හදුනාගෙන ඇත. ඒ හෙයින් ප්‍රදේශයේ ඇති හෙක්. 200ක පමණ වූ උඩරට එළවළු වගාව තුළින් අවම පරිසර හානියක් සිදුවන ආකාරයට කෘත්‍රිම පොහොර හා කෘමි නාශක භාවිතය අවම කර කාබනික වගාවක් කෙරෙහි නැඹුරු කිරීම මින් අදහස් කෙරේ. ඒ අනුව සියළුම කෘෂිකාර්මික කටයුතු කෘෂිකාර්මික දෙපාර්තමේන්තුවේ GAP සහතිකය ඇතිව පවත්වා ගෙන යාමට නිර්දේශ කරනු ලැබේ. මේ අනුව ඝණ අපද්‍රව්‍ය බැහැර කිරීමේ උපාය මාර්ග යටතේ සෑම ගෙවත්තකම කොම්පොස්ට් බඳුනක් පිහිටුවීමේ අරමුණට අනුව මෙම උපාය මාර්ග සමගද ගැලපේ.



6.4.2 භූදර්ශන අලංකරණ සැලැස්ම

6.4.2.1.හැඳින්වීම.

ස්වාභාවකි සෞන්දර්යය අතිශය හා ස්වාභාවකි සෞන්දර්යය නිසාම ජනාදරයට පාත්‍ර වූ නුවරඑළිය ප්‍රදේශය භූදර්ශනය අලංකරණය විශේෂ වුවක් ලෙස සැලකිය හැකිය. විසල් නුවරඑළිය කලාපය තුල පිහිටි සංවර්ධිත පරිසරයම භූදර්ශනය පරිසරයකින් යුක්ත වීම ඊට ප්‍රධාන හේතුවක් වේ. විශේෂයෙන්ම අතීතයේ පටන් ස්වාභාවික සංවේදී කලාපයක් බවට නම්කර තිබීමත් බ්‍රිතාන්‍ය පාලන සමයේදී නුවරළිය පිවිසීමෙන් පසුවද Resot එකක් ලෙස පවත්වාගෙන යාමටද හේතු වුයේ නුවරඑළියේ පවතින ස්වාභාවික පාරිසරික භූ අලංකරණයයි. වර්තමානයේ සංචාරක ක්ෂේත්‍රය වර්ධනය වීමටද මෙම ස්වභාවික පාරිසර පද්ධතිය පදනම් කර ගත් භූදර්ශනය හේතු වී ඇත.

පවත්නා වනාන්තර පද්ධතිය, තේ වගාව ස්වභාවික ජල දහරා දියඇලි, විවෘත භූමි, ගෝල්ෆ් ක්‍රීඩා පිටිය, ග්‍රෙගරි වැව ආශ්‍රිත පාරිසරික කලාපය ආදිය ප්‍රධාන අංගයන් ඒ අතර වේ. විසල් නුවරඑළිය සංවේදි කලාප තුල හෙක්ටයාර් 18 වූ වනාන්තර පද්ධතියත් හේකටයාර් 2 පමණ වූ විවෘත භූමි හා ක්‍රීඩා පිටි මෙන්ම 13.3 වූ තේ වගාව හා 5 පමණ වන ජල ආශ්‍රිත පැතිරීම් ද හෙක්ටයාර් 8.5 පමණ වන උඩරට කෘෂිකාර්මික මෙම භූදර්ශන අලංකරණය තීවුර කරවයි.

වර්තමානයේ මෙම ස්වභාවික පරිසර පද්ධතින්ට අමතරව බ්‍රිතාන්‍ය යුගයේ ඉදිකරන ලද 130ක් පමණ වූ බ්‍රිතාන්‍ය ගෘහ නිර්මාණ ශිල්පී ලක්ෂණ වලින් හෙබි ගොඩනැගිලිද මානව නිර්මාණය ලෙස භූ අලංකරණය තව දුරටත් වර්ධනය කරයි. එසේම පසු කාලීනව ඉදිකරන ලද ග්‍රෙගරි උද්‍යානය, වික්ටෝරියා උද්‍යානය ද භූදර්ශන අලංකරණය තව දුරටත් වර්ධනය කරයි.

.කෙසේ වෙතත් වර්තමානයේදී මෙම නුවරඑළියට ආවේනිකව ස්වභාවික භූදර්ශනය තව දුරටත් හීන වීමට ලක්ව ඇති අතර අධි උස ගොඩනැගිලි ඉදිකිරීම හේතුවෙන් භූදර්ශන පත අවහිරවීම, ස්වභාවික වනාන්තර ප්‍රමාණය හීන වීම ස්වභාවික දිය ඇලි, ජල මාර්ග දර්ශනය නොවීම හා ජල මාර්ග අපවිත්‍ර වීම. මේ තත්වයට ප්‍රධාන වශයේන බලපානු ලබයි. එසේම ආවේනික ගෘහ නිර්මාණ ශිල්පි වෙනුවට වෙනත් ගෘහ නිර්මාණ ශිල්පී ලක්ෂන භාවිතා වීමද අලංකරණයට බාදාවක් වී ඇත. ස්වභාවික හරිත ඉදිකිරීම් වෙනුවට නිර්මිත ඉදිකිරීම් වැඩිවීමද පසුගිය කාලයේදී දක්නට ලැබේ.

6.4.2.2.උපාය මාර්ග

01. ස්වභාවික භූ දර්ශන තල ප්‍රවර්ධනය

ස්වභාවිකව ඇති භූදර්ශනය අලංකරණ ප්‍රවර්ධනය කිරීමත්, ඉදිරි භූදර්ශන සංවර්ධනයේදී ස්වභාවික පරිසර පද්ධතින් සදහා මුලිකත්ව දීමත් මෙයින් අදහස් කෙරේ.ඒ අනුව ඉදිරියේදී කෘත්‍රිමව කරන ලද භූදර්ශනයට වඩා ස්වභාවිකව පවතින පරිසර පද්ධතින් පවත්වා ගෙන යාමට සිදුවනු ඇත.

ස්වභාවික වනාන්තර පද්ධතිය ආරක්ෂා කිරීම හා නව නුවරඑළිය ආවේනික ස්වදේශිය ශාක රෝපනය සදහා පහත සදහන් ස්ථාන හදුනාගෙන ඇත. ඒ අනුව බඹරකැලේ, ශාන්තිපුර සංවේදී කලාපය හා යුනික්විව් සංවේදී කලාපය, නානුඔය ඇල දෙපස,ග්‍රෙගරි වැව ඉහල වැව් කොටස, ග්‍රෙගරි වැව ලේක් ක්ලබ් ඉදිරිපස රථවාහන ගාල, තුරඟ තරග පිටිය, උඩපුස්සල්ලාව මාර්ග රක්ෂිතය, බ්ලැක්ෆුල් පාලම අසල හා නානුඔය ඇල දෙපස ප්‍රදේශ ස්වභාවික භූදර්ශන පද්ධති ආරක්ෂා කිරිම සිදු කරනු ලැබේ.

02. නගර මධ්‍යයේ විනෝදාත්මක කලාපය හා භූඅලංකරණය

නගර මධ්‍යයේ පිහිටි ග්‍රෙගරි වැව කලාපය, තුරඟ තරග පිටිය, ගොල්ෆ් උද්‍යානය, වික්ටෝරියා උද්‍යානය හා ජනාධිපති මන්දිරය, සෙන්පති මැදුර හා අගමැති මැදුර ආශ්‍රිත භූමි කොටස් අවම ගොඩනැගිලි භාවිතයන් හා ස්වභාවික භූදර්ශන තලයන් ආරක්ෂා කරමින් සිදුකරනු ලැබේ. ඒ සඳහා කලාපකරණ රෙගුලාසි හා ගොඩනැගිලි රෙගුලාසි හඳුන්වා දෙනු ලැබේ.

03. සෑම ඉඩමකම ගෙවත්තක්

සෑම බිම් කට්ටියකම ඉදිකිරීම්, සීමාව අධි සඟත්ව මිශ්‍ර හා අධි සඟත්ව සංචාරක කලාප හැර අනෙක් කලාප 50% ලෙස රෙගුලාසි පැනවීමත්, අධි සඟත්ව මිශ්‍ර හා අධි සඟත්ව සංචාරක කලාපවල 60% ලෙස නම් කිරීමත් තුලින් ඉතිරි බිම් කොටසේ මල් වගාව, කෘෂිකර්මාන්ත හෝ භූදර්ශන අලංකරණ කටයුතු සඳහා නියම කිරීම හා සෑම ගෙවත්තකම අවම වශයෙන් ශාඛා 05 සිටුවීම අනිවාර්ය කිරීම.

04. ජල මාර්ග ආශ්‍රිත භූඅලංකරණ තුලින් නගර අලංකරණය

නුවරඑළිය ප්‍රධාන සම්පතක් වන ජල මුලාශ්‍ර ආශ්‍රිතව භූදර්ශන තල ආරක්ෂා කිරීම හා තවදුරටත් ප්‍රගුණ කිරීම මෙමගින් අපේක්ෂා කරනු ලැබේ. ඒ අනුව බැරැක්ප්ලේන් ජලාශය අවට භූඅලංකරණ ව්‍යාපෘතිය, නානුඔය ඇල රක්ෂිතය භූදර්ශනය කිරීම, කටුමාන වැව හා ඇලේ රක්ෂිත කොටස් භූ අලංකරණය, මාගස්තොට වැව ආශ්‍රිතව භූ අලංකරණය කිරීම යන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමෙන් මෙම ඉලක්කය සපුරා ගැනීමට බලාපොරොත්තු වේ.

05. නගර අලංකරණය හා ස්වභාවික නිර්මිතයන් පවත්වා ගැනීම

නගර මධ්‍යයේ හා ප්‍රධාන මාර්ග ආශ්‍රිතව ඇති කොන්ක්‍රීට් නිර්මිතයන් හරිත වැසුම් මගින් ආවරණය කිරීමත් ඉදිරියේදි එවැනි ඉදිකිරීම් අවම කිරීමත් මෙමගින් ඉලක්ක ගත වේ . ඒ අනුව ප්‍රධාන මාර්ග ආශ්‍රිතව කොන්ක්‍රීට් නිර්මිතයන් අවම කිරීම හා දැනට පවතින ඉදිකිරීම් (බැමි/කාණු/තාප්ප) හරිත වැසුම් මගින් අලංකරණය මගින් ආවරණය කිරීම, වෙළඳ ව්‍යාපාර සඳහා නිශ්චිත දැන්වීම් පුවරු සඳහා සම්මත ප්‍රමාණයන් පැනවීම, අතුරු මාර්ග පිවිසුම් ආරම්භයේදී පොදු දැන්වීම් පුවරු හඳුන්වා දීම, වෙළඳ දැන්වීම් පුවරු සඳහා සීමා කොන්දේසි පැනවීම, මේ සඳහා රෙගුලාලි මගින් නිශ්චිත ප්‍රමාණය හා සවිකිරීම සඳහා නියමයන් ලබා දීම, ගොඩනැගිලි සඳහා නියමිත වර්ණ/වහලයේ වර්ණ නියම කිරීම, ගොඩනැගිලි සැලසුම් සඳහා නුවරඑළිය ආවේනික ගෘහනිර්මාණ ශිල්පී ලක්ෂණ රෙගුලාසි මගින් හඳුන්වා දීම, රෙගුලාසි මගින් ගොඩනැගිලි වල උස පාලනය කිරීම මගින් ස්වභාවික දර්ශන තල අවහිර වීම වලක්වාලීම හා නුවරඑළියට පිවිසුම් ස්ථාන අලංකරණය යටතේ නුවරඑළිය පිවිසෙන පුධාන ස්ථාන වල බිලැක්ෆුල්, ටොප්පාස්, කටුමාන හා බොරලන්ද ස්ථාන වල නුවරඑළියට ආවේණික ලක්ෂන ඇතලුව භූදර්ශන කිරීම.

6.4.3 ආපදා කළමනාකරණ සැලැස්ම

6.4.3.1 හැඳින්වීම.

විසල් නුවරඑළිය සැලසුම් කලාපය තුල නාය යාම් හා ජල ගැලීම් ආපදා ප්‍රධාන වශයෙන් හඳුනාගත හැකි අතර ගොඩනැගිලි පර්යේෂණ ආයතනයෙ දත්තයන් අනුව නාය යෑමට ලක් විය හැකි වඩාත් අවධානම් කලාප 3ක් හඳුනාගෙන ඇත. (සිතියම් අංක)

ඒ අනුව යුනික් විව් ඉහල කොටසේ අවධානම් කලාපය, බඹරකැලේ ඉහල කොටසේ ශාන්තිපුර මාර්ගය ආශ්‍රිතව අවධානම් කලාපය හා වොටර්ෆිල්ඩ් ඉහල කොටසේ අවධානම් කලාපය ලෙස පෙන්වා දිය හැකිය.

එසේම නුවරඑළිය ලැබෙන අධික වර්ෂා දිනවලදී ප්‍රධාන ජල මාර්ග උතුරු යෑමෙන් පහත්බිම් ප්‍රදේශ යටවීම නිසා ඒ ආශ්‍රිත ඇති නේවාසික ප්‍රදේශ වලට හානි පැමිණ වේ. පහත වගු අංක මගින් මෙම ආපදා තත්වයන් සඳහා බලපාන ස්ථාන විස්තර කර ඇත.

*වගු අංක **6.1-*** **ආපදා ස්ථාන**

ස්ථානය	පවුල් සංඛ්‍යාව	ආපදාව
PWD නිවාස	60	ජල ගැලීම්
ශාන්ත ඇන්ඩrස් ඩ්‍රැයිව්	20	ජල ගැලීම්
ජෙම්ස් වීදිය	25	ජල ගැනීම්
යුනික් විව් ඉහල කොටස	58	නාය යෑම්
තුරඟ තරග පිටිය	54	ජල ගැලීම්
මහින්ද මාවත දෝව කොටස	34	ජල ගැනීම්

*සිතියම් අංක **6.13** - සංවේදී පරිසර පද්ධතීන්*

6.4.3.1 උපාය මාර්ග

1. ආපදා සහිත කලාප ඌණ සංවර්ධන කලාප ලෙස නම් කිරීම.

යුනික්විව් ඉහළ කොටස, බඹරකැලේ ඉහළ කොටසේ ශාන්තිපුර ඉහළ කොටස සංවේදි කලාප ලෙස නම් කිරීමත් වෝටර්ෆිල්ඩ් ඩ්‍රයිව් ඉහළ කොටස, බොරලන්ද වන රක්ෂණයට යාබද කොටස් අඩු ඝනත්ව නේවාසික කොටස් ලෙස නම් කිරීමත් සංවර්ධන කටයුතු පාලනය කිරීමත්

1. පදිංචි පවුල් ප්‍රතිස්ථාපනය කිරීම

i. තුරඟ තරග පිටියේ පදිංචි පවුල් 54 දෙනා ඉහළ උන්නතාංශ ක්‍රීඩා සංකීර්ණ ව්‍යාපෘතියට සමගාමීව හාවාඑළිය නුවරඑළිය මහ නගර සභා ඉඩම් වලට ප්‍රතිස්ථාපනය කිරීම

ii. නව නිවාස සංවර්ධන ව්‍යාපෘතිය යටතේ යුනික්විව් ඉහළ කොටසේ පදිංචි පවුල් 24 ස්ක්‍රබ් වත්ත වෙත ප්‍රතිස්ථාපනය කිරීම


1:50,000
N
E
S
W
සැකසුම් -මූලාශ්‍ර
මහනගර සංවර්ධන අධිකාරිය
නුවරඑළිය
2019
නුවරඑළිය නාගරික සංවර්ධන සැලැස්ම (2019-2030)
මූලික භූමි භාවිත සංවිධානය
භූමිය - ගොඩබිම
ජලාශය
1000 මීටර්
2000
5000
2
3
නිලඩාරි
මහනුවර
වත්තේගෙදර
රතුබදුල්ල
මිල්ලගහවත්ත
මූලික භූමි භාවිත සංවිධානය සැලැස්ම
විසල් නුවරඑළිය සංවර්ධන සැලැස්ම (2019-2030)
සිතියම් අංක 6.6 - ආසන්න කලාප සැලැස්ම
මූලික දිස්ත්‍රික් කාර්යාලය - නාගරික සංවර්ධන අධිකාරිය
103

2. ප්‍රධාන ජලාශ වල තැන්පත් වී ඇති රොන් මඩ ඉවත් කිරීම
   I. බරුක්ප්ලේන් ජලාශයේ සීමා මායිම් නම් කරඑහි තැන්පත් වී ඇති රොන්මඩ ඉවත් කිරීම
   II. කටුමාන ජලාශයේ රොන්මඩ ඉවත් කිරීම

3. ආපදාවට ලක්වී ඇති ඇල මාර්ග පුළුල් කිරීම

බරුක්ප්ලේන්, වෝටර්ෆිල්ඩ් ඩ්‍රයිව්, තලගල ඔය හා නානුඔය ගොල්ෆ් ඉඩම හරහා කොටස පුළුල් කිරීම

6.4.3.2.සංවර්ධන සැලසුම් දැක්ම / ඉලක්ක හා ගැලපීම

දිදුලන ඉසුරුමත් පුරවරයක් හා පවතින පරිසර පද්ධතිය ආරක්ෂා කර ගනිමින් නිසි ජල මුලාශ්‍ර පද්ධතියක් යන ඉලක්ක සැපරීම සඳහා ඉහත ආපදා කළමනාකරණ උපාය මාර්ග සෘජුව හා වක්‍රව සහය වේ. සංවේදී පරිසර පද්ධතිය ආශ්‍රිතව පවත්නා ජල මුලාශ්‍ර තුළින් නේවාසික භාවිතය අවම කිරීමත් තුළින් ජල මුලාශ්‍ර පද්ධති වල සිදුවන දූෂණය වලක්වා ගත හැකිය.

6.4.3.3.අනෙකුත් උපාය මාර්ග හා සබැඳීම

ආපදා කළමනකරණය අවම කිරීම සඳහා ජල මුලාශ්‍ර හා ජලාශ වල ධාරිතාව වැඩි කිරීම, ජල බස්නා කාණුහා වැසි ජලය බැසයාම සඳහා වන උපාය මාර්ග සමග සබැඳේ. එසේම නිවාස සංවර්ධන ව්‍යාපෘතිය යටතේ යුනික්විව් ඉහළ කොටසේ නිවාස ප්‍රතිස්ථාපනයක්, ජේමිස් වීදියේ නිවාස සංවර්ධනයත් මෙම ආපදා කළමනාකරණ ව්‍යාපෘතිය හා ඒකාබද්ධවේ. එසේම ආර්ථික සංවර්ධන උපාය මාර්ග මගින් හදුන්වා දී ඇති ඉහළ උන්නතාංශ ක්‍රීඩා සංකීර්ණ ව්‍යාපෘතිය යටතේ දැනටමත් පදිංචි අඩු ආදායම් නිවාස 54 ප්‍රතිස්ථාපන ව්‍යාපෘතියද මේ හා සබැඳේ.



සිතියම් අංක 6.7 පරිසර සංරක්ෂණ සඳහා වන උපාය මාර්ග සැලස්ම



පරිසර සංරක්ෂණ සඳහා වන උපාය මාර්ග විසල් නුවරඑළිය සංවර්ධන සැලස්ම	නාගරික සංවර්ධන අධිකාරිය නුවරඑළිය 2019
නුවරඑළිය නාගරික සංවර්ධන සැලස්ම (2019-2030)	සැකසුම -මදුෂානි

6.5 සාමාජීය හා භෞතික අපරව්‍යුහ පහසුකම් උපාය මාර්ග

6.5.1. සේවා සැලැස්ම

මිහිදුම් කඳුකරයේ පරාදීසය යන ඉලක්කය කරා ගමන් කිරීමේදී විසල් නුවරඑළිය සංවර්ධන සැලසුම් කලාපය තුල සියලු දෙනාට තෘප්තිමත් විය හැකි තිරසර සංවර්ධනයක් ඇති කර ගනිමින් නේවාසික, සංක්‍රමනික ජනතාවගේ සේවා අවශ්‍යතා සැලසුම් සහිතව ඉටු කිරීම සදහා පහසුකම් සැලසීම මෙම සංවර්ධන සැලැස්මේ එක් අරමුණක් වේ.

විශේෂයෙන් සමස්ත ප්‍රදේශයටම 2028 වන විට වාර්ෂික සංචාරක ආගමනය මිලියන 4.5ක් මෙන්ම එය දෛනිකසාමාන්‍ය 24,000ක් වන ඉලක්කයක් හා 2028 වන විට නේවාසික ජනගහනය 60,000 ලෙස ඉලක්ක කර ඇත. එසේම නගරයට පැමිණෙන සේවා ලාභීන් සේවා සපයන්නන් වන අනෙකුත් සංක්‍රමනික ජනතාව 2017 වන විට 40000ක් පමණ වන අතර එය 2028 වන විට 60000ක පමණ අගයකට වර්ධනය වනු ඇත. (ඇමුණුම් 05 - ජනගහන පුරෝකථන) මේ අනුව මෙම නේවාසික හා සංක්‍රමණික ජනගහනය උදෙසා අවශ්‍ය සේවාවන් පිළිබඳව මෙම උපාය මාර්ගය යටතේ විග්‍රහ කරනු ලැබේ. ඒ අනුව ප්‍රධාන සේවාවන් අතුරින් නිවාස සෞඛ්‍ය හා අධ්‍යාපන යන සේවාව සදහා වැඩි අවධානයක් මෙම සැලැස්ම මගින් යොමු කෙරේ.

6.5.1 (අ)නිවාස

ප්‍රධාන වශයෙන් විසල් නුවරඑළිය කලාපය තුල නිවාස වලතත්වය පහල මට්ටමක පැවතීම ගැටලුවක්ව පවති. 21.6%ක ප්‍රතිශතයක් දරිද්‍රතා මට්ටමක් පිහිටීම මත ඔවුන්ගේ නිවාස වල තත්වය ප්‍රමාණයක් පහල මට්ටක තිබීමක් දක්නට ලැබේ. එසේම අඩු පහසුකම් නිවාස මෙන්ම පැල්පත් නිවාස 2328 ප්‍රමාණයක් පැවතිමත් හදුනාගත හැකිය. යුනික් විව්, කැලේගාල, නේස්බි වත්ත, ගැල්වේස්වත්ත, MC නිවාස, PWD නිවාස, පොලිස් පටුමග නිවාස, ස්ක්‍රබ්වත්ත, ස්ක්‍රබ් වත්ත වතු නිවාස මේ අතරින්ප්‍රධාන වේ.

එසේම ප්‍රදේශයේ තිබෙන නිවාස අහිමි පවුල් සංඛ්‍යාව 224ක් වන බව ජන හා සංඛ්‍යා ලේඛනදෙපාර්තමේන්තුව වාර්තා කරයි. 2016 වන විට පැල්පත් හා පේලි නිවාස 2328 වේ.

විසල් නුවරඑළිය සංවර්ධන සැලැස්ම යටතේ මෙම 21.6%ක් වන අඩුපහසුකම් නිවාස ප්‍රමාණය 2028 වන විට 10%ක් දක්වා අඩු කිරීමේ ඉලක්කයක් හදුනාගෙන ඇත.විසල් නුවරඑළිය කලාපයේ 2016 වර්ෂයේ ජනගහනය 49,331 ලෙසද 2017 වසරේ එය 52302ක් ලෙසද වන අතර පවත්නා ජනගහන වර්ධන වේගය අනුව කලාපය තුල 60,000ක පමණ වන ජනගහනයක් අපේක්ෂා කල හැකිය.

2012 වසරේදී මුළු පවුල් සංඛ්‍යාව 11008 වන අතර එසේම 2017 වසරේදී මෙම ප්‍රමාණය 11,644 ක් පමණ වේ. ඒ අනුව කුටුම්භයක ප්‍රමාණය 4.4ක් ලෙස ගණනය කල හැකිය.

එසේම 2012 වර්ෂයේදී 242 වූ නිවාස හිගය 2017 වර්ෂයේදී 247ක් වේ. එසේම 2028 වසර වන විට අමතර ජනගහනය 7,698 ක් ඒක්වන අතර ඒ සදහා නිවාස 1,749ක් අවශ්‍යව පවති.

2017 වසරේදී සමස්ථ නිවාස 2.1%ක හිඟයක් පවතින බැවින් ඊට සාපේක්ෂව 2028 වන විට වැඩි වන නිවාස ප්‍රමාණයෙන් 3%ක ප්‍රමාණයක් සෘජු නිවාස සංවර්ධනයක් හා නිවාස 1443ක් වෙළඳපොළ ප්‍රවාහය මගින් වැඩි දියුණු වීමක්ද මෙම සැලැස්ම මගින් යෝජනා කරනු ලැබේ. ඒ අනුව,

2028 වන විට අවශ්‍ය අමතර නිවාස ප්‍රමාණය	1749
මුළු ප්‍රමාණයෙන් කල් ඉකුත් වූ නිවාස	116
2028 වන විට මුළු අවශ්‍යතාවය	1865
සෘජු නිවාස ඉදිකිරීම් 03%	179
2017 වසර වන විට හිඟ නිවාස	247
සම්පූර්ණ සෘජු නිවාස ඉදිකිරීම් ප්‍රමාණය	422

1. සෘජු නිවාස සැපයීම 422
2. වෙළඳපල ප්‍රවාහනය අනුව 1443

6.5.1.(අ) උපාය මාර්ග

1. සෘජු නිවාස ව්‍යාපෘති

මධ්‍යම පාන්තික නිවාස ව්‍යාපෘතින් 02ක් ක්‍රියාත්මක කිරීම

1. ස්ක්‍රබ්වත්ත නා.සං.අධි ඉඩම 80
2. මධ්‍යම පාන්තික නිවාසයෝජිත - හාවාඑළිය

   කාලගුණික විද්‍යා දෙපාර්තමේන්තු ඉඩම 100

වෙළඳපොල ප්‍රවාහය අනුව නිවාස සංවර්ධනයට අවශ්‍ය පහසුකම් සැපයීමත් අපරව්‍යුහ පහසුකම් වර්ධනය කිරීමත් හා කාලපකරණ රෙගුලාසි, සැලසුම් රෙගුලාසි අනුව මධ්‍ය ඝණත්ව නේවාසික කලාප ලෙස බ්ලැක්ෆුල්, මීපිලිමාන, රුවන්පුර, කටුමාන, ප්‍රදේශ හඳුනා ගැනීම මෙම සැලසුම් මගින් ක්‍රියාත්මක කෙරේ.

6.5.1.(අ) 2.දැනටමත් අඩු පහසුකම් නිවාස ප්‍රතිසංස්කරණය

2012 දත්ත අනුව පේලි හා පැල්පත් නිවාස 2328 (21.6) හා 2017 අනුව 2533ක් ලෙස හඳුනා ගත හැකිය. විශේෂයෙන් ආන්තික කලාපවල මෙන්ම වතු ආශ්‍රිත සේවක නිවාස ලෙස බොහොමයක් පේලි නිවාස, පැල්පත් නිවාස, මේ තුලට අන්තර් ගත වන අතර එම නිවාස වැඩිදියුණු කිරීමේ උපාය මාර්ග ක්‍රම කිහිපයකට යෝජනා කරනු ලබයි.



*වගු අංක **6.2** - නිවාස වැඩිදියුණු කිරීමේ උපාය මාර්ගය*

අ.අ	ස්ථානය	නිවාස සංඛ්‍යාව	ඉඩමේ අයිතිය	නිවාස වැඩිදියුණු කිරීමේ උපාය මාර්ගය
1	බඹරකැලේ PWD නිවාස	55	ජාතික නිවාස සංවර්ධන අධිකාරිය	පවත්නාස්ථානයේමපෞද්ගලිකඅයෝජකයින්සම ගඒකාබද්ධවවැඩිදියුණුකිරීම
2	බඹරකැලේ වතු නිවාස	150	වතු සමාගම් /ඉ.ප්‍රකෝ.ස	මෙම ස්ථානයේම නා.සං.අධි මගින් ලබා දෙන සැලැස්මකට අනුව ඉදිකිරීම් කිරීම
3	ජෙම්ස් වීදිය නිවාස	50	ගෝල්ෆ් නිවාස	පවත්නා ස්ථානයේම පෞද්ගලික අයෝජකයින් සමග ඒකාබද්ධව වැඩිදියුණු කිරීම
4	ලේඩි මැක්ලම් පාර Mc නිවාස	400	නුවරඑළිය මහ නගර සභාව	ආකෘතිමය විසඳුමක් මගින් පොදු විවෘත ප්‍රදේශ හා ප්‍රවේශ ඉඩ ප්‍රමාණය වැඩි දියුණු කර ගැනීම
5	ගැල්වේස් උද්‍යාන නිවාස	60	නුවරඑළිය මහ නගර සභාව	පවත්නා ස්ථානයේම නිසි සැලැස්මකට සංවර්ධනය කිරීම හා අවශ්‍ය අපරව්‍යුහ පහසුකම් සැපයීම.
	ස්ක්‍රබ් වත්ත	300	LRC /වතු පහසුකම්	පවත්නා ස්ථානයේම සංවර්ධනය කිරීම.

*සිතියම් අංක **6.2** - යෝජිත ඉඩම් පරිහරණ සැලැස්ම*

6.5.1.(අ) 3 නව ස්ථාන වෙත විතැන් කිරීමේ උපාය මාර්ග

වගු අංක **6.3-** නිවාස ඉදිකිරීමේ උපාය මාර්ගය

අංකය	ස්ථානය	නිවාස සංඛ්‍යාව	ඉඩමේ අයිතිය	නිවාස ඉදිකිරීමේ උපාය මාර්ගය
1	යුනික් විවි නිවාස	54	රජයේ	මේ වෙනුවෙන් ස්ක්‍රබ්වත්ත කොටසේ අක්කර 2ක් අත්පත් කරගෙන එහි පදිංචි කිරීම හා ඒ සමගම ස්ක්‍රබ්වත්ත නිවාස කොටසක් අලුතින් ඉදිකිරීම.
2	ස්ක්‍රබ් වත්ත	100	රජයේ	නව නිවාස වල අලුතින් පදිංචි කිරීම
3	ගෝල්ෆ් නිවාස	54	ගොල්ෆ් ක්‍රීඩාංගනය - නුවරඑළිය මහ නගර සභාව	යෝජිත ඉහළ උන්නතාංශ සංකීර්ණ ව්‍යාපෘතිය සමග ඒකාබද්ධව ඉදිකිරීම.
4	බොරලන්ද අඩු ආදායම් නිවාස සංකීර්ණය	50	නාගරික සංවර්ධන අධිකාරිය	පවත්නා ස්ථානයේම අයිතිකරුවන්ගේ ආයෝජනය ඉදිකිරීම් කිරීම.

6.5.1 (ආ) අධ්‍යාපනය

විසල් නුවරඑළිය සංවර්ධන කලාපය තුල ප්‍රාථමික හා ද්විතික අධ්‍යාපන මට්ටම දිස්ත්‍රික්කයේ අනෙක් කලාප සමග සංසන්දය කිරීමේදී පහල අගයක් ගනි. 2016 වසරේදී ජාතික වශයෙන් අ.පො.ස (සාපෙළ) සමත් ප්‍රතිශතය 71%ක් ලෙස හා උසස්පෙළ සමත් ප්‍රතිශතය 70%ක් ලෙස පැවතියද මෙම කලාපයේ එය පිලිවෙලින් 53% ක් හා 50% අගයක් ගනී. මෙම කලාපයේ පාසල් 14 පවතින අතර ලමුන් 8600පමණ අධ්‍යාපනය ලබයි. ඉන් 30%ක් පමණ කලාපයෙන් බාහිරව දෛනිකව අධ්‍යාපන කටයුතු සදහා නගරයට ඇදී එයි.

6.5.1 (ආ) 1. උපාය මාර්ග.

1. ප්‍රදේශයේ පාසල් 14ක් අතරින් ප්‍රමාණවත් ක්‍රීඩා පිටි ඇත්තේ පාසල් 05ක පමණක් වන අතර ප්‍රධාන පාසල් 04ක නව ක්‍රීඩා පිටි සංවර්ධනයක් මෙම සංවර්ධන සැලසුම් මගින් යෝජනා වේ.

   1. හාවාඑළිය වජිරඥාන ක්‍රිඩා පිටිය විධිමත්ව සංවර්ධනය කිරීම.
   2. මිපිලිමාන සේනානන්ද විදුහලේ ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීම
   3. කළුකැලේ ප්‍රාථමික විදුහලේ ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීම
   4. මාගස්තොට මද්දුම බණ්ඩාර විදුහල් ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීම

2. ප්‍රාථමික අධ්‍යාපන අංශ සංවර්ධනය
   නේස්බිවත්ත,ගැල්වේස් ලැන්ඩ් නිවාස,MC නිවාස , යෝජිත ස්ක්‍රබ් නව නිවාස ආශ්‍රිතවහා යෝජිත ගෝල්ෆ් නිවාස වෙත විතැන් කිරීම් ව්‍යාපෘතිය ආශ්‍රිතව පෙර පාසල් සදහා ඉඩකඩ වෙන් කිරීම.

3. තෘතිය අධ්‍යයන සංවර්ධනය
   ප්‍රදේශයේ තෘතිය අධ්‍යයන සංවර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් ආයතන 4ක් පිහිටුවා ඇත. එනම් වත්තිය පුහුණු අධිකාරිය, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය ,නුවරඑළිය කාර්මික විද්‍යාලය හා තරුණසේවා සභාව වේ. මීට අමතරව පෞද්ගලික අධ්‍යාපන ආයතන 02ක්ද පිහිටුවා ඇත.

   ඉදිරි සංචාරක හා කෘෂිකර්මික සංවර්ධන ඉලක්ක කරගත් පාඨමාලා සදහා නව අවස්ථා ඇතිකිරීම.

   I. වත්තිය පුහුණු අධිකාරිය පරිශ්‍රය තුල හෝටල් පාසලක් ආරම්භ කිරීම.

   II. බඹරකැලේ ප්‍රාථමික විද්‍යාලය, මල් වගාව, කෘෂිකාර්මික / පශු සම්පත් සංවර්ධන ආශ්‍රිත වෘත්තිය පුහුණු මධ්‍යස්ථානයක් ලෙස පත් කිරීම

   III. සිතාඑළිය බීජ අල පර්යේෂණ ආයතනය තුල කෘෂිකාර්මික පිළිබඳකෙටිකාලීන පාඨමාලාවක් ආරම්භ කිරීම. ප්‍රදේශයේ ගොවියන්ට යහපත් කෘෂිකාර්මික පිළිබඳව දැනුවත් කිරීම හා යෝජිතGAPසහතික ක්‍රමවේදය සඳහා පාඨමාලාව අවතීර්ණ කිරීම

6.5.1 (ඇ). සෞඛ්‍ය සේවාව

ප්‍රදේශයේ ප්‍රධාන වෛද්‍ය පහසුකම් සපයන ස්ථානය ලෙස නුවරඑළිය මහ රෝහල පත්ව ඇත. එහි නව රෝහල් සංකීර්ණය සමග ජාතික රෝහලක් ලෙස පුළුල් කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වන අතර වර්තමානයේ පවත්නා ඇඳන් ප්‍රමාණය 425 හා වන අතර දෛනික ලෙඩුන් ..... කට සේවය සලසනු ලබයි. වෛද්‍යවරුන් 105 වන අතර නේවාසික රෝගීයෙකුට වෛද්‍ය අනුපාතය ..... වෙයි.එසේම යෝජිත නව රෝහල් සංකීර්ණය සමග ඇඳන් 525 ක් අමතර ඒකතු කරගනු ලැබේ.

6.5.1 (ඇ).1. උපාය මාර්ග

1. නව රෝහල් සංකීර්ණයප්‍රමාණවත් රථ වාහන ගාල් පහසුකම් සංවර්ධනය කිරීම.

I. . ඒ අනුව නව රෝහල තුලට පැමිණෙන සේවා වාහන, වෛද්‍යවරුන්ගේ වාහන හා හදිසි පිවිසුම්මාර්ගයක් ලෙස ලේඩි මැක්ලම් මාර්ගයෙන් නව ප්‍රවේශයක් නව රෝහල තුළට ලබා ගැනීම

II. .උඩපුස්සල්ලාව මාර්ගයේ සිට රෝහල තෙක් ඇති මාර්ගය අවම පළල මීටර් 12ක් ලෙස සංවර්ධනය කිරීම

III.රෝහලේ ප්‍රධාන රථවාහන ගාල සංවර්ධනය

IV..ප්‍රධාන රෝහල ආශ්‍රිතව අපජලය පිරිපහදු කරණය පුළුල් කිරීම හා රෝහල් අපද්‍රව්‍ය දහනාගාරයක් නව රෝහල් පරිශ්‍රයේ පිහිටුවීම

2. පෞද්ගලික රෝහල් ප්‍රවර්ධනය

නුවරඑළිය කලාපය තුල වර්තමොනයේ එක් පෞද්ගලික රෝහලන් පවතින අතර එහි ඇඳන් ධාරිතාව ඇඳන්39ක් වේ.කෙසේ වෙතත් ඉදිරි සංචාරක අපරව්‍යුහ පහසුකම් ප්‍රවර්ධනය උදෙසා අධි ගණත්ව මිශ්‍ර කලාපය තුල ඇඳන් 10-20 අතර පෞද්ගලික රෝහලක් සඳහා ඉඩදීම සුදුසු වේ.

3. ආයුර්වේද ප්‍රතිකාර ප්‍රවර්ධනය

දිස්ත්‍රික්කය තුල ආයුර්වේද රෝහලක අවශ්‍යතාව පැහැදිලි වන අතර සංචාරක ව්‍යාපාරය සංවර්ධනයට සමගාමීව ආයුර්වේද ප්‍රතිකාර මධ්‍යස්ථානයක් ලෙස ආයුර්වේද රෝහලක් ඇති කිරීම. ඒ සඳහා රාජ්‍ය / පෞද්ගලික අංශයට විවෘත අවස්ථාවක් ලබා දීම හා ඉහල වැව පාර නාගරික සංවර්ධන අධිකාරිය සතු ඕක්ලේ කොටේජ් ඉඩමෙන් අක්කර 02ක් ඒ සඳහා වෙන් කිරීම.



සිතියම් අංක 6.8- සාමාජීය හා භෞතික අපරව්‍යුහ පහසුකම් උපාය මාර්ග



සාමාජයීය හා භෞතික අපරව්‍යුහ පහසුකම් සංවර්ධන සැලැස්ම
විසල් නුවරඑළිය සංවර්ධන සැලැස්ම

නාගරික සංවර්ධන අධිකාරිය
නුවරඑළිය
2019

නුවරඑළිය නාගරික සංවර්ධන සැලැස්ම (2019-2030)

සැකැස්ම : නිලන්ත/ පවිත්‍රා

මිහිදුම් කඳුකරයේ පාරාදීසය ලෙස දැක්ම පෙරදැරි කරගෙන පවතින පරිසර පද්ධතිය ආරක්ෂා කිරීම හා පිරිසිදු ජල මූලාශ්‍ර පද්ධතින් හා, නුවරඑළියට ආවේනික ගති ලක්ෂණ මුර්තිමත් කිරීම හා දිදුලන ආරථික පුරවරයක් යන ඉලක්ක සම්පූර්ණ කර ගැනීම සදහා මෙම සේවා උපාය මාර්ග සෘජුව හා වක්‍රව සහය වනු ලැබේ.

නව නිවාස ඉදිකිරීම හා දැනට පවතින අඩු පහසුකම් නිවාස සංවර්ධනය තුළින් දරද්‍රතා මට්ටම පහල අගයකට ගෙන ඒමත් ඒ තුලින් දිදුලන ආර්ථිකයක් යන ඉලක්ක සපුරා ගැනිමට හැකි වනු ඇත. එසේම පරිසර සංවේදී පද්ධති වල ආශ්‍රිතව ඇති පී.ඩබ්.ඩී නිවාස යුනික් විව් නිවාස, විකල්ප ලබා දිම තුලින් පරිසරයට සිදු වන හානිය අවම කර ගැනීමත් ඒ තුලින් පරිසර පද්ධතිය ආාරක්ෂා කර ගැනිම හා පිරිසිදු ජල මූලාශ්‍ර පද්ධතියක් යන ඉලක්කය සපුරා ගැනීමට හැකි වනු ඇත.

නුවරඑළිය නගරයේ 21% වන පැල්පත් හා අඩු පහසුකම් නිවාස ප්‍රතිශතය 10% දක්වා අඩු කිරීම යන අරමුණ යටතේ දැනට පවතින අඩු පහසුකම් නිවාස වැඩි දියුණු කිරීම තුලින් නුවරඑළියේ භූදර්ශන පථ අවහිර වීම වැලැක්වීම හා පරිසර අලංකාරය වැඩි දියුණු වීම නිසා නුවරඑළියේ ගති ලක්ෂණ මුර්තිමත් කිරීම යන ගති ලක්ෂණ සපුරාලීමට හැකි වනු ඇත.

නව ක්‍රීඩාංගන සංවර්ධන හා ප්‍රාථමික පාසල් සංවර්ධනය තුළින් දිදුලන ඉසුරුමත් පුරවරයක් සඳහා නේවාසික ජනතාවගේ ජීවන තත්වය ඉහළ නැංවීමටත් යෝජිත නේවාසික භාවිතය සඳහා ඉල්ලුම් වැඩි කිරීමට මිපිලිමාන හා බැලැක්ෆුල් යන ප්‍රදේශ වල නේවාසික ආකර්ෂණය සඳහා ඉවහල් වනු ඇත.

තෘතිය අධ්‍යාපන සංවර්ධනය යටතේ සංචාරක ක්ෂේත්‍රයේ හා කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ පුහුණු ස්ථාන ඇති කිරීම තුළින් දෛනික සංචාරක ආගමනය 24000ක් සඳහා සේවා සැපයීමට අවශ්‍ය මානව සම්පත පුහුණු කිරීම සිදුකල හැක. එමගින් දිදුලන ඉසුරුමත් පුරවරයක් යන ඉලක්කය සපුරා ගත හැක. නිවැරදි කෘෂිකාර්මික භාවිතයක් සඳහා ජනාතව හුරුකිරීමෙන් පරිසර පද්ධතිය ආරක්ෂා කර ගැනීම සදහා ඉලක්කය සම්පූර්ණ කර ගැනිමට හේතුවේ.

සෞඛ්‍ය සේවාව යටතේ දැනටමත් සංවර්ධනය කරනු ලබන රෝහලේ රථවාහන ගාල් ප්‍රවර්ධනය තුළින් සෞඛ්‍ය පහසුකම් ලබා ගන්නා ජනතාවගේ සේවා සංවර්ධනයට ඉවහල් වන අතර එය දිදුලන ඉසුරුමත් පුරවරයක් යන ඉලක්කය සපුරා ගැනීමට සහය වේ.

පෞද්ගලික රෝහල් ප්‍රවර්ධනය හා ආයුර්වේද රෝහලක් ඇති කිරීම තුළින් සංචාරක ආගමනයට රුකුලක් වන අතර ඒ තුළින් දිදුලන ඉසුරුමත් පුරවරයක් යන ඉලක්කය සපුරා ගත හැකිවේ.

6.5.2 ප්‍රවාහනය

6.5.2.1. හැඳින්වීම

නුවරඑළිය නගරය සංචාරක කේන්ද්‍රස්ථානයක් මෙන්ම දිස්ත්‍රික්කයේ පරිපාලන කේන්ද්‍රස්ථානයක් ලෙසද කටයුතු කරනු ලැබේ. 2012 වසරේ දිස්ත්‍රික් ජනගහනය 706210 ක් වන අතර 2028 වන විට එය 7012000 පමණ අගයක් ගනු ඇත මේ අනුව පරිපාලන හා අනෙකුත් කටයුතු සඳහා නුවරඑළිය නගරයට ඇදී එන ජනහගහනය දෛනිකව 62000ක් පමණ වනු ඇත. එසේම දෛනික සංචාරක පැමිනීම සමානය 24000 පමණ වනු ඇත. මේ අතර 2016 වසරේ 52500ක් වන ප්‍රෙද්ශයේ ජනගහනය 2028 වන විට 60000ක අගයක් ගනු ඇත.

මෙම සමස්ත සංචාරක ජනතාවගෙන් 75% පමණ බාවිතා කරණු ලබන්නේ පෞද්ගලික ප්‍රවාහන මාධ්‍ය වන අතර සංක්‍රමනික ජනතාවගෙන් 50%කට ආසන්න ප්‍රමාණයක් පොදු මගී ප්‍රවාහනය භාවිතා කරනු ලබයි.

6.5.2.2. උපාය මාර්ග

01.පොදු ප්‍රවාහන ක්‍රම ශක්තිමත් කිරීම.

නගරයට ඇදී එන ජනතාව සඳහා පොදු ප්‍රවාහන සේවා විධිමත් කිරීමත් වැඩි ජනතාවක් පොදු ප්‍රවාහන සේවා මගින් අද්දවා ගැනීමත් සිදු කිරීම.

(අ) සංචාරකයන් වැඩි ප්‍රමාණයක් දුම්රිය මගින් ගෙන්වා ගැනීම හා දුම්රිය සමග ඒකාබද්ධ මගී ප්‍රවාහන සේවයක් නානුඔය දුම්රිය ස්ථානයේ සිට නුවරඑළිය නගරය තෙක් ඇති කිරීම

(ආ) නානුඔය දුම්රිය ස්ථානය කේන්ද්‍රකර ගනිමින් එතැන් සිට නගර මධ්‍යයට, ග්‍රෙගරි වැව උද්‍යානයට සංචාරකයන් ඉලක්ක කර ගත් කේබල් කාර් ව්‍යාපෘතිය ඇති කිරීම හා එය ප්‍රවාහන මාධ්‍යක් ලෙස භාවිතා කිරීම.

(ඇ) නුවරඑළිය බස්නැවතුම්පොල 2වන අදයර සංවර්ධනය කිරීම හා බස්නැවතුම්පොල තුල කාර්යක්ෂමව ඉඩකඩ කළමනාකරණය කිරීම.

(ඈ) පෙරටු බස් නැවතුම් සඳහා උඩුපුස්සල්ලාව මාර්ගය දෙපස, ඉහල වැව මාර්ගය දෙපස හා ග්‍රෙගරි වැව රථවාහන ගාල් භාවිතා කිරීම හා ඒ මගින් බස්නැවතුම්පලේ තදබදය අවම කිරීම

1. නගර අභ්‍යන්තරයේ තිරසාර ප්‍රවාහන ක්‍රමයක්.

(අ) නගරය ආශ්‍රිතව හා ග්‍රෙගරි වැව විනෝදාත්මක කලාපය, නගරය අධිසඝත්ව සංචාරක කලාපය හා අධි සඝත්ව වාණිජ කලාපය යා කරන පදික හා පාපැදි ප්‍රවාහන ක්‍රමයක් ස්ථාපිත කිරීම. මෙමගින් ග්‍රෙගරි වැව ආශ්‍රිත කාලපය සිට නානුඔය ඇල රක්ෂිතය දිගේ පේරාදෙණිය බදුල්ල A 5 හා උඩුපුස්සල්ලාව මාර්ගය දිගේ පදික මංතීරු හා පාපැදි මන්තීරු ඉදිකිරීම.

(ආ) ග්‍රෑන්ඩ් හොටෙල් පාර, නව නුවර පාර හා උද්‍යාන පාර, ලේඩි මැක්ලම් පාර, යුනික් විව් පාර ආශ්‍රිතව පදික මංතීරු ඇති කිරීම

(ඇ) සංචාරකයින් වැඩි පිරිසක් පැමිණෙන තදබදය වැඩි කාල වලදී නගරය තුල නගර සේවා ප්‍රවාහන ක්‍රමයක් ඉදිකිරීම තුලින් පෞද්ගලික වාහන අවම කිරීම.

(ඈ) නගර මධ්‍යය් පදිංක මංතීරු වගින් ඇතිවන තදබදය අවම කිරීම සදහා ලෝසන් වීදියේ ලෝසන් චතුරශ්‍රය ඉදිරිපිට උමං පදික මාර්ගයක් ඉදිකිරීම හා එය යෝජිත මධ්‍යම වෙළඳපොල දක්වා දීර්ඝ කිරීම හා බස්නැවතුම්පොල ඉදිරිපිට ටෙලිකොම් පදික මංතීරුව සදහා උමං මාර්ග ඉදිකිරීම.

(ඉ) යුනික් විව් මාර්ගයේ සිට බදුල්ල මාර්ගයට සමාන්තරව ග්ලේන්ෆෝල් මාර්ගය හරහා ග්‍රෑන්ඩ් හෝටල් මාර්ගය සම්බන්ධ කරමින් නව පදික මාර්ග ජාලයක් ඇති කිරීම

(ඊ) නානුඔය ඇලේ දකුණු ඉවුරේ හා උද්‍යාන පාර ආශ්‍රිතව පදික මාර්ග ඇති කිරීම

2. ආවරණ සහිත පදික මංතීරු

(අ) නගර මධ්‍යයේ එළිසබත් රැජින මාවත නව නුවර පාර පැරණි උඩපුස්සැල්ලාව පාර උසාවිය පාර උද්‍යාන පාර හා ලෝසන් වීදිය සියළු පදික මාර්ග ආවරණ සහිත පදික මංතීරු ලෙස සංවර්ධනය කිරීම

3. ප්‍රධාන මාර්ග හා නගර මධ්‍යයේ තදබදය අවම කිරීම

විශේෂයෙන් සංචාරකයින් බහුලව පැමිණෙන වසන්ත සමයේදි මෙන්ම සති අන්ත නිවාඩු කාල වලදි නගර මධ්‍යයේ පේරාදෙණිය බදුල්ල මාර්ගයේ රථවාහන තදබදයක් දක්නට ලැබේ. (සිතියම් අංක) එමෙන්ම සංචාරක හෝටල් බහුලව ඇති යුනික් විව් මාර්ගය ග්ලේන්ෆෝල් මාර්ගය හැඩන්හිල් මාර්ගය ඉහළ වැව මාර්ගය ගැමුණුපුර මාර්ගය හා බේකර්ස්ෆාම් මාර්ගය තදබදය වැඩි වීමක් පෙන්නුම් කරයි. මෙම තත්වය අවම කිරීම සඳහා එම මාර්ග පුළුල් කිරීම හා පදික ගමනාගමනයට සංවර්ධනය කිරීම කල යුතුවේ.

ඒ අනුව පහත සඳහන් මාර්ග ඒ ඒ කණ්ඩාංක ස්ථානයේ සිට අවම පළල මීටර් 9ක් වන ලෙස පුළුල් කිරීමට යෝජනා කරනු ලැබේ.



*වගු අංක **6.4-** මාර්ග සංවර්ධන ව්‍යාපෘති*

අංකය	මාර්ගය		කණ්ඩාංකඅගය	
		කණ්ඩාංක ස්ථානය	අක්ෂාංශ	දේශාංශ
අ	යුනික්විව් පාර	1	6.963183°	80.766802°
		2	6.963303°	80.762125°
ආ	ග්ලෙන්ෆෝල් පාර	1	6.967167°	80.766553°
		2	6.966035°	80.762083°
ඇ	හැඩන්හිල් පාර	1	6.962537°	80.766718°
		2	6.961483°	80.763590°
ඈ	ලේඩිමැක්ලම් පාර	1	6.970334°	80.784507°
		2	6.973198°	80.771879°
		3	6.977272°	80.768346°
		4	6.976908°	80.767072°
		5	6.977326°	80.765488°
		6	6.976876°	80.765215°
		7	6.976525°	80.764472°
ඉ	ඉහළ වැව පාර	1	6.966681°	80.772169°
		2	6.952154°	80.787155°
ඊ	මාගස්තොට - බ්ලැක්ෆුල් පාර	1	6.947405°	80.791090°
		2	6.945892°	80.789567°
		3	6.942315°	80.777272°
උ	සඳකැන්න පාර	1	6.954727°	80.787399°
		2	6.970076°	80.785663°
ඌ	බාරෝස් පාර	1	6.972220°	80.775379°
		2	6.968925°	80.779421°
එ	ජයතිලක මාවත	1	6.973944°	80.767163°
		2	6.977217°	80.768351°
ඒ	කනගරත්නම් පාර	1	6.974697°	80.767670°
		2	6.976469°	80.766378°
ඔ	ග්ලේන්ෆෝල් අතුරු මාර්ගය	1	6.965870°	80.767262°
		2	6.967150°	80.766555°

4. සියළු මාර්ග ආශ්‍රිතව පදික මාරු හා භූදර්ශන අලංකරණ සඳහා වන සම්මත නියමයන් ඇති කිරීම. ඒ අනුව ඉදිරියේදී සංවර්ධනය කරනු ලබන සියළුම මාර්ග වල අවම මීටර් 1ක පළලින් යුතු පදික මාර්ග මාර්ග දෙපසේම හා අවම පළල මීටර් 0.5ක පළලින් යුත් රුක් රෝපණ හෝ නුවරඑළියට ආවේනික මල් / එළවළුවගා තීරුවක් ඇති කිරීම. එසේම සියළුම අලුතින් සංවර්ධනය කරනු ලබන මාර්ග සඳහා මාර්ගයට සමාන්තරව සේවා සැපයීම සඳහා කවුළු **(MultiService duct)** කවුළු අනිවාර්යය කිරීම



සිතියම අංක 6.9- මාර්ග සංවර්ධන ව්‍යාපෘති

6.5.3 පානීය ජල සැපයුම.

6.5.3.1. හැඳින්වීම

නුවරඑළිය මහ නගර සීමාවේදී පානිය ජලය බෙදා හැරීම නුවරඑළිය මහ නගර සභාව මගින් සිදුකරනු ලැබේ. ජල සම්බන්ධතා 6977ක් (නේවාසික හා වාණිජ) මුළු ජනගහනයේ 35000ක් පමණ පානිය ජලය බෙදාහරිනු ලබයි. නේවාසික ඒකක 3950, වාණිජ 411 ගෘහ නොවන 950 ක ආයතන හා වෙනස් ලෙස 245 ලෙස සම්බන්ධතා ලබා දී ඇත. දෛනික ඝන මීටර් 4500ක පමණ අවශ්‍යතාවයක් පවතින අතර ඉන් 72% නේවාසිකද 18% වාණිජ හා සංචාරක බැවින්ද රජයේ හා පෞද්ගලික ආයතන හා සදහා 10%ක් ලෙසද සපයනු ලබයි.

මෙම සියලු ජල සැපයුම් ජල පෝෂක ලෙස ස්වභාවකි ජල බැල්පත් 9ක් මගින් ජලය ලබා ගන්නා අතර එම ජලය ගබඩා ජලාශ 15ක් මගින් කලාප 7ක් මගින් ආවරණය කර බෙදා හරිනු ලැබේ. එසේම වියලි කාළගුණ තත්වය යටතේ ඇතිවන ජල හිගය සදහා නළ ළිං 9ක් මගින් අමතර ජල අවශ්‍යතාවය ආවරණය කරනු ලබයි. වියලි සමයේදී ප්‍රධාන ජල මූලාශ්‍ර මගින් සපයනු ලබන්නේ ඝණ මීටර් 3500ක ප්‍රමාණයක් බැවින් නල ළිං මගින් අමතර ජල අවශ්‍යතාවය වන ඝණ මීටර් 1000ක සැපයුමක් සපයනු ලබයි.

මින් සම්පූර්ණ ජල අවශ්‍ය තාවය 70%ක් පමණ හැඩන්හිල් කලාප වන අතර ප්‍රධාන ජල මූලාශ්‍ර වශයෙන් පීඩa හා ටොප්පාස් ජල උල්පත් කටයුතු කරනු ලැබේ. නගරයේ ප්‍රධාන නේවාසික/සංචාරක හා වාණිජ කලාප මෙමගින් ආවරණය කරනු ලබන අතර ප්‍රධාන ගබඩා ටැංකි 5කින් යුක්ත වේ.

එසේම ලවස්ලිප් හා ලෝවර් ඒරියා කලාප මගින් හාවාඑළිය මගින්ද රෝහල අවට ප්‍රදේශය ආවරණය කරනු ලබන අතර දිනකට ඝන මීටර් 1750ක් පමණ සපයනු ලබයි.
ප්‍රධාන නේවාසික හා වැසි ජන ගහණත්වයක් ඇති හා ප්‍රධාන රෝහල පිහිටා ඇති කලාපය සදහා මෙම ජල පෝෂකය මගින් සපයනු කරනු ලැබේ.
කෙසේ වෙතත් මෙම කලාප වියලි සමයේදී එනම් ජනවාරි - අප්‍රේල් කාලවලදී ධාරිතාව පමන 900 අඩු වන බැවින්H1, H2, H3, H4 නල ලිං මගින්ද ජලය ලබා ගෙන බෙදා හැරේ.

කෙසේ වෙතත් වියලි කාල සීමාවලදී එනම් දෙසැම්බර් - අප්‍රේල් කාල සීමාවලදී ජල මූලාශ්‍රවල ධාරිතාව දෛනිකව 3500ක් දක්වා අඩුවන අතර දෛනික ජල ඉල්ලුම 5500ක් පමණ දක්වා වැඩි වේ. මේ සදහා දෙසැම්බර් සහ අප්‍රේල් මාස වල සංචාරක ආගමනය වැඩි වීමත් සමග ඇති වන ඉල්ලුමද මේ තත්ත්වයට බලපානු ලබයි.

නුවරඑළිය ප්‍රාදේශිය සභාවට අයත්වන රුවන්පුර, මිපිලිමාන, කටුමාන හා බ්ලැක්ෆුල්, ශාන්තිපුර ප්‍රදේශය සදහා වෙන වෙනම ප්‍රාදේශිය හා ග්‍රාමීය ජල සැපයුම් පද්දති ක්‍රියාත්මක් වන අතර ඒ සදහා නුවරඑළිය ප්‍රාදේශිය සභාව මගින් විධිමත්ව මැදිහත්වීමක් නොමැත.

6.5.3.2. උපාය මාර්ග

01 - විශ්වාසනිය ජල සැපයුම

නේවාසික හා සංචාරක ජවගහනය වෙනුවෙන් අඛණ්ඩ පානීය ජල සැපයුම මෙයින් අරමුණු කර ගනු ලැබේ. ඒ අනුව 2028 වන විට 60000ක් වන මුළු ජනගහනය වෙනුවෙන් හා දෛනික සංචාරක ජනගහනය වන 35000 ක් හා දෛනික අනෙකුත් අවශ්‍යතා සඳහා පැමිණෙන සංක්‍රමණික ජනතාව වන 52000ක් වෙනුවෙන් ජල අවශ්‍යතාවය කියුබික් මීටර් 9500ක් ලෙස ගණනය කරනු ලැබේ. මේ අනුව දැනට සපයනු ලබන කි.මී 4500ක් වන ජල සැපයුමට අමතරව තවත් කි.මී. 5000ක ජල මූලාශ්‍ර මෙමගින් හඳුනා ගනු ලැබේ.

(අ). මධ්‍යගත ජල පිරිපහදු මධාස්ථානයක්

(ආ).ලවර්ස්ලීප් ජල තටාංගණය

ලවර්ස්ලීප් දියඇල්ල පාමුල පිඩa වතු යායට අයත් අක්කර 7ක පමණ වූ භූමි ප්‍රදේශයක ජලය එක්රැස් කරනු ලබන ජලාශයක් ඉදිකිරීම. එමගින් අක්කර අඩි 15ක පමණ ධාරිතාවයකින් යුත් ජලය එක්රැස් කරනු ලබන ජලාශයක් ඉදිකිරීම වන අතර ප්‍රධාන ජල මූලාශ්‍රය ලෙස ලවර්ස්ලීස් දිය ඇල්ලේ ජල මූලාශ්‍රය ලබා ගැනීම.

(ඇ).කටුමාන හා සිතා එළිය ආශ්‍රිතව හග්ගල වනාන්තරයේ ජල පෝෂිත භාවිතා කරමින් පදිංචි නේවාසික හා සංචාරක ඒකක සඳහා වූ ජලය සණ මීටර් 1000 සඳහා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කෙරේ.

(ඈ). මිපිලිමාන හා රුවන්එළිය කලාපය සඳහා 2028 වන විට අපේක්ෂිත නේවාසික හා සංචාරක ඒකක් සඳහා ජලය සන මීටර් 2000 ප්‍රමාණයක් සඳහා ජල සම්පාදන ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම. මෙම ප්‍රදේශ සඳහා දැනට පානීය ජලය බෙදාහරිනු ලබන නුවරඑළිය මහනගරසභා සැපයුම් පද්ධතිය සමග සම්බන්ද කිරීම.





සිතියම් අංක 6.10 මධ්‍යම ජල පිරිහෙළ ඒකකය හා ජල කටාංගාරය

6.5.4 විදුලි බල හා දුරකථන පහසුකම්

6.5.4.1 හැඳින්වීම.

විසල් නුවරඑළිය කලාපය තුල 2017 වන විට ජනගහනය 59000ක් හා දෛනික සාමාන්‍ය සංචාරක ප්‍රමාණය 7300 පමණ වන අතර උපරිම දෛනිකව සංචාරකයින් පැමිණිම 15000ක් ලෙස වාර්තා වේ. මේ අතර දෛනිකව අනෙකුත් අවශ්‍යතාවයන් සදහා නගරයට ඇදී එන සංක්‍රමනික ජනගහනය 40000ක් පමණ වේ. එසේම 2028 වන විට කලාපය තුල ජනගහනය 60000ක ඉලක්කයක් හා දෛනික සංචාරක සාමාන්‍ය 23000ක්ද එය උපරිමය 33000ක් ලෙසද පුරෝකථනය කල හැකිය.

ඒ අනුව වර්තමානයේ සමස්ත ප්‍රදේශ සදහා දෛනිකව විදුලි බලය කිලෝවොට් 8156ක ප්‍රමාණයක් අඛණ්ඩව ලංකා විදුලි බල මණ්ඩලය මගින් සපයනු ලැබේ. 2028 වන විට නේවාසික, සංචාරක හා සංක්‍රමනික ජනතාව වෙනුවෙන් අමතර කිලෝවොට් 4700ක ප්‍රමාණයක් සමග 9665ක විදුලි ධාරිතාවක් අවශ්‍ය වන බව පුරෝකතනය කල හැකිය. ඒ අනුව ඒ ඒ කලාප වලට අවශ්‍ය පුරෝකථනය කරන ලද විදුලි ධාරිතාවය සිතියම් අංක 6.9 මගින් දැක්වේ.

එසේම ප්‍ර දේශයේ පුරා ශ්‍රී ලංකා ටෙලිකොම් දුරකථන සම්බන්ධතා ප්‍රමාණවත් පවතින අතර අනෙකුත් සියලුම් දුරකථන ජාල සම්බන්ධතා ප්‍රමාණවත්ව පවති. කෙසේ වුවත් 2028 වන විට දෛනික උපරිම සංචාරක ආගමනය 33000ක් ලෙස ගණනය කර ඇති බැවින්ද දල සංචාරක රාත්‍රී ප්‍රමාණය දින 4ක් දක්වා වැඩි කිරීම තුලින් එකවර ග්‍රාහකයින් 100000 ආසන්න ප්‍රමාණයකට පහසුකම් සැපයීම සදහා කටයුතු කල යුතුව ඇත.

ඒ අනුව ඉදරි සංචාරක සංවර්ධණය උදෙසා අවශ්‍ය ප්‍රධාන අපරව්‍යුහ පහසුකමක් වන විදුලිය හා සන්නිවේදන පහසුකම් සපුරාලීම තුළින් සංචාරක ක්ෂේත්‍රෙය් ප්‍රගමනයත් ඒ තුළින් දිදුලන ආර්ථිකයක් යන ඉල්ලක්කයත් සම්පුර්ණ කර ගත හැකිය.



6.5.5 ජලපවහනය හා මලපවහන සැලැස්ම

6.5.5.1 හැඳින්වීම.

නුවරඑළිය ප්‍ර දේශයට පසුගිය වසර 10 තුල ලැබි ඇති වර්ෂාපතනය පිලිබඳ සැලකීමේදී සාමාන්‍ය වාර්ෂික වාර්ෂාපතනය මි.මි 2000ක් පමණ වන අතර පසුගිය වසර 10 තුල 2010 වසරේදී මි.මි 2182ක් හා 2013 වසරේදී 2157ක් ලෙස උපරිම අගය වාර්තා කරයි. (වගු අංක 6.4)

*වගු අංක **6.5** -* සාමාන්‍ය වාර්ෂික වාර්ෂාපතනය

වර්ෂය	වාර්ෂික වර්ධනය මි.මි
2007	1675.7
2008	1587
2009	1639.9
2010	2182.3
2011	1699.6
2012	1971.1
2013	2157.9
2014	1857.7
2015	2021.2
2016	1137

කෙසේ වෙතත් වැඩිම වර්ෂාපතනයක් වාර්තාවන්නේ ජුනි, ජුලි අගෝස්තු සැප්තැම්බර් මාස වල වන අතර පසුගිය වසර 10 තුලදී දිනකදී වාර්තා වන ලබන උපරිම වර්ෂාපතනය 2015.02.05 දින මි.මි 120ක් ලෙස වාර්තා වී ඇත. ඒ අනුව වර්ග කිලෝමීටර් 56.78 පමණ වූ සම්පුර්ණ ප්‍ර දේශයටම උපරිම වර්ෂාපතන අවස්ථාවකදී ජලය කියුබික්මීටර් 6814000 ක ආසන්න ප්‍රමාණයක් ලැබේ.

කෙසේ වෙතත් සමස්ත විසල් නුවරඑළිය කලාපය තුල වර්ග කිලෝමීටර් 50කට ආසන්න ප්‍රමාණයක් වනාන්තර තේවගාව හා කෘෂිකාර්මික ඉඩම් වලින් සමන්විත වන බැවින් ජල ප්‍රමාණයේ 50% පමණ පොළොවට උරාගනු ලැබිය හැකි අතර ඉතිරිය ප්‍රධාන ජල මාර්ග හරහා ගලා යනු ලැබේ.

මේ සදහා ප්‍රධාන ජල මාර්ග හා ඇල මාර්ග කිලෝමීටර් ක ප්‍රමාණයක් ප්‍ර දේශය පුරා පැතිර පවතින අතර නානුඔයඇල බ්‍රැක්ප්ලේන් ඇල , තලගල ඔය, වෝටර් ෆීල්ඩ් ඇල, ග්ලේන්ෆෝල් ඇල, කටුමාන ඇල, ඒ අතර ප්‍රධාන වේ. මෙම ජලය ප්‍රධාන වශයෙන් ග්‍රෙගරි වැව බ්‍රැක්ප්ලේන් වැව හා කටුමාන වැව හරහා මහවැලි ගග පෝෂණය කරනු ලබයි.

කෙසේ වෙතත් නුවරඑළිය නගරය තුල ජලය බැස යන කාණු අවහිර වීම ප්‍රධාන ජල මාර්ග හා ජලාශ ආශ්‍රිතව රොන් මඩ තැන්පත් වීම ජල මාර්ග රක්ෂිත විවිධ කටයුතු සදහා ආක්‍රමණය කිරීම ගැටලු කාරී තත්ත්වයක් ලෙස හදුනා ගෙන ඇත.

විසල් සංවර්ධන සැලසුම් කලාප තුල පවතින පරිසර පද්ධතිය ආරක්ෂා කරමින් පිරිසිදු ජල මූලාශ්‍රයක් වන ඉලක්කය සම්පුර්ණ කිරීම සදහා එහි සියලු ජල මාර්ග වල අවහිරයන් හා බාධාවන් ඉවත් කිරීම සිදු කල

යුතු වේ. ඒ අනුව මෙම උපාය මාර්ග මෙම සැලැස්මේ ප්‍රධාන ඉලක්ක සම්පූර්ණ කිරීම සඳහා සෘජුව සහය වේ.

එසේම ජල මූලාශ්‍ර වෙත අප ජලය හා මලඅපවහන එකතුවීම වැලැක්වීම සඳහා ඒ ඒ සංවර්ධන කටයුතු ආශ්‍රිතව වෙන වෙනම පිරිපහදු කරන පිහිටුවීමත් මධ්‍යගත පරිපහදු ජාලයක් ස්ථාපිත කිරීමත් මෙම සැලැස්මේ ප්‍රධාන ඉලක්කවන පරිසර පද්ධතිය ආරක්ෂා කරමින් පිරිසිදු ජල මූලාශ්‍රයක් යන්න සම්පූර්ණ කිරීමට සෘජුව දායක වේ.

6.5.5.2 උපාය මාර්ග

01. නිදහස් හා ස්වභාවික ජල බැස්ම සඳහා ඉඩකඩ

භූවිෂමතාවය අනුව මනා ජල බැස්මක් සහිතව දළ වශයෙන් අංශක 10ත් 20ත් අතර සිට අංශක 40 දක්වා පරතරයකින් යුත් බෑවුම් සහති ඉඩම් පිහිටා ඇත. කෙසේ වුවද නගර මධ්‍යයේ නානුඔය ඇල හා ග්‍රෙගරි වැව ආශ්‍රිතව මෙන්ම බ්‍රුක්පේලෙන් වැව ආශ්‍රිතව පහත්බිම් කොටස් වල ජල අපවහනය මන්දගාමීව සිදුවන බැවින් එහි වැසි ජලයෙන් යටවීම වැලැක්වීම සඳහා වැසි ජලය නිදහසේ ගලා බැසීමට ඉඩකඩ සැලසීම මෙමගින් ප්‍රධාන වශයෙන් අදහස් කෙරේ. ඒ අනුව බ්‍රුක්පෙලෙන් ජලාශය ජලය සපයනු ලබන ප්‍රධාන ඇල මාර්ග පුළුල් කිරීම, රොන් මඩ ඉ වත් කිරීම , දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, නුවරඑලිය මහ නගර සභාව හරහා ගලා යන කාණු පද්ධතිය පුළුල් කිරීම, සඳතැන්න මාර්ගය ආශ්‍රිත කාණු පද්දතිය සංවර්ධනය, තලගල ඔය,වෝටර් ෆීල්ඩ් ඇල හා නානුඔය ඇල රක්ෂිත ආක්‍රමනයන් ඉවත් කර ඇල පුළුල් කිරීම, කටුමාන ඇලේ ජල ප්‍රවාහන මාර්ගය පුළුල් කිරීම ප්‍රධාන ව්‍යාපෘති ලෙස හඳුනා ගනු ලැබේ.

02. ඇල මාර්ග සඳහා රොන් මඩ රැඳවුම් ඉදිකිරීම.

විසල් නුවරඑළිය කලාපය තුළ පිහිටි ප්‍රධාන ජල මූලාශ්‍ර වල මඩ තැන්පත් විම අවම කිරීම සඳහා ක්‍රියා මාර්ග ගැනීම මෙයින් සිදුකෙරේ. ඒ අනුව නානුඔය ඇල ග්‍රෙගරි වැවට එක් වීමට ප්‍රථම රොන් මඩ රදවනයක් ඉදිකිරීම, බ්‍රෘන්ප්ලේන් ජලාශයේ ප්‍රධාන පෝෂිත ඇල මාර්ග දෙක සඳහා මඩ රදවන ඉදිකිරීම හා කටුමාන ඇල සඳහා මඩ රදවන ඉදිකිරීම ප්‍රධාන ව්‍යාපෘති ලෙස හඳුනා ගනු ලැබේ.

03. **මලාපවහන පද්ධති සංවර්ධනය**

නුවරඑළිය නගර සීමාව තුල මලාපහන පද්ධතියක් නොමැති අතර නගරයට අවශ්‍ය පරිදි මධ්‍යගත මලාපවහන හා අපජලය පවිත්‍ර කිරීමේ පද්ධතියක් සඳහා නුවරඑළිය මහ නගර සභාව මගින් ජපන් බැංකු ආධාර යටතේ ආරම්භ කිරීමට යෝජනා වී ඇත. ඒ අනුව 20128 වන විට අපේක්ෂිත නේවාසික හා සංචාරක ඝනත්ව ප්‍ර දේශ සංවර්ධනය කරමින් මෙම මධ්‍යගත මලාපවහන පද්දතිය ක්‍රියාත්මක කිරීමට යෝජනා කර න අතර මධ්‍යම පිරිසිදු ස්ථානය ලෙස බ්ලැක්ෆුල් GPS බණ්ඩාංක 6.950552° හා 80.768683° පිහිටි ස්ථානයේ යෝජනා කරන ලදි.

එසේම ඉදිරියේදී ඉදිකරනු ලබන සියලුම කාමර 5ක වඩා වන සංචාරක හෝටල් සදහා හා නාගරික හෝටල් සදහා අප ජලය පිරිපහදු කරණයක් ස්ථාපිත කිරීම සදහා රෙගුලාසි මෙම සැලැස්සම මගින් යෝජනා කරන ලදි.

6.5.6 ඝන අපද්‍රව්‍ය හා අපජලය කළමනාකරණය

නුවරඑළිය මහනගර සභාව මගින් තම සීමාව තුල දිනකට ඝන අප ද්‍රව්‍ය ටොන් 25ක් පමණ එක්රැස් කර ගනු ලබන අතර ඉන් ටොන් 20ක් (80%) පමණ දිරන අපද්‍රව්‍යවන අතර ඉන් ටොන් 5 ක් 20%ක් පමණ නොදිරන අපද්‍රව්‍ය වේ.

එසේම නුවරඑළිය මහ නගර සභාව වෙත පිටතින් පිහිටී නුවරඑළිය ප්‍රාදේශිය සභාවේ සීමාව තුළ ප්‍රධාන මාර්ග ආශ්‍රිතව පමණක් අපද්‍රව්‍ය එක් රැස් කිරීමසිදුවන අතර නේවාසික ප්‍රදේශ ආවරණය වන පරිදි ඝන අපද්‍රව්‍ය එක්රැස් කිරීම දක්නට නොලැබේ.නුවරඑළිය මහනගර සභාව සතු සදතැන්න ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම් ස්ථානයේ කිසිදු වෙන් කිරීමක් නොකර බහාලන අතර ඉදිරි වසර 10-15 කාලයක් සඳහා මෙම ඉඩ කඩ ප්‍රමාණවත් වේ. තව දුරටත් ඝන මීටර් 60,000ක පමණ මෙම ස්ථානයේ බැහැර කල හැකි ධාරතාවයකින් යුක්තවේ. කෙසේ වෙතත් මෙම අපද්‍රව්‍ය බහාලන ස්ථානය තව දුරටත් ඉදිරි වසර 30ක කාලයක් භාවිතා කල හැකි පරිදි ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය කාර්යක්ෂමව හා ඵලදායි ලෙස සිදු කිරීමට මෙම සංවර්ධන සැලැස්ම මගින් උපාය මාර්ග 3ක් හඳුනා ගනු ලැබේ. මෙම උපාය මාර්ග සමඟ සෘජුව කෘෂිකාර්මික සඳහා වන උපාය මාර්ග සමඟ ගැලපෙන ආකාරයට වක්‍රව සංචාරක ව්‍යාපාරය වැඩිදියුණුවීම තුළින් ආර්ථික සංවර්ධන උපාය මාර්ග සමඟ ඒකාබද්ධ වේ.

6.5.6.1 උපාය මාර්ග

1. **අපද්‍රව්‍ය තවදුරටත් අපද්‍රව්‍ය නොවීම**

ඉදිරි ජනඝන වර්ධනය හා සංක්‍රමණික ජනඝන වර්ධනය අනුව දෛනිකව එක්රැස් වන ඝන අපද්‍රව්‍ය ප්‍රමාණය ටොන් 32ක් පමණ 2028 වන විට අපේක්ෂා කල හැකි අතර 1.1 යටතේ නේවාසි පරිශ්‍රයන් තුලදීම අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමේ ක්‍රියාත්මක කිරීම තුලින් මෙම ප්‍රමාණය ටොන් 20 දක්වා අඩු කිරීම සිදු කල හැකිය. ඒ අනුව මෙම දෛනික දිරන අපද්‍රව්‍ය කොම්පොස්ට් ව්‍යාපෘතියක් සදහා යොමු කිරීම.සංවර්ධන සැලසුම් කලාපය තුළමධ්‍ය ඝනත්ව, උණ ඝනත්ව මිශ්‍ර, නේවාසික හා සංචාරක කලාප තුළ පිහිටි සියළුම පරිශ්‍ර තුල දිරන ඝන අපද්‍රව්‍ය කොම්පොස්ට් කිරීමේ ක්‍රමවේදයක් ඇති කිරීම. මෙම කලාපයන්හි ගොඩනැගිලි සැලසුම් සමඟ කොම්පොස්ට් බඳුනක් පිහිටුවීම අනිවාර්යය කිරීම හා නුවරඑළිය මහ නගර සභාව මගින් නොදිරන අපද්‍රව්‍ය පමණක් එක් රැස් කිරීම. මෙය දැනට සඳතැන්න අපද්‍රව්‍ය කළමනාකරණය මධ්‍යස්ථානය තුල පිහිටුවීම ඒ අනුව උක්ත කලාපයන් වලදි සියළුම පරිශ්‍රයන් ආශ්‍රිතව කොම්පොස්ට් බඳුන් ඉදිකිරීම තුළින් තම ගෙවත්තේ කාබනික පොහොර සඳහා උනන්දු කරලීම මෙයින් සිදුකරනු ඇත. මෙම කලාපයන් තුළ භූමි ආවරණ අනුපාතය උපරිම 50% වන බැවින් ඉතිරි බිම් කොටස් වල උඩරට එළවළු වගාව මල් වගාව හා භූදර්ශන කටයුතු සඳහා ඉඩදෙනු ලැබේ.

එකී භාවිතයන් සඳහා මෙම කොම්පොස්ට් පොහොර යෙදවීම උනන්දු කරලීම තුළින් තම පරිශ්‍රය තුළ සන අපද්‍රව්‍ය එක්රැස් කිරීම තුළින් මහ නගර සභාව මගින් දෛනිකව එකතු කල යුතු ප්‍රමාණය අඩු අගයකට පත්වේ.



2. නොදිරන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය

2028 වන විට ඇස්තමේන්තු ගත නොදිරණ අපද්‍රව්‍ය ප්‍රමාණය ටොන් 08ක් ලෙස ගණනය කල හැකි අතර එම ප්‍රමාණය පමණක් සඳහැන්න අපද්‍රව්‍ය බහාලනය වෙත යොමු කිරීම. කෙසේ වෙතත් ඉදිරියේදී සංචාරක ජනගහනය උදෙසා නොදිරන අපද්‍රව්‍ය භාවිතය අවම කිරීම සිදුකල යුතුව ඇති අතර නුවරඑළිය මහ නගර සභාව සතුව ඇති කසළ බහලුම් මධ්‍යස්ථාන තුළ නැවත භාවිතයට ගත හැකි පොලිතින් හා ප්ලාස්ටික් එක්රැස් කිරීම තව දුරටත් වැඩිදියුණු කල යුතුව ඇත.

6.6 පොදු විවෘත ස්ථාන සඳහා වන උපාය මාර්ග

6.6.1 හැඳින්වීම

පොදු ස්ථාන යටතේ එළිමහල් හා පුරහස්ත ලෙස වර්ග දෙකකට වෙන් කල හැකි අතර එයද සෘජු (active) වක්‍ර (Passive) ලෙස වර්ග කල හැකිය. ඒ අනුව ප්‍ර දේශයේ දැනට ඇති පුරස්ත හා විවෘත පොදු ස්ථාන ලෙස පහත වර්ග කල හැකිය.

වගු අංක 6.6 පොදු විවෘත ස්ථාන

ගෘහස්ත/ විවෘත	වර්ගය	ස්ථානය	ප්‍රමාණය (ව.කි)
ගෘහස්ත	සෘජු (active)	සිනිසිටා ගෘහස්ත ක්‍රීඩාංගනය	
		පොදු වෙළඳපොල ව්‍යායාම ස්ථානය (Gym)	
		නුවරඑළිය ක්‍රීඩා සමාජය	
		නුවරඑළිය මොටර් රේසිං සමාජය	
		පැරණි නුවරපාර ව්‍යායාම ස්ථානය	
	වක්‍ර Passive	සිනෙසිටා ශ්‍රවණාගාරය	
		නාගරික පුස්තකාලය	
		රීගල් සිනමාහල	
		මිපිලිමාන ප්‍රජා ශාලාව	
විවෘත	සෘජු (active)	තුරඟ තරග පිටිය	29
		ග්‍රෙගරි වැව විනෝදාත්මක කලාපය	88
		වික්ටෝරියා උද්‍යානය	10
		ගොල්ෆ් ක්‍රීඩාංගනය	20
		හාවාඑළිය ක්‍රීඩාංගනය	1.6
		වජිරඥණ විද්‍යාල ක්‍රීඩාංගනය	0.5
		කළුකැලේ විද්‍යාල ක්‍රීඩාංගනය	0.2
		සේනානන්ද විද්‍යාල ක්‍රීඩාංගනය	0.4
		ධර්මපාල ප්‍රාථමික විද්‍යාල ක්‍රීඩාංගනය	0.01
		ශාන්තිපුර විද්‍යාල ක්‍රීඩාංගනය	0.1
		බොරලන්ද ක්‍රීඩාංගනය	1
		හොලිට්‍රින්ට් විද්‍යාල ක්‍රීඩංගනය	0.1
		යහපත් එඩේරාගේ කන්‍යාරාම විද්‍යාල ක්‍රීඩාංගනය	0.1
		රුවන්එළිය ක්‍රීඩාංගනය	0.5
	වක්‍ර Passive	ශාන්තිපුර, පිදුරතලාගල, සිංගල් ට්‍රී නැරඹුම් ස්ථාන	
		නුවරඑළිය ගෘහ නිර්මාණ ශිල්පි ලක්ෂණ පෙන්නුම් කරන බ්‍රිතාන්‍ය යුගයේ ඉදිකරන ලද 129ක් පමණ වූ පැරණි ගොඩනැගිලි	
		පල්ලිය පාර බ්‍රිතාන්‍ය යුගයේ ඉදිකරන ලද පැරණි සුසාන භූමිය	
		හාවාඑළිය නාගරික සුසාන භූමිය	

මූලාශ්‍රය : නු.එ.ම.න.ස

ඒ අනුව ප්‍රදේශය පුරා පැතිරී ඇති හෙක්. 153ක පමණ වූ විවෘත භූමි හා ක්‍රීඩා පිටි ප්‍රදේශයේ ජනතානය හා සංචාරකයින් සඳහා වෙන් කර ඇත.

සිතියම් අංක 6.11 **පොදු ක්‍රීඩා පිටි හා උද්‍යාන**



2028 වන විට විසල් නුවරඑළිය කලාපය තුළ නේවාසික ජනගහනය 60,000ක් ද සංචාරක දෛනික ප්‍රමාණය 35,000ක් ද අනෙකුත් කටයුතු වෙනුවෙන් නගරයට ඇදි එන දෛනික සංක්‍රමණික ජනගහනය 52,000ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. ඒ අනුව විවෘත භූමි හා ක්‍රීඩාංගන අවශ්‍ය ප්‍රමාණය

නේවාසික ජනගහනය වෙනුවෙන් - හෙක්. 60

සංචාරක ජනගහනය වෙනුවෙන් - හෙක්. 35

දෛනික සංක්‍රමණික ජනතාව වෙනුවෙන් - හෙක්. 13 (සංක්‍රමණික ජනතාව සඳහා නේවාසික ජනතාවගේ අවශ්‍යතාවය මෙන් 25%ක විවෘත භූමි ප්‍රමාණයක් අවශ්‍ය බව ගණනය කර ඇත.)

ඒ අනුව අවශ්‍ය සමස්ත විවෘත භූමි ප්‍රමාණය හෙක්. 108ක් වන අතර දැනටමත් පවත්නා භූමි ප්‍රමාණය හෙක්. 153ක් වන බැවින් ඉදිරි වසර සඳහා ද මෙම ප්‍රමාණය ප්‍රමාණවත් වේ.

නමුත් නගර මධ්‍යයේ වැඩි විවෘත භූමි ප්‍රමාණයක් පිහිටීම හේතු කොට ගෙන බැහැර ප්‍රදේශ වල එනම් හාවාඑළිය, මිලිපිමාන කලාපයන්හි අඩු විවෘත භූමි ප්‍රමාණයක් ඇති බව පෙනේ.

6.6.2 උපාය මාර්ග

මෙම තත්වය මග හැරීමට පහත සඳහන් ක්‍රීඩා භූමි සංවර්ධනය යෝජනා කරනු ලැබේ.

1. බොරලන්ද ක්‍රීඩාංගනය වැඩි දියුණු කිරීම
2. හාවාඑළිය වජිරඥාණ විද්‍යාල ක්‍රීඩාංගනය පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීම
3. රුවන්එළිය ක්‍රීඩාංගනය පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීම
4. මිපිලිමාන සේනානන්ද විද්‍යාල ක්‍රීඩාංගනය පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීම

6.7. සංස්කෘතික හා පෞරාණික ස්ථාන වැඩි දියුණු කිරීමේ උපාය මාර්ග

විසල් නුවරඑළිය සංවර්ධන කලාපය තුළ බ්‍රිතාන්‍ය යුගයේ ඉදිකරන ලද ගොඩනැගිලි 129ක් පිහිටා ඇත. එම ගොඩනැගිලි වල ඇති වික්ටෝරියානු, ජෝර්ජියානු, හා බ්‍රිතාන්‍ය යුගයට අයත් ගෘහ නිර්මාණ ශිල්පි ලක්ෂණ ආරක්ෂා කරනු වස් මෙම ගොඩනැගිලි 129 සංරක්ෂිත ගොඩනැගිලි ලෙස නම් කර ඇත. (ගොඩනැගිලි ලැයිස්තුව වගු අංක 6.7)

මෙකී ගොඩනැගිලි වල ගෘහ නිර්මාණ ශිල්පි ලක්ෂණ ආරක්ෂා කිරිම හා තවදුරටත් නුවරඑළිය කලාපය තුළ එම ගෘහ නිර්මාණ ලක්ෂණ ප්‍රවර්ධනය කිරීම හා ගොඩනැගිලි රෙගුලාසි හදුනා ගෙන ඇත. (රෙගුලාසි අංක ...)

විසල් සංවර්ධන සැලැස්මේ එක් අරමුණක් වන නුවරඑළියට අවේනික ගෘහ නිර්මාණ ශිල්පි ලක්ෂණ ආරක්ෂා කිරීම හා ප්‍රධාන මාර්ග ආශ්‍රිතව හදුනාගත් කලාපයන් වල අනීවාර්යය බවට රෙගුලාසි පැනවීම (රෙගුලාසි අංක .....)



වගු අංක 6.7 - සංරක්ෂිත ගොඩනැගිලි

වීථියේ නම		වරිපනම් අංකය.	භූමි ප්‍රමාණය					කොරතුරු නොමැති	එකතුව	ගොඩනැගිල්ලේ කාලය (අවුරුදු)		කොරතුරු නොමැති	එකතුව
			>10	11-20	21-30	31-40	41 වැඩි			>100	101<		
01	එළිසබත් රැජින පාර	ක්වීන්ස් කොටේජ් , 44,140,02යූ.වී.,132ඒ,126,114,108,104,50,01,42,38	03	02	05	01	02	-	13	01	10	02	13
